# ජාතික සමාජ සංවර්ධන ආයතනය
# தேசிய சமூக அபிவிருத்தி நிறுவனம்
# National Institute of Social Development



## වාර්ෂික වාර්තාව
## வருடாந்த அறிக்கை
# Annual Report
# 2022

කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබල ගැන්වීම් අමාත්‍යාංශය
மகளிர், சிறுவர் அலுவல்கள் மற்றும் சமூக வலுவூட்டல் அமைச்சு
Ministry of Women, Child Affairs and Social Empowerment

# ජාතික සමාජ සංවර්ධන ආයතනය

## කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ උපාධි පිරිනමනු ලබන ආයතනයකි

# වාර්ෂික වාර්තාව - 2022

# පටුන


| | පිටු අංකය |
|---|---|
| වාර්ෂික වාර්තාව 2022 | 01 - 69 |
| අවසන් ගිණුම 2022 | 70 - 93 |
| විගණකාධිපති වාර්තාව | 94 |
| අවසාන ගිණුම් පිළිබඳ විගණන මතය | 95 - 99 |
| විගණකාධිපති වාර්තාව පිළිබඳ අධ්‍යක්ෂ ජනරාල්ගේ නිරීක්ෂණයන් | 100 - 101 |

# ජාතික සමාජ සංවර්ධන ආයතනය

## දැක්ම

**සමාජ වැඩ අධ්‍යාපනයේ පුහුණු කටයුතුවල හා පර්යේෂණවල දේශීය හා ජාත්‍යන්තර ලෙස විශිෂ්ඨ මධ්‍යස්ථානයක් බවට පත්වීම.**

## මෙහෙවර

**ශ්‍රී ලංකාවේ සමාජ සංවර්ධනය සහ සමාජ සුභසාධනය සඳහා සියලුම මට්ටම්වලදී අවශ්‍ය සමාජ වැඩ පිළිබඳ කුසලතා පූර්ණ මිනිස් බල අවශ්‍යතා සපුරාගැනීම සමාජ වැඩ පිළිබඳ අවශ්‍ය දැනුම හා තාක්ෂණයන් යොදා ගනිමින් සමාජයට සුවිශේෂී සේවයක් සැපයීම.**

## සමාලෝචනය

කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීමේ අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ජාතික සමාජ සංවර්ධන ආයතනය සමාජ වැඩ පිළිබඳ (Social Work) අධ්‍යාපනය ලබා දෙන ශ්‍රී ලංකාවේ ඇති එකම උසස් අධ්‍යාපන ආයතනය වේ. අප ආයතනය 1992 අංක 41 දරණ පාර්ලිමේන්තු පනත මගින් උසස් අධ්‍යාපන ආයතනයක් බවට පත් වී ඇත. මෙම ආයතනය 1978 අංක 16 දරණ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා පනතේ 25 A වගන්තිය යටතේ උපාධි පිරිනැමීමට බලය ඇති ආයතනයක් ලෙස 2005 වර්ෂයේදී ප්‍රකාශයට පත්කර ඇත. ආයතනය විසින් සමාජ සංවර්ධනය උදෙසා සමාජ වැඩ, සමාජ සුභසාධනය, සමාජ සංවර්ධනය සහ මනෝ විද්‍යාත්මක උපදේශන යන ක්ෂේත්‍රයන්ට අදාලව ඩිප්ලෝමා පාඨමාලා ගණනාවක් ක්‍රියාත්මක කරමින් පවතී. ඉහත කාර්යයන් සාර්ථක ලෙස ඉටු කිරීම සඳහා සමාජ සේවා විද්‍යාලය, පුහුණු අංශය හා පර්යේෂණ අංශය ලෙස අධ්‍යයන අංශ තුනක් ක්‍රියාත්මක වෙමින් පවතින අතර පරිපාලන හා කළමනාකරණ කටයුතු සිදු කරනු ලබන්නේ පාලන හා මුදල් අංශය මගිනි.

ජාතික සමාජ සංවර්ධන ආයතනය මගින් පශ්චාත් උපාධි, උපාධි, උසස් ඩිප්ලෝමා, ඩිප්ලෝමා, සහතික පත්‍ර හා පුහුණු හා පර්යේෂණ වැඩසටහන් සියල්ලම ජාතික අවශ්‍යතාවයට ගැළපෙන පරිදි අවශ්‍යතා තක්සේරු වාර්තා අනුව සකස් කරන ලද විෂය නිර්දේශයකින් සමන්විත වේ. මෙම විෂය මාලාවන් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා නිර්දේශයන්ට අනුව (SLQF) ඉතා උසස් මට්ටමකින් අදාළ ක්ෂේත්‍රයේ වෘත්තිකයින්, අධ්‍යාපනඥයින් හා අභ්‍යන්තර අධ්‍යයන කාර්ය මණ්ඩලයේ උපදෙස් පරිදි කාර්ය මණ්ඩලය එක්ව සකසා ඇත.

සමාජ සේවා විද්‍යාලය මගින් පවත්වන වැඩසටහන් අතර වෘත්තීය සමාජ වැඩ පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය හා සමාජ වැඩ පිළිබඳ ශාස්ත්‍රවේදී උපාධිය ප්‍රධාන වේ. මීට අමතරව සමාජ වැඩ පිළිබඳ උසස් ඩිප්ලෝමා පාඨමාලා හා සමාජ වැඩ පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවන් ද සමාජ සේවා විද්‍යාලය මගින් ක්‍රියාත්මක වේ. මෙම වැඩසටහන් වල විශේෂත්වය වන්නේ න්‍යායාත්මක දැනුමට සමගාමීව ප්‍රායෝගික ක්ෂේත්‍ර පුහුණු වීම් මූලික කරගෙන කුසලතා සංවර්ධනය කිරීම වේ.

පුහුණු අංශය මගින් අම්පාර, තලාව, රන්න, කිළිනොච්චිය ප්‍රාදේශිය මධ්‍යස්ථාන මුල්කර ගනිමින් මෙන්ම ඊට අමතරව මන්නාරම, යාපනය, වව්නියාව, මඩකලපුව, කුරුණෑගල, පුත්තලම, රත්නපුර යන දිස්ත්‍රික්ක කේන්ද්‍ර කරගෙන කෙටි කාලීන හා දිගු කාලීන පුහුණු පාඨමාලා මෙන්ම සහතික පත්‍ර පාඨමාලා පවත්වනු ලබයි. මෙම සහතික පත්‍ර පාඨමාලා හා කෙටි කාලීන පුහුණු වැඩසටහන් දිවයින පුරා රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතනයන්හි ඉල්ලීම පරිදි පවත්වනු ලබන අතර මෙමගින් සමාජ සංවර්ධන ක්ෂේත්‍රයේ නියුතු නිළධාරිනගේ ධාරිතාව සංවර්ධන කිරීම අරමුණ වේ. එමෙන්ම උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලා කිහිපයක් වෘද්ධ විද්‍යාව හා වැඩිහිටි රැකවරණය පිළිබඳ ඩිප්ලෝමාව හා උපදේශනය පිළිබඳ උසස් ඩිප්ලෝමා පාඨමාලා සහභාගි වන්නන්ගේ මුදල් අයකර පවත්වමින් සිටී. මෙම පාඨමාලා සීදුව ප්‍රධාන කාර්යාලයේ මෙන්ම ප්‍රාදේශිය මධ්‍යස්ථානයන් හා ඉහත සඳහන් කරන ලද දිස්ත්‍රික්ක කේන්ද්‍ර කර ගනිමින් පවත්වනු ලබයි. එමෙන්ම උපදේශනය පිළිබඳ උසස් ඩිප්ලෝමා පාඨමාලාව ආරම්භ කර ඇති අතර එය උපදේශනය පිළිබඳ උපාධි පාඨමාලාවක් දක්වා වර්ධනය කිරීමට අවශ්‍ය කටයුතු සිදුකර ඇති අතර දැනට සකස් කරනු ලැබූ විෂයය මාලාව උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇත.

පර්යේෂණ හා ප්‍රකාශන අංශය විසින් සමාජ ප්‍රතිපත්ති ගොඩ නැංවීම උදෙසා විවිධ පර්යේෂණ දියත් කොට ඇත. එම අංශය විසින් පර්යේෂණ මුල් කර ගනිමින් සකස් කොට ඇති පර්යේෂණ වාර්තා හා ග්‍රන්ථ සමාජ සංවර්ධනය හා සමාජ සුභසාධන ක්ෂේත්‍ර සංවර්ධනය සඳහා බෙහෙවින් යොදා ගත හැකිය. ඊට අමතරව කොවිඩ් 19 වෛරසය වැලදුන ප්‍රජාව සුවපත් වූ පසුව සමාජ සම්බන්ධතා පැවැත්වීමේදී මනෝ සමාජීය ගැටලු පිළිබඳ

අධ්‍යයනය හා කොවිඩ් 19 කාලය තුල අපද්‍රව්‍ය කළමනාකරණයේදී පරිසරයට සිදු වන බලපෑම් පිළිබඳ පර්යේෂණ දෙකක් දියත් කර ඇත.

ආයතනයට අනුබද්ධිත ප්‍රාදේශිය මධ්‍යස්ථාන හතරක් අනුරාධපුර - (තලාව) , අම්පාර, හම්බන්තොට - (රන්න,) කිලිනොච්චිය යන ප්‍රදේශයන්හි ආරම්භ කර ඇත. සීදුවේ පවතින ප්‍රධාන කාර්යාලය කේන්ද්‍ර කර ගනිමින් පවත්වන වැඩසටහන් ශ්‍රී ලංකාවේ විවිධ ප්‍රදේශයන්හි වෙසෙන සිංහල, දෙමළ, මුස්ලිම් ප්‍රජාව වෙත රැගෙන යාම මෙම ප්‍රාදේශිය මධ්‍යස්ථාන ආරම්භ කිරීමේ ප්‍රධාන අරමුණ වේ.

එමෙන්ම මෙම ආයතනයට වර්ග අඩි 100,000 පමණ ස්ථීර ගොඩනැගිලි සංකීර්ණයක් සීදුව ප්‍රදේශයේ ඉදිකරමින් පවතී. මෙම ගොඩනැගිලි සංකීර්ණය සඳහා රුපියල් බිලියන 01 ක මුදලක් ජාතික අයවැය දෙපාර්තමේන්තුව විසින් වෙන්කර ඇත. මෙම ගොඩනැගිලි සංකීර්ණයේ ඉදිකිරීම් කටයුතු 2023 ජූලි මස 31 දින වන විට අවසන් කිරීමට ආයතනයේ පාලක සභාවේ අනුමැතිය ලැබී ඇත. එහි පළමු අදියර ලෙස Wing B ගොඩනැගිල්ල සාදා නිමකර ඇති අතර, දැනට ආයතනයේ සියළුම අංශ මෙම ගොඩනැගිල්ලෙහි ස්ථාපිත කර ඇත. Wing A ගොඩනැගිල්ලේ ඉදිකිරීම් 98% ක් අවසන්ව ඇත. මෙම ගොඩනැගිල්ලේ ඉතිරි ඉදිකිරීම් අවසන් වූ වහාම ලැබෙන ඉඩකඩතුල පාඨමාලා ආරම්භකරමින් විශාල ප්‍රතිලාභීන් ප්‍රමාණයක් ආයතනයේ පාඨමාලා හැදෑරීමට අවස්ථාව සැලසීම අරමුණු කරගෙන ඇත.

එමෙන්ම අප ආයතනය ජාතික මෙන්ම ජාත්‍යන්තර සංවිධාන සමඟ විවිධ වූ අධ්‍යයන වැඩසටහන් පවත්වාගෙන යන අතර 2019 වර්ෂයේදී බෙල්ජියම් ලියුවින් ලින්බර්ග් විශ්ව විද්‍යාලය සමඟ අවබෝධතා ගිවිසුමක් අත්සන් කර ඇත. එමගින් ආයතනයේ අරමුණු හා කාර්යභාරය ජාතික හා ජාත්‍යන්තර අත්දැකීම් හුවමාරු කරගනිමින් ප්‍රජාව අතරට ගෙන යාමේ අවස්ථා තවත් පුළුල් කර ඇත. එමෙන්ම ආසියානු සංවර්ධන පදනම හා එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල සමඟද ආයතනය වැඩසටහන් ක්‍රියාත්මක කරගෙන යනු ලබයි.

මේ වන විට ආයතනයේ සමාජ වැඩ උපාධිය සම්පූර්ණ කර පිටවන සිසුන්, සමාජ වැඩ වෘත්තිකයින් ලෙස ඕස්ට්‍රේලියාව, කැනඩාව, ඇමරිකාව, නවසීලන්තය වැනි රටවල රැකියා අවස්ථා ලබා ගෙන ඇත. මෙයින් රටට අවශ්‍ය විදේශ විනිමය උපයා ගැනීමට හැකිවී තිබේ. එමෙන්ම ආයතනයෙන් පිටවන උපාධිලාභීන් ඔවුන්ගේ වෘත්තීය කුසලතාවය තුලින් රාජ්‍ය හා රාජ්‍ය නොවන අංශයන්තුල රැකියා අවස්ථාවන් උදාකරගෙන ඇත.

මේවනවිට ආයතනය විශ්ව විද්‍යාලයක් බවට පත්කිරීමේ මූලික කටයුතු සිදුකරනු ලබන අතර මෙහි ආරම්භක පියවර ලෙස ආයතනයේ පනත සංශෝධනය කිරීමට කටයුතු කරමින් පවතී. ඒ හා සමගාමීව අධ්‍යයන පීඨ ආරම්භ කිරීම, එම පීඨයන්ට අදාල දෙපාර්තමේන්තු සැකසීම හා නව උපාධි පාඨමාලා ආරම්භ කිරීමේ මූලික කටයුතු සිදුකරමින් පවතී. මේ අනුව ආරම්භ වන නව උපාධි පාඨමාලා මගින් විශාල සිසුන් ප්‍රමාණයකට උසස් අධ්‍යාපනය ලබා ගැනීමේ අවස්ථාව උදාවනු ඇත.

තිරසාර සංවර්ධන අරමුණු ඉටුකරගැනීම සඳහා දායකත්වය සපයන ආයතනය, 71ක් වසරක ඉතිහාසය තුළ ශ්‍රී ලාංකික ප්‍රජාව වෙත සිදු කරන සමාජ සත්කාරය ප්‍රශංසනීය වේ.

ආචාර්ය රවීන්ද්‍ර විතානාච්චි,
අධ්‍යක්ෂ ජනරාල් (වැ.බ.)
ජාතික සමාජ සංවර්ධන ආයතනය.

# ජාතික සමාජ සංවර්ධන ආයතනය

## කාර්ය සාධනය - 2022

### 01. හැඳින්වීම

ජාතික සමාජ සංවර්ධන ආයතනය කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන උසස් අධ්‍යාපන ආයතනයකි. ජාතික සමාජ සංවර්ධන ආයතනය සමාජ සංවර්ධනය, සමාජ සුභසාධනය සහ සමාජ සවිබලගැන්වීමට අදාළ සමාජ වැඩ පිළිබඳ උපාධි, පශ්චාත් උපාධි සහ සමාජ ඩිප්ලෝමා මෙන්ම උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලා පවත්වාගෙන යනු ලබයි. එය 1992 අංක 41 දරණ ජාතික සමාජ සංවර්ධන ආයතන පනතේ විධිවිධාන යටතේ ක්‍රියාත්මක වන අතර ශ්‍රී ලංකාවේ සමාජ වැඩ අධ්‍යාපනය සපයන එකම රාජ්‍ය ආයතනයද මෙම ආයතනය වේ. සමාජ වැඩ අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීමේ අරමුණ ඇතිව වර්ෂ 2005 දී ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය විසින් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිර්දේශය අනුව 1978 අංක 16 දරණ විශ්ව විද්‍යාල පනතේ 25A වගන්තිය යටතේ ජාතික සමාජ සංවර්ධන ආයතනය උපාධි පිරිනමනු ලබන ආයතනයක් ලෙස ප්‍රකාශයට පත් කරමින් සමාජ වැඩ පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය හා සමාජ වැඩ පිළිබඳ ශාස්ත්‍රවේදී උපාධිය පිරිනැමීමේ බලය ලබා දී ඇත.

**දැක්ම**

සමාජ වැඩ අධ්‍යාපනයේ පුහුණු කටයුතුවල හා පර්යේෂණවල දේශීය හා ජාත්‍යන්තර ලෙස විශිෂ්ඨ මධ්‍යස්ථානයක් බවට පත්වීම.

**මෙහෙවර**

ශ්‍රී ලංකාවේ සමාජ සංවර්ධනය සහ සමාජ සුභසාධනය සඳහා සියලුම මට්ටම්වලදී අවශ්‍ය සමාජ වැඩ පිළිබඳ කුසලතා පුර්ණ මිනිස් බල අවශ්‍යතා සපුරාගැනීම සමාජ වැඩ පිළිබඳ අවශ්‍ය දැනුම හා තාක්ෂණයන් යොදා ගනිමින් සමාජයට සුවිශේෂී සේවයක් සැපයීම.

1992 අංක 41 දරණ ජාතික සමාජ සංවර්ධන ආයතන පනතේ සඳහන් කර ඇති පරිදි ආයතනයේ අරමුණු වනුයේ,

(අ) සමාජ වැඩ සහ සමාජ සංවර්ධන අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීම සඳහා සැලසුම්, වැඩසටහන් සහ වැඩ කටයුතු සම්බන්ධයෙන් අමාත්‍යවරයාට උපදෙස් දීම.

(ආ) සමාජ වැඩ සහ සමාජ සංවර්ධනය පිළිබඳ උපාධි සහ පශ්චාත් උපාධි පාඨමාලා පැවැත්වීම.

(ඇ) සමාජ සුභ සාධන ක්‍රම සහ සමාජ සංවර්ධන වැඩ සටහන් පිළිබඳව අධ්‍යයන කටයුතු පැවැත්වීම සහ ඒවා ප්‍රවර්ධනය කිරීම.

(ඈ) සමාජ වැඩ වලදී තාක්ෂණය උපයෝගී කර ගැනීම ඇතුළුව සමාජ වැඩ සහ සමාජ සංවර්ධන අධ්‍යාපන ක්‍රමයෙහි නිර්මාණාත්මක පරිවයක් ආරම්භ කිරීම සහ ප්‍රවර්ධනය කිරීම.

(ඉ) සමාජ සුභසාධන ක්‍රමයේ කාර්ය මණ්ඩලයේ වෘත්තීමය සහ කළමනාකාරීත්ව ප්‍රවීණතාව වර්ධනය කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම.

(ඊ) සමාජ වැඩ සහ සමාජ සංවර්ධනය සම්බන්ධයෙන් විශේෂඥ සේවාවන් ආණ්ඩුවට සහ වෙනත් අනුමත සංවිධානයන්ට ලබා ගැනීමට සැලැස්වීම.

(උ) ඒ සමාන අරමුණු ඇති වෙනත් ආයතන සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම.

**ඉහත කරුණු සාක්ෂාත් කරගැනීම සඳහා මෙම ආයතනය පහත සඳහන් කාර්යන්හි නිරත වේ.**

01. සමාජ වැඩ වෘත්තියවේදි අධ්‍යාපනය ලබා දීම.
02. සමාජ වැඩ පිළිබඳ දේශීය හා ජාත්‍යන්තර පුහුණු පාඨමාලා පැවැත්වීම.
03. සමාජ වැඩ සමාජ සුභසාධනය සහ සමාජ සංවර්ධන ක්ෂේත්‍රයේ පර්යේෂණ සිදුකිරීම හා ප්‍රකාශන පළ කිරීම.
04. සමාජ සුභසාධන ක්ෂේත්‍රයේ උපදේශන සේවා පැවැත්වීම.
05. සමාජ සුභසාධන කටයුතු වල නියැලි සිටින රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන වල සේවකයින්ගේ කළමනාකරණ හා වෘත්තිය කුසලතා වැඩි දියුණු කිරීම.
06. සමාජ සුභසාධන ප්‍රතිපත්ති සහ වැඩ සටහන් සම්පාදනය සහ ක්‍රියාත්මක කිරීම පිළිබඳ ගරු ඇමතිතුමාට අවශ්‍ය සහය ලබා දීම.

**ජාතික සමාජ සංවර්ධන ආයතනයේ ක්‍රියාත්මක වැඩ සටහන් පහත සඳහන් පරිදිය.**

01. සමාජ වැඩපිළිබඳ ශාස්ත්‍රපති, සමාජ වැඩ ශාස්ත්‍රවේදී උපාධි පාඨමාලා, සමාජ වැඩ ඩිප්ලෝමා,අතුරු වෘත්තිය පාඨමාලා හා වෙනත් පුහුණු පාඨමාලා සඳහා විෂයමාලා සංවර්ධනය, සංවිධානය කිරීම, පැවැත්වීම සහ ක්ෂේත්‍ර වැඩ සම්බන්ධීකරණය
02. සමාජ සුභසාධන හා සමාජ ප්‍රතිපත්ති පිලිබඳ පර්යේෂණ දියුණු කිරීම, පැවැත්වීම හා ක්‍රියාත්මක කිරීම
03. සමාජ වැඩ ප්‍රකාශන හා පත්‍රිකා එළි දැක්වීම
04. සමාජ සුභසාධන කාර්යන්හි නියැලෙන රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන වල නිලධාරින්ගේ වෘත්තිමය කළමනාකරණ සංවර්ධනය කිරීම සඳහා විදේශීය හා දේශීය ආයතන වල මූල්‍ය පහසුකම් ඇතිව සම්මන්ත්‍රණ වැඩමුළු පැවැත්වීම
05. ගරු ඇමතිතුමාට සමාජ සුභසාධන ප්‍රතිපත්ති සැලසුම් කිරීමට, ක්‍රියාත්මක කිරීමට, සහාය වීම සඳහා එතුමාගේසාකච්ඡා හා කාර්ය මණ්ඩල රැස්වීම් වලදි ප්‍රතිපත්තිමය තීරණ ගැනීමට සහය වීම සහ ඒ සඳහා ලිඛිත යෝජනා ඉදිරිපත් කිරීම
06. රාජ්‍ය හා රාජ්‍ය නොවන අංශ වල සමාජ සුභසාධන සැලසුම් ක්‍රියාත්මක කිරීමේදි සමාජ වැඩ සිසුන් එම ආයතන වලට ඔවුන්ගේ ව්‍යාපෘති මගින් අනුයුක්ත කිරීම, ඔවුන්ගේ සංවර්ධන ක්‍රියාදාමයන්ට අවශ්‍ය මාර්ගෝපදේශයන් සැපයීම, ඔවුන්ගේ සේවාවන් වඩාත් අර්ථවත් පිණිස උපදේශන සේවා රැස්වීම් හා සම්මන්ත්‍රණ පැවැත්වීම.

## 02. පාලක සභාව

1992 අංක 41 දරණ ජාතික සමාජ සංවර්ධන ආයතන පනතේ 7 (1) උප වගන්තිය ප්‍රකාරව 2022 වර්ෂයේ ජාතික සමාජ සංවර්ධන ආයතන පාලක සභාවේ සංයුතිය මෙසේය.

| | | | |
|---|---|---|---|
| 01. | නීල් බණ්ඩාර හපුහින්න මහතා | - | ලේකම් - කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය (සභාපති - නිල බලයෙන් ) 2020.17.08 දින සිට 2022.12.31 දක්වා |
| 02. | එම්.ටී.ආර්. ෂාමිණි අත්තනායක මිය | - | අධ්‍යක්ෂ ජනරාල් (රා.ආ.) 2018.07.09 – 2019.01.01 දක්වා- 2019.01.01 සිට අධ්‍යක්ෂ ජනරාල් (වැ.බ.) |
| 03. | ඒ.පී.එල්.ඩී.ඩී.එන්. ප්‍රනාන්දු මිය | - | සාමාජික - 2020.01.20 දින සිට 2022.03.01 දක්වා |

| | | | |
|---|---|---|---|
| 04. | බී.කේ.ආර්. බාලසූරියා මයා | - | සාමාජික - 2022.03.02 සිට මේ දක්වා |
| 05. | මහාචාර්ය ලක්ෂ්මන් දිසානායක මයා | - | සාමාජික - 2020.02.28 දින සිට මේ දක්වා |
| 06. | මහාචාර්ය ප්‍රේමකුමාරද සිල්වා මයා | - | සාමාජික - 2020.07.08 දින සිට මේ දක්වා |
| 07. | මහාචාර්ය ආර්.එම්.කේ.රත්නායක මයා | - | සාමාජික - 2020.07.08 දින සිට මේ දක්වා |
| 08. | ආචාර්ය ඉරේෂා දර්ශනී මෙය | - | සාමාජික - 2020.02.28 දින සිට මේ දක්වා |
| 09. | ජගත් වැල්ලවත්ත මහතා | - | සාමාජික - 2020.02.28 දින සිට 2022.04.07 දක්වා |
| 10. | ආචාර්ය ආර්.එම්.කේ. රත්නායක මයා | - | සාමාජික - 2022.04.08 සිට මේ දක්වා |
| 11. | ගෝඨාභය ජයරත්න මහතා | - | සාමාජික - 2020.02.28 දින සිට මේ දක්වා |
| 12. | චන්දිමා වික්‍රමසිංහ මිය | - | සාමාජික - 2020. 02.28 දින සිට මේ දක්වා |
| 13. | ඩී.විදානගමආච්චි මහතා | - | සාමාජික - 2020.02.28 දින සිට මේ දක්වා |
| 14. | සිසිර රත්නායක මහතා | - | සාමාජික - 2020.02.28 දින සිට මේ දක්වා |
| 15. | රෝයි නිලන්ත සිල්වා මහතා | - | සාමාජික - 2020.02.28 දින සිට මේ දක්වා |
| 16. | ටී.එන්.හෙට්ටිආරච්චි මහතා | - | සාමාජික - 2020.05.18 දින සිට මේ දක්වා |
| 17. | එස්.ඩී.එල් සිල්වා මිය | - | සාමාජික - 2022.10.04 සිට මේ දක්වා |

## **03.** අධ්‍යයන කටයුතු පිළිබඳ මණ්ඩලය

1992 අංක 41 දරණ ජාතික සමාජ සංවර්ධන ආයතන පනතේ 10 (1) උප වගන්තිය ප්‍රකාරව පත් කරන ලද අධ්‍යයන කටයුතු මණ්ඩලය මෙසේය.

| | | | |
|---|---|---|---|
| 01. | නීල් බණ්ඩාර හපුහින්න මහතා | - | ලේකම් - කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය<br>2020.17.08 දින සිට 2022.12.31 දක්වා |
| 02. | එම්.ටී.ආර්. ෂාමිණි අත්තනායක මිය | - | අධ්‍යක්ෂ ජනරාල් (රා.ආ.) 2018.07.09 – 2019.01.01 දක්වා-<br>2019.01.01 සිට අධ්‍යක්ෂ ජනරාල් (වැ.බ.) |
| 03. | මහාචාර්ය ඩබ්.එම්. ධනපාල මහතා | - | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, සමාජ විද්‍යා අධ්‍යයන අංශය - ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය |
| 04. | මහාචාර්ය සුනිල් ජයන්ත නවරත්න මහතා | - | අධ්‍යක්ෂ ජනරාල් - ජාතික අධ්‍යාපන ආයතනය. |
| 05. | ආචාර්ය උපාලි පන්නිලගේ මහතා | - | පීඨාධිපති - මානව ශාස්ත්‍ර පීඨය, රුහුණ විශ්ව විද්‍යාලය |
| 06. | මහාචාර්ය සුභාංගනී එම්.කේ. හේරත් මිය | - | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය - සමාජ විද්‍යා අංශය, කැළණිය විශ්ව විද්‍යාලය |
| 07. | ආචාර්ය ඒ.ඩබ්.කේ.ඩබ්. සුභසිංහ මහත්මිය | - | ජ්‍යෙෂ්ඨ මහාචාර්ය - කැළණිය විශ්ව විද්‍යාලය |
| 08. | ආචාර්ය එස්.එම්.ඒ.කේ. සමරකෝන් මහතා | - | අංශාධිපති - වාණිජ හා කළමනාකරණ පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය |
| 09. | ගෞරි වාසුදේවන් මිය | - | අධ්‍යක්ෂ (පුහුණු අංශය), ජාතික සමාජ සංවර්ධන ආයතනය |
| 10. | කේ.එම්.වයි. කරුණාරත්න මහතා | - | අධ්‍යක්ෂ (සමාජ සේවා විද්‍යාලය), ජාතික සමාජ සංවර්ධන ආයතනය |
| 11. | එම්.එස්.එම්. අස්මියාස් මහතා | - | අධ්‍යක්ෂ (සමාජ සංවර්ධන ප්‍රතිපත්ති පර්යේෂණ හා ප්‍රකාශන අංශය), ජාතික සමාජ සංවර්ධන ආයතනය |
| 12. | සී.එච්.ඩී. හෙට්ටිආරච්චි මහත්මිය | - | ලේඛකාධිකාරි, ජාතික සමාජ සංවර්ධන ආයතනය |

**04. විගණන හා කළමනාකරණ කමිටුව**

| | | |
|---|---|---|
| 01. | දිලූපා ප්‍රනාන්දු මිය | - අධ්‍යක්ෂ (කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව) 2020.01.20 දින සිට 2022.03.01 දක්වා |
| 02. | බී.කේ.ආර්.බාලසූරිය මහතා | - ප්‍රධාන මූල්‍ය නිලධාරි (මුදල් අමාත්‍යාංශය) 2022.03.02 සිට මේ දක්වා |
| 03. | ඩී.විදානගමාච්චි මහතා | - විශ්‍රාමික නියෝජ්‍ය ලේකම් (මුදල් අමාත්‍යාංශය) |
| 04. | රෝයි නිලන්ත සිල්වා මහතා | - කළමනාකරණ උපදේශක (කොලේජ් විලේජ් පෞද්ගලික සමාගම) |
| 05. | ඩී.එම්.ජී.පී.මල්කාන්ති | - ප්‍රධාන අභ්‍යන්තර විගණක (සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා, හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය) |
| 06. | ඩී.එල්.ඩී. ගුණතිලක මිය | විගණන අධිකාරිය (ජාතික විගණන කාර්යාලය) |

**ජාතික සමාජ සංවර්ධන ආයතනයේ සහභාගීත්වය**

| | | |
|---|---|---|
| 01. | එම්.ටී.ආර්.ෂාමිණී අත්තනායක මිය | - අධ්‍යක්ෂ ජනරාල් (වැ.බ) අතිරේක අධ්‍යක්ෂක ජනරාල් (අධ්‍යයන) |
| 02. | එල්.කේ. පුෂ්පකාන්ති මිය | - අධ්‍යක්ෂ (පාලන හා මුදල්) |
| 03. | යූ.ඩී.ඩී.ඩී. උස්හෙට්ටි මිය | - අභ්‍යන්තර විගණක |
| 04. | ඊ.එච්. ලසිකා මධුවන්ති මිය | - ගණකාධිකාරී |

**05. කාර්ය මණ්ඩලය**

**(අ) අධ්‍යයන කාර්ය මණ්ඩලය**

2022 වර්ෂය තුල ජාතික සමාජ සංවර්ධන ආයතනයේ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ සංයුතිය මෙසේය.

01. එම්.ටී.ආර්. ෂාමිණී අත්තනායක මිය - අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (අධ්‍යයන) 2017.01.16 සිට

**(1) සමාජ සේවා විද්‍යාලයේ සේවක සංඛ්‍යාව පහත සඳහන් පරිදි වේ.**

| | | |
|---|---|---|
| 01. | කේ.එම්.වයි. කරුණාරත්න මහතා | - අධ්‍යක්ෂ (සමාජ සේවා විද්‍යාලය) 2017.01.24 සිට මේ දක්වා |
| 02. | වර්ධරාජා ජෙයරුබන් මහතා | - කථිකාචාර්ය II 2006.07.03 සිට 2012.07.02 දක්වා<br>කථිකාචාර්ය I 2012.07.03 සිට2017.07.31 දක්වා<br>ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය 2017.08.01 සිට මේ දක්වා |
| 03. | ඊ.ඒ.එම්.එස්.ජී. විජේසේකර මිය | - කථිකාචාර්ය II 2006.07.03 සිට 2012.07.06 දක්වා<br>කථිකාචාර්ය I 2012.07.07 සිට2017.07.31 දක්වා<br>ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය 2017.08.01 සිට මේ දක්වා |
| 04. | ආචාර්ය යූ.එල්.එම්. අෂ්කර් මහතා | - කථිකාචාර්ය II 2009.03.02 සිට 2015.03.01 දක්වා<br>කථිකාචාර්ය I 2015.03.02 සිට මේ දක්වා |
| 05. | සී.එම්. මුණසිංහආරච්චි මිය | - කථිකාචාර්ය II 2013.09.16 සිට මේ දක්වා |
| 06. | වී.බාලමනි මිය | - කථිකාචාර්ය II 2013.09.16 සිට මේ දක්වා |

07. එච්.එම්.ඩි.එස්. හේරත් මිය - කථිකාචාර්ය II 2014.05.02 සිට මේ දක්වා
08. එච්.එම්.එස්. නිරෝෂණී මිය - කථිකාචාර්ය II 2014.05.02 සිට මේ දක්වා
09. එල්.සී. ඉනෝකා ජයසේන මිය - කථිකාචාර්ය II 2015.12.01 සිට මේ දක්වා
10. වයි.එච්. සමුද්‍රිකා සිල්වා මිය - කථිකාචාර්ය II 2015.12.01 සිට මේ දක්වා
11. ඒ.එම්. මානාමුදලි මිය - කථිකාචාර්ය II 2018.08.01 සිට මේ දක්වා
12. ඒ.පී.එල්. බුද්ධි නිරුක්ෂි මිය - කථිකාචාර්ය II 2018.08.01 සිට මේ දක්වා
13. ඩී.එම්.ඩබ්.කේ. චන්ද්‍රසිරි මහතා - පුස්තකාලයාධිපති 2015.06.01 සිට මේ දක්වා

**(2) පුහුණු අංශයේ සේවක සංඛ්‍යාව පහත සඳහන් පරිදි වේ.**

01. වරදගෞරි වාසුදේවන් මිය - අධ්‍යක්ෂ (පුහුණු) 2015.05.05 සිට මේ දක්වා
02. දීප්ති නිරෝෂිකා මිය - පුහුණු නිලධාරි II 2007.03.01සිට 2013.02.28 දක්වා
පුහුණු නිලධාරි I 2013.03.01 සිට2018.07.31 දක්වා
ජ්‍යෙෂ්ඨ පුහුණු නිලධාරී 2018.08.01 සිට මේ දක්වා
03. කුමුදිනි වැදිසිංහ මිය - පුහුණු නිලධාරි II 2012.05.01 සිට 2019.09.30 දක්වා
ජ්‍යෙෂ්ඨ පුහුණු නිලධාරී 2019.10.01 සිට මේ දක්වා
04. බී.කේ.එස්. කරුණාරත්න මහතා - පුහුණු නිලධාරි II 2013.08.01 සිට මේ දක්වා
05. පී.සී. හෙට්ටිආරච්චි මහතා - පුහුණු නිලධාරි II 2013.08.01 සිට මේ දක්වා
06. ඒ.එම්.කේ.එල්. අධිකාරී මිය - පුහුණු නිලධාරි II 2013.08.01 සිට මේ දක්වා
07. ඒ.එච්. උබයදුල්ලා මහතා - පුහුණු නිලධාරි II 2013.08.01 සිට මේ දක්වා
08. ජේ.එච්.අයි. ප්‍රසාද් මහතා - පුහුණු නිලධාරි II 2013.08.01 සිට මේ දක්වා
09. ටී. තර්ෂන් මහතා - පුහුණු නිලධාරි II 2013.09.02 සිට මේ දක්වා
10. වයි.එම්. නිම්සාත් මහතා - පුහුණු නිලධාරි II 2017.07.03 සිට මේ දක්වා
11. බී.ජී.අයි. මදුෂානී සමරසිංහ මිය - පුහුණු නිලධාරි II 2017.07.03 සිට මේ දක්වා

**(3) පර්යේෂණ අංශයේ සේවක සංඛ්‍යාව පහත සඳහන් පරිදි වේ.**

01. එම්.එස්.එම්. අස්මියාස් මහතා - අධ්‍යක්ෂ (පර්යේෂණ) 2017.05.01 සිට මේ දක්වා
02.ජේ.කේ.පී.යූ. කීර්ති මහතා - පර්යේෂණ නිලධාරි 2013.08.01 සිට 2018.07.31දක්වා
ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී 2018.08.01 සිට මේ දක්වා
03. එස්. හරිහරතාමෝදරන් මයා - ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී 2018.08.01 සිට මේ දක්වා
04. බී.ඒ. නිලුකා විජේබණ්ඩාර මිය - පර්යේෂණ නිලධාරී 2017.01.16 සිට මේ දක්වා
05. එච්.කේ.එස්.කේ. සිරිකුමාර මිය - පර්යේෂණ නිලධාරී 2014.05.02 සිට මේ දක්වා
06. ඒ.එච්. ඉන්දික සංජීව මහතා - පර්යේෂණ සහකාර 2014.05.02 සිට මේ දක්වා
07. කේ.සී.කේ.ද තාබ්‍රේව් මෙය - පර්යේෂණ සහකාර 2014.05.02 සිට මේ දක්වා
08. එස්.එච්.එන්. මධුෂානි සිල්වා මෙය - පර්යේෂණ සහකාර 2014.05.02 සිට මේ දක්වා

**(ආ.) අනධ්‍යයන කාර්ය මණ්ඩලය**

2021 වර්ෂයේ ජාතික සමාජ සංවර්ධන ආයතනයේ පරිපාලන අංශයේ සංයුතිය පහත පරිදි වේ.

| | | |
|---|---|---|
| 01. එම්.ටී.ආර්.ෂාමිණී අත්තනායක මිය | - | අධ්‍යක්ෂ ජනරාල් (වැ.බ.) 2019.01.01 සිට මේ දක්වා |
| 02. එල්.කේ. පුෂ්පකාන්ති මිය | - | අධ්‍යක්ෂ (පාලන හා මුදල්) 2017.03.01 සිට මේ දක්වා |
| 03. සි.එච්.ඩි. හෙට්ටිආරච්චි මිය | - | ලේඛකාධිකාරි 2013.09.16 සිට මේ දක්වා |
| 04. යූ.ඩී.ඩී.ධනුෂ්කා උස්හෙට්ටි මිය | - | අභ්‍යන්තර විගණක 2011.10.17 සිට මේ දක්වා |
| 05. ඊ.එච්.ලසිකා මධුවන්ති මිය | - | ගණකාධිකාරී 2021.12.15 සිට මේ දක්වා |

**පරිපාලන අංශයේ සේවක සංඛ්‍යාව පහත සඳහන් පරිදි වේ.**

| තනතුර | අනුමත සේවක සංඛ්‍යා | ස්ථිර | ද්විතියන පදනම | අනියම් |
|---|---|---|---|---|
| 01. ගිණුම් නිලධාරී | 01 | - | - | - |
| 02. සහකාර ලේඛකාධිකාරී | 01 | - | - | - |
| 03. පරිගණක වැඩසටහන් සම්පාදක | 01 | 01 | - | - |
| 04. ව්‍යාපෘති වැඩසටහන් සම්පාදක | 01 | 01 | - | - |
| 05. කළමනාකරණ සහකාර | 34 | 33 | - | - |
| 06. නේවාසිකාගාර පාලිකා | 01 | 01 | - | - |
| 07. ශ්‍රව්‍ය දෘෂ්‍ය කාර්මික | 01 | - | - | - |
| 08. ශ්‍රව්‍ය දෘශ්‍ය සහායක | 01 | 01 | - | - |
| 09. භාෂා පරිවර්තක | 02 | 01 | - | - |
| 10. රියදුරු | 09 | 08 | - | - |
| 11. කාර්යාල කාර්ය සහායක | 15 | 13 | - | - |
| 12. වැඩසටහන් සහකාර (ස්ථානභාර) | 04 | 03 | - | - |

## සමාජසේවා විද්‍යාලය

### 2022 වර්ෂයේ ජනවාරි සිට දෙසැම්බර් දක්වා ප්‍රගතිය

### ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් වැඩසටහන් / ක්‍රීයාකාරකම්

| අනු අංකය | ව්‍යාපෘතිය / වැඩසටහන / ස්ථානය | පැවැත්වූ දිනය / කාලය | | | | ප්‍රතිලාභීන් සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|
| | | | වෙන් කරන ලද මුදල | වියදම | ඉතිරිය | |
| 01 | සමාජ වැඩ ශාස්ත්‍රවේදී 2017/18 (ඉංග්‍රීසි මාධ්‍යය) ජා.ස.සං. ආයතනය | | 1,378,600.00 අමතර ප්‍රතිපාන 36,670.00 | 1,418,270.00 | නැත | 30 |
| 02 | සමාජ වැඩ ශාස්ත්‍රවේදී 2018/19 (ඉංග්‍රීසි මාධ්‍යය) මීගමුව ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශය ජා.ස.සං. ආයතනය | 2022.10.26 – 2022.11.05 2022.11.16 – 2022.11.21 | | | | ඉංග්‍රීසි 42 |
| 03 | සමාජ වැඩ ශාස්ත්‍රවේදී 2019/20 (සිංහල, දෙමළ, ඉංග්‍රීසි මාධ්‍යය) ජා.ස.සං. ආයතනය | 2022.11.08 – 2022.11.11 2022.11.13- 2023.03.31 | | | | සිංහල - 30 දෙමළ - 24 ඉංග්‍රීසි - 20 |
| 04 | සමාජ වැඩ ශාස්ත්‍රවේදී 2020/21 (සිංහල, දෙමළ, ඉංග්‍රීසි මාධ්‍යය) ජා.ස.සං. ආයතනය | 2022.10.17- 2022.10.22 2022.11.01- 2023.01.31 | | | | සිංහල - 83 දෙමළ - 67 ඉංග්‍රීසි - 23 |
| 05 | සමාජ වැඩ ශාස්ත්‍රවේදී 2021/22 (සිංහල, දෙමළ, ඉංග්‍රීසි මාධ්‍යය) ජා.ස.සං. ආයතනය | 2022.11.29- 2022.12.09 2022.12.12- 2022.03.03 | | | | සිංහල - 177 දෙමළ - 187 ඉංග්‍රීසි - 69 |
| 06 | ලෝක සමාජ වැඩ දිනය මීගමුව ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශය ජා.ස.සං. ආයතනය | 2022.01.01- 2022.03.31 | 21,400.00 | 21,400.00 | නැත | ප්‍රතිලාභීන් 500 |
| 07 | ආයතන ශිෂ්‍යාධාර සමාජ වැඩ ශාස්ත්‍රවේදී 2018/19 (ඉංග්‍රීසි මාධ්‍යය) සමාජ වැඩ ශාස්ත්‍රවේදී 2019/20 (සිංහල, දෙමළ, ඉංග්‍රීසි මාධ්‍යය සමාජ වැඩ ශාස්ත්‍රවේදී 2020/21 (සිංහල, දෙමළ, ඉංග්‍රීසි මාධ්‍යය) සමාජ වැඩ ශාස්ත්‍රවේදී 2021/22 (සිංහල, දෙමළ, ඉංග්‍රීසි මාධ්‍යය) ජා.ස.සං. ආයතනය | 2022.01.01- 2022.12.31 | 3,100,000.00 | 3,032,000.00 | 68,000.00 | 139 |

## සමාජ සේවා විද්‍යාලය

## 2022 වර්ෂයේ ජනවාරි සිට දෙසැම්බර් දක්වා ප්‍රගතිය

### ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් වැඩසටහන් / ක්‍රියාකාරකම්

**මුදල් අයකර පවත්වන පාඨමාලා**

| අනු අංකය | ව්‍යාපෘතිය / වැඩසටහන / ස්ථානය | පැවැත්වූ දිනය / කාලය | | | | ප්‍රතිලාභීන් සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|
| | | | වෙන් කරන ලද මුදල | වියදම | ඉතිරිය | |
| 1 | සමාජ වැඩ ශාස්ත්‍රපති පාඨමාලාව 2019/20 (ඉංග්‍රීසි)<br>ජා.ස.සං. ආයතනය | 2022.11.10 | 1,952,500.00 | 1,552,217.52 | 400,282.48 | ඉංග්‍රීසි - 08 |
| 2 | සමාජ වැඩ ශාස්ත්‍රපති පාඨමාලාව 2020/21 (සිංහල/දෙමළ/ඉංග්‍රීසි)<br>ජා.ස.සං. ආයතනය | 2022.11.26-<br>2023.03.31 | 7,229,900.00 | 98,624.00 | 4,606,310.00 | සිංහල - 21<br>දෙමළ - 25<br>ඉංග්‍රීසි - 19 |
| 3 | සමාජ වැඩ ශාස්ත්‍රපති පාඨමාලාව 2021/22 (සිංහල/දෙමළ/ඉංග්‍රීසි)<br>නව කණ්ඩායම<br>ජා.ස.සං. ආයතනය | 2022.11.11-<br>2023.03.31 | 7,940,500.00 | වර්ෂයතුල වියදම් වී නොමැත | 7,940,500.00 | සිංහල - 25<br>දෙමළ - 35<br>ඉංග්‍රීසි - 25 |
| 4 | සමාජ වැඩ ඩිප්ලෝමා පාඨමාලාව 2022/23<br>ජා.ස.සං. ආයතනය<br>මාර්ග ගත ක්‍රමයට ඉගැන්වීම් සිදු කරයි | 2022.05.21-<br>2022.12.11<br>2022.12.10-11 | 819,00.00 | 439,800.00 | 379,200.00 | සිංහල - 15 |
| 5 | සමාජ වැඩ ඩිප්ලෝමා පාඨමාලාව (සමෘද්ධි නිලධාරීන්) 2020/21<br>ජා.ස.සං. ආයතනය | තාවකාලිකව නවතා ඇත | 386,000.000 | 11,490.00 | 374,510.00 | සිංහල - 22 |

## පුහුණු අංශය

### 2022 වර්ෂයේ ජනවාරි සිට දෙසැම්බර් දක්වා ප්‍රගතිය

### ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් වැඩසටහන් / ක්‍රියාකාරකම්

| අංකය | වැඩසටහනේ නම, මාධ්‍යය හා ස්ථානය | ආරම්භක දිනය, අවසාන දිනය හා කාල පරාසය | සහභාගීවන්නන් සංඛ්‍යාව | මූල්‍ය ප්‍රගතිය 2022 දෙසැම්බර් 31 දක්වා | | |
|---|---|---|---|---|---|---|
| | | | | පළමු ගිණුම සඳහා වෙන්කරන ලද මුදල | සමස්ත වියදම | ඉතිරිය |
| 1 | යෝජිත උපදේශනය පිලිබඳ ශාස්ත්‍රවේදී (ගෞරව) උපාධි වැඩසටහන. මෙම වැඩසටහනේ විෂය සමාලෝචන පළමු වාර්තාව ලැබී ඇති අතර, එහි සමාලෝචන වාර්තාවද සකස්කොට උසස් අධ්‍යාපන අමාත්‍යාංශය වෙත භාර දී ඇත. මෙහි අවසාන සමාලෝචන වාර්තාව ලැබීමට නියමිතය. මෙහි සමාලෝචන වාර්තාව සකස් කිරීම සඳහා අධ්‍යයන සභාවේ උපදෙස් පරිදි තාක්ෂණික කමිටුවක් පත්කරගන්නා ලදි. | 09.06.2022<br>24.06.2022<br>05.07.2022<br>12.07.2022<br>27.07.2022<br>01 සිට 30 .09.2022<br>5.10.2022-10.10.2022<br>25.11.2022 | පීඨ සාමාජිකයන් 30 | 175,000.00 | 12,535.00<br>45,000.00<br>35,000.00<br>50,000.00 | 32,465.00 |
| 2 | කෙටි කාලීන පුහුණු වැඩසටහන තලාව ප්‍රාදේශීය මධ්‍යස්ථානය (පෙර පාසල් ගුරුවරුන් සඳහා) | 24.02.2022 | 68 | 10,000.00 | 7,630.00 | 2,370.00 |
| 3 | ප්‍රජාපාදක සංවිධානයන්හී ධාරිතා සංවර්ධනය පිළිබඳ කෙටිකාලීන පුහුණු වැඩසටහනක් කිලිනොච්චි ප්‍රාදේශීය පුහුණු මධ්‍යස්ථානයේදී පැවැත්වීය.<br>කණ්ඩායම් I – 9a.m. to 12.00<br>කණ්ඩායම් II – 1p.m. to 4 p.m. | 14.02.2022 | 55 | 10,000.00 | 8,865.00 | 1,135.00 |
| 4 | ජීවනොපාය සංවර්ධනය සඳහා සමාජවැඩ කුසළතා පිළිබඳ කෙටි කාලීන පුහුණු වැඩසටහනක් කිලිනොච්චි ප්‍රාදේශීය පුහුණු මධ්‍යස්ථානයේදී පැවැත්වීය. (සෞභාග්‍යයා සතිය නිමිති කොටගෙන) | 25.03.2022 | 57 | නොමිලේ පවත්වන ලදී | | |
| 5 | සමන්තුරේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ප්‍රජාපාදක සංවිධානයන්හී ධාරිතා සංවර්ධනය පිළිබඳ කෙටි | 29.03.2022 | 66 | 10,000.00 | 6,550.00 | 3,450.00 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | කාලීන පුහුණු වැඩසටහන . – අම්පාර ප්‍රාදේශීය මධ්‍යස්ථානය | | | | | |
| 6 | ප්‍රජාව දැනුවත කිරීමේ වැඩසටහන මොනරාගල සහ මොරගහපල්ලම ග්‍රාම නිලධාරී කොට්ඨාසය. | 2022.03. 29 සහ 30 | 31+29 = 60 | 10,000.00 | 6,600.00 | 3,400.00 |
| 7 | කල්මුනේ අධ්‍යාපන කාලාපයේ පෙර පාසල් ගුරුවරුන් සහ පාසල ගුරුවරුන් සඳහා උපදේශනය ප කුසළතා පුහුණු වැඩසටහන | 10.03.2022 | 60 | 10,000.00 | 10,000.00 | 00 |
| 8 | කෙටිකාලීන පුහුණු වැඩසටහන “ධාරිතා වර්ධන සහ වැඩිහිටි රැකවරණය” රන්න ප්‍රාදේශීය මධ්‍යස්ථානය | 30.03.2022 | 25 | 10,000.00 | 7,815.00 | 2,185.00 |
| 9 | සිසුන් අධීක්ෂණය පුහුණු කිරීම සඳහා කරන ලද පුහුණු වැඩසටහන– පුහුණු අංශය, ජාතික සමාජ සංවර්ධන ආයතය | 30.03.2022 | 10 | 15,000.00 | 15,000.00 | 00 |
| 10 | උතුරු පළාතේ ළමා රැකවරණ කළමනාකරුවන් සඳහා කෙටිකාලීන පුහුණු වැඩසටහන ළමා රැකවරණ සැලසුම (දෙමළ මාධ්‍යය - Zoom මාර්ගගත ක්‍රමය ඔස්සේ) - මෙහෙයවීම ජාතික සමාජ සංවර්ධන ආයතනය - කිලිනොච්චිය ප්‍රාදේශීය මධ්‍යස්ථානය | 21.06. 2022 | 66 | මාර්ගගත ක්‍රමය ඔස්සේ නොමිලේ පවත්වන ලදී. | | |
| 11 | මරුතංගා වැඩිහිටි සංගමයේ ප්‍රීතිමත් පවුල් ජීවිතයක් සඳහා කෙටිකාලීන පුහුණු වැඩසටහන (දෙමළ මාධ්‍යය) මෙහෙයවීම ජාතික සමාජ සංවර්ධන ආයතනය - කිලිනොච්චිය ප්‍රාදේශීය මධ්‍යස්ථානය | 23.06.2022 | 40 | 20,000.00 | 20,000.00 | 00 |
| 12 | තංගල්ල සමෘද්ධි ප්‍රජාපාදක සංවිධාන නායකයින් සඳහා “ධාරිතා සංවර්ධන පුහුණු වැඩසටහන” (සිංහල මාධ්‍යය) - මෙහෙයවීම ජාතික සමාජ සංවර්ධන ආයතනය - රන්න ප්‍රාදේශීය මධ්‍යස්ථානය | 22.06. 2022 | 30 | 10,000.00 | 4,405.00 | 5,595.00 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 13 | තංගල්ල සමෘද්ධි නිලධාරීන් සඳහා ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ කෙටි කාලීන පුහුණු වැඩසටහන (සිංහල මාධ්‍යය)- මෙහෙයවීම ජාතික සමාජ සංවර්ධන ආයතනය - රන්න ප්‍රාදේශිය මධ්‍යස්ථානය | 23.06.2022 | 28 | 10,000.00 | 4,405.00 | 5,595.00 |
| 14 | පෙරපාසල් ගුරුවරන් සඳහා ක්ලමත කළමනාකරණය පිළිබඳ කෙටිකාලීන පුහුණු වැඩසටහන මාර්ගගත ක්‍රමය ඔස්සේ (දින 05 ක්)- මෙහෙයවීම ජාතික සමාජ සංවර්ධන ආයතනය - තලාව පිළිබඳ කෙටිකාලීණ පුහුණු වැඩසටහන - කිලිනොච්චි මධ්‍යස්ථානය | 15,16,17,18 සහ 19 .08.2022 | 110 | 10,000.00 | 7,200.00 | 2,800.00 |
| 15 | අ.පොස.ස උසස් පෙළ අවසන් කල සිසුන් සඳහා මාර්ගගත ක්‍රමය ඔස්සේ පවත්වන ලද වැඩිහිටි රැකවරණය පිළිබඳ කෙටිකාලීණ පුහුණු වැඩසටහන - කිලිනොච්චි මධ්‍යස්ථානයේ (දින 03ක්) | 23,24 සහ 25 .08.2022 | 30 | මාර්ගගත ක්‍රමය ඔස්සේ නොමිලේ පවත්වන ලදී. | | |
| 16 | වාඩියගොඩ පාසල් ශිෂ්‍ය නායකයින් සඳහා නායකත්ව සංවර්ධන පිළිබඳ කෙටිකාලීන පුහුණු වැඩසටහන - රන්න ප්‍රාදේශිය මධ්‍යස්ථානය | 09.09. 2022 | 25 | 10,000.00 | 9,680.00 | 320.00 |
| 17 | සමාජ වැඩකරුවන් සඳහා සිද්ධි කළමනාකරණය පිළිබඳ කෙටිකාලීන පුහුණු වැඩසටහන - කිළිනොච්චිය ප්‍රාදේශිය මධ්‍යස්ථානය | 19.09.2022 | 23 | 10,000.00 | 9,750.00 | 250.00 |
| 18 | අම්පාර අලිගම්බායි ප්‍රදේශයේ ස්වදේශීය ප්‍රජාව සඳහා ප්‍රජා සංවර්ධන පිළිබඳ කෙටිකාලීණ පුහුණු වැඩසටහන - ප්‍රාදේශිය මධ්‍යස්ථානය අම්පාර | 09.09.2022 | 71 | 5,000.00 | 4,970.00 | 30.00 |
| 19 | සද්ධාතිස්ත ප්‍රාතමික පාසලේ දෙමව්පියන් හා සිසුන් තරුණ සංවර්ධන පිළිබඳ දැනුවත් කිරීමේ කෙටිකාලීන පුහුණු වැඩසටහන - අම්පාර ප්‍රාදේශිය මධ්‍යස්ථානය | 13.09.2022 | 25 | 5,000.00 | 5,000.00 | 00 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 20 | කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැනවීමේ අමාත්‍යාංශයේ උපදේශන නිලධාරීන්ට ප්‍රජා පුහුණුව සඳහා සමාජ වැඩ මැදිහත්කරනය පිළිබඳ කෙටිකාලීන් පුහුණු වැඩසටහන | 14.10. 2022-27.10.2022 | 210 | 21,000.00 | 19,950.00 | 1,050.00 |
| 21 | අනුරාධපුර දිස්ත්‍රික්කයේ උපදේශන ගුරුවරුන් සඳහා අධ්‍යාපන උපදේශනය පිළිබඳ කෙටිකාලීන පුහුණු වැඩසටහන - තලාව ප්‍රාදේශිය මධ්‍යස්ථානය | 15.11.2022 | 35 | 10,000.00 | 9,915.00 | 85.00 |
| 22 | මනෝසමාජීය සංවර්ධනය තේමා කරගනිමින් ගල්ගමුව ගැමුනු මහා විද්‍යාලීය සිසුන් දැනුවත් කිරීමේ වැඩසටහන - තලාව ප්‍රාදේශිය මධ්‍යස්ථානය | 17.11.2022 | ශිෂ්‍යයින් 300 ගුරුවරුන් 36 | නොමිලේ | | |
| 23 | තඹුත්තේගම මහවැලි නිලධාරීන් (සමාජ සංවර්ධන) සඳහා ධාරිතා සංවර්ධනය පිළිබඳ කිරීමේ කෙටි කාලීන පුහුණු වැඩසටහන - තලාව ප්‍රාදේශිය මධ්‍යස්ථානය | 16.11.2022 | 50 | නොමිලේ | | |
| 24 | තලාව ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ නිලධාරීන් සඳහා ක්ලමත කළමනාකරණය පිළිබඳ කෙටි කාලීන පුහුණු වැඩසටහන - තලාව ප්‍රාදේශිය මධ්‍යස්ථානය | 16.11.2022 | 135 | නොමිලේ | | |
| 25 | යාපනය මානිප්පායි පාසලේ අ.පොස. උසස් පෙළ සිසුන් සඳහා මාර්ගෝපදේශනය හා උපදේශනය පිළිබඳ කෙටි කාලීන පුහුණු වැඩසටහන - කිලිනොච්චිය ප්‍රාදේශිය මධ්‍යස්ථානය | 10.10.2022 | 51 | 10,000.00 | 10,000.00 | 00 |
| 26 | අරකියාල මුස්ලීම් පාසලේ සිසුන් සඳහා ආතති කළමණාකරනය හා නායකත්වය පිළිබඳ කෙටි කාලීන පුහුණු වැඩසටහන - සීදුව මධ්‍යස්ථානය | 16.11.2022 | 119 | 10,000.00 | 9,912.00 | 88.00 |
| 27 | ප්‍රජා නායකයින් වෙනුවෙන් පවත්වන ලද සියදිවි හානිකරගැනීමට තැත්කිරීම වැලැක්වීම පිළිබඳ කෙටි කාලීන පුහුණු වැඩසටහන - අම්පාර ප්‍රාදේශිය මධ්‍යස්ථානය | 30.11.2022 | 25 | 10,000.00 | 9,860.00 | 140.00 |
| | **මුළු පුහුණු කරන ලද පුහුණු කරුවන්** | | **1840** | | | |

**ජා.ස.ආ අරමුදල් ජනනය කරන ලද වැඩසටහන් :**

| අංකය | වැඩසටහනේ නම, මාධ්‍යය හා ස්ථානය | ආරම්භක දිනය, අවසාන දිනය හා කාල පරාසය | සහභාගීවන්නන් සංඛ්‍යාව | පළමු ගිණුම සඳහා වෙන්කරන ලද මුදල | සමස්ත වියදම | ඉතිරිය |
|---|---|---|---|---|---|---|
| 1. | ළමුන් කේන්ද්‍ර කොට ගත් ප්‍රජා සංවර්ධන පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව. ක්ෂේත්‍ර පුහුණුව ක්‍රියාත්මක වෙමින් පවතී. ශුද්ධවූ පවුලේ මූලස්ථානය විසින් අනුග්‍රහය දක්වන පාඨමාලාවකි. | 27.01.2022 | 18 | 209,000.00 | මේ දක්වා වියදම් දරා නොමැත. | 209,000.00 |
| 2. | ආසියානු පදනම මගින් මූල්‍ය අනුග්‍රහය ලබා දෙන අධිකරන සේවා කොමිෂන් සභාව විසින් පත්කරන ලද අධිකරන පවුල් උපදේශකයින් සඳහා වූ පුහුණු වැඩ සටහන | 27 සහ 29/08/2022 ,03 සහ 04/09/2022 | 50 | 2,616,281.25 | 2,020,754.00 | 595,527.25 |
| 3. | සමාජ සංවර්ධන පිළිබඳ පුහුණු කරුවන් පුහුණු කිරීමේ වැඩසටහනක් මාර්ගගත ක්‍රමය ඔස්සේ පැවැත්වීය. මෙම වැඩසටහන කිළිනොච්චි ප්‍රාදේශිය මධ්‍යස්ථානය මගින් සංවිධානය කරන ලදි. | 22.03.2022 සිට 30.09.2022 | 09 | 162,000.00 | 7,000.00 | 155,000.00 |
| 4. | සමෘද්ධි සංවර්ධන නිලධාරීන් සඳහා වන සමාජ වැඩ සහතික පත්‍ර පාඨමාලාවේ සමාරම්භක වැඩකටහන පවත්වන ලදි. | 27.12.2022 | 600 | 696,000.00 | මේ දක්වා වියදම් දරා නොමැත. | 696,000.00 |
| 5. | ව්‍යාපෘති යොජනා පත්‍ර ලිවීම පිළිබඳ කෙටිකාලීන පුහුණු වැඩසටහනක් පරිසර අමාත්‍යාංශයට අනුයුක්ත සංවර්ධන නිලධාරීන් වෙනුවෙන් පැවැත්වීය. මෙම වැඩ සටහන පරිසර අමාත්‍යාංශය සංවිධානය කළ අතර IUCN ආයතනය මූල්‍ය දායකත්වය සපයන ලදි. | 25.05.2022 05.07.2022 | 400 | 27,000.00 | මේ දක්වා වියදම් දරා නොමැත. | 27,000.00 |
| 6 | ළමා කේන්ද්‍රීය ප්‍රජා සංවර්ධනය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව – දෙමළ මාධ්‍ය 2022 | 08.12.2022 | 19 | 209,000.00 | මේ දක්වා වියදම් දරා නොමැත. | 209,000.00 |
| | **එකතුව** | | **1096** | | | |

## පුහුණු අංශය

### 2022 වර්ෂයේ ජනවාරි සිට දෙසැම්බර් දක්වා ප්‍රගතිය

### ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් වැඩසටහන් / ක්‍රියාකාරකම්

ගාස්තු අයකිරීමේ ඩිප්ලෝමා වැඩසටහන්:

| අංකය | වැඩසටහනේ නම, මාධ්‍යය හා ස්ථානය | ආරම්භක දිනය, අවසාන දිනය හා කාල පරාසය | මූළු ශිෂ්‍ය සංඛ්‍යාව | | අධ්‍යයන ප්‍රගතිය | මූල්‍ය ප්‍රගතිය (රු.) 31.12.2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | ලියාපදිංචි ශිෂ්‍ය සංඛ්‍යාව | සාමාන්‍ය පැමිණීම | අධ්‍යයන වැඩසටහන වර්තමාන ප්‍රගතිය (එක්වි ෂයයක් සඳහා වෙන් කල ඇති පැය - 45) | ලියාපදංචි සිසුන් සඳහා ඇස්තමේන්තු ගත වැය | දිනපතා පැමිණෙන සිසුන් සංඛ්‍යාවට අදාලව මුදල් ලැබීම් | සමස්ත වියදම | සමස්ත ඉතිරිය |
| අධ්‍යයන වර්ෂය **2019/2020** | | | | | | | | | |
| 1 | 2019/2020 උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව - යාපනය (දෙමළ) | 2019/06/09 2021/04/30 මාස 21 | 51 | 44 | සහතික ප්‍රදානෝත්සවය පැවැත්වීමට නියමිතය | 2,601,000.00 | 2,151,000.00 | 1,498,548.48 | 652,451.52 |
| 2 | 2019/2020 උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව කුරුණෑගල (සිංහල) (DCBC) | 10/06/2019 මාස 21 | 63 | 59 | අවසන් ප්‍රතිඵල නිකුත් කිරීමට නියමිතය | 7,515,500.00 | 5,671,500.00 | 4,481,582.47 | 1,189,917.53 |
| 3 | 2019/2020 උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව - රත්නපුර (සිංහල) (DCBC) | 17/06/2019 මාස 21 | 20 | 19 | අවසන් ප්‍රතිඵල නිකුත් කිරීමට නියමිතය | | | | |
| 4 | 2019/2020 උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව - මාතර (සිංහල) (DCBC) | 20/06/2019 මාස 21 | 40 | 38 | අවසන් ප්‍රතිඵල නිකුත් කිරීමට නියමිතය | | | | |
| 5 | 2019/2020 උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව - කිලිනොච්චිය(දෙමළ) | 15/07/2019 මාස 21 | 31 | 27 | අවසන් ප්‍රතිඵල නිකුත් කිරීමට නියමිතය | 1,632,000.00 | 1,256,000.00 | 573,298.33 | 682,701.67 |
| 6 | 2019/2020 උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව - තලාව (සිංහල) | 24/08/2019 මාස 21 | 45 | 33 | සහතික ප්‍රදානෝත්සවය පැවැත්වීමට නියමිතය | 2,295,000.00 | 2,040,000.00 | 1,430,159.59 | 609,840.41 |
| 7 | 2019/2020 උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව - නුවර (දෙමල) | 12/12/2019 මාස 21 | 50 | 38 | සහතික ප්‍රදානෝත්සවය පැවැත්වීමට නියමිතය | 2,550,000.00 | 1,959,000.00 | 1,442,762.25 | 516,237.75 |
| 8 | 2019/2020 උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව පුත්තලම (දෙමළ) | 07/12/2019 මාස 21 | 42 | 20 | අවසන් ප්‍රතිඵල නිකුත් කිරීමට නියමිතය | 2,142,000.00 | 1,690,000.00 | 1,038,480.87 | 651,519.13 |

| අංකය | වැඩසටහනේ නම, මාධ්‍යය හා ස්ථානය | ආරම්භක දිනය, අවසාන දිනය හා කාල පරාසය | මුළු ශිෂ්‍ය සංඛ්‍යාව | | අධ්‍යයන ප්‍රගතිය | මූල්‍ය ප්‍රගතිය (රු.) 31.12.2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | ලියාපදිංචි ශිෂ්‍ය සංඛ්‍යාව | සාමාන්‍ය පැමිණීම | අධ්‍යයන වැඩසටහන වර්තමාන ප්‍රගතිය (එක්වි ෂයයක් සඳහා වෙන් කල ඇති පැය - 45) | ලියාපදංචි සිසුන් සඳහා ඇස්තමේන්තු ගත වැය | දිනපතා පැමිණෙන සිසුන් සංඛ්‍යාවට අදාලව මුදල් ලැබීම් | සමස්ත වියදම | සමස්ත ඉතිරිය |
| 9 | 2019/2020 උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව - අම්පාර (සිංහල) | 30/11/2019 මාස 21 | 40 | 23 | සහතික ප්‍රදානෝත්සවය පැවැත්වීමට නියමිතය | | | | |
| | **මුළු ශිෂ්‍ය සංඛ්‍යාව** | | **382** | **301** | | | | | |
| අධ්‍යයන වර්ෂය **2020/2021** | | | | | | | | | |
| 1 | 2020/2021 උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව -කිලිනොච්චි (දෙමළ) | 15/08//2020 මාස 21 | 46 | 46 | ක්ෂේත්‍ර පුහුණුව සිදුකරමින් පවතී | 2,346,000.00 | 1,894,000.00 | 1,714,791.39 | 179.208.61 |
| 2 | 2020/2021 උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව - රත්නපුර (සිංහල) | 28/08/2020 මාස 21 | 48 | 37 | ප්‍රතිඵල නිකුත් කිරීමට නියමිතය | 2,448,000.00 | 2,209,700.00 | 1,889,631.15 | 320,068.85 |
| | **මුළු ශිෂ්‍ය සංඛ්‍යාව** | | **94** | **83** | | | | | |
| අධ්‍යයන වර්ෂය **2021/2022** | | | | | | | | | |
| 1 | 2021/2022 උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව - සීදුව (සිංහල, දෙමළ හා ඉංග්‍රීසි) | 07/03/2021 මාස 21 | 127 | S-49<br>T-43<br>E-23 | ක්ෂේත්‍ර පුහුණුව අවසන්වී ඇත. | 6,171,000.00 | 5,725,000.00 | 1,934,606.98 | 3,817,393.02 |
| 2 | 2021/2022 උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව - තලාව (සිංහල) | 28/08/2021 මාස 21 | 57 | 43 | ක්ෂේත්‍ර පුහුණු අනුස්ථාපන වැඩසටහන සිදුකර ඇත. | 2,609,000.00 | 2,609,000.00 | 950,709.72 | 1,658,290.28 |
| 3 | 2021/2022 උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව - අම්පාර (දෙමළ) | 04/12/2021 30/07/2023 මාස 21 | 59 | 44 | දෙවන සෙමෙස්තරය ට අදාළ පංති කාමර දේශන පවත්වයි. පැය 93 ක් අවසන් කර ඇත. | 2,907,000.00 | 2,356,000.00 | 1,291,271.92 | 1,064,728.08 |
| 4 | 2021/2022 උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව ත්‍රිකුනාමලය (දෙමළ) | 24/04/2021 15/12/2023 මාස 21 | 44 | 44 | ක්ෂේත්‍ර පුහුණුව අවසන්වී ඇත. | 2,244,000.00 | 2,069,000.00 | 706,521.21 | 1,362,478.79 |

| අංකය | වැඩසටහනේ නම, මාධ්‍යය හා ස්ථානය | ආරම්භක දිනය, අවසාන දිනය හා කාල පරාසය | මුළු ශිෂ්‍ය සංඛ්‍යාව | | අධ්‍යයන ප්‍රගතිය | මූල්‍ය ප්‍රගතිය (රු.) 31.12.2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | ලියාපදිංචි ශිෂ්‍ය සංඛ්‍යාව | සාමාන්‍ය පැමිණීම | අධ්‍යයන වැඩසටහන වර්තමාන ප්‍රගතිය (එක්වි ෂයයක් සඳහා වෙන් කල ඇති පැය - 45) | ලියාපදංචි සිසුන් සඳහා ඇස්තමේන්තු ගත වැය | දිනපතා පැමිණෙන සිසුන් සංඛ්‍යාවට අදාලව මුදල් ලැබීම් | සමස්ත වියදම | සමස්ත ඉතිරිය |
| 5 | 2021/2022 උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව නුවර (දෙමළ) | 04/12/2021 30/07/2023 මාස 21 | 61 | 42 | දෙවන සෙමෙස්තරය ට අදාළ පංති කාමර දේශන පවත්වයි. පැය 96 ක් අවසන් කර ඇත. | 3,009,000.00 | 1,551,000.00 | 1,422,573.92 | 128,426.08 |
| 6 | 2021/2022 උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව -යාපනය (දෙමළ) | 3/07/2021 මාස 21 | 44 | 33 | දෙවන සෙමෙස්තරය ට අදාළ පංති කාමර දේශන පවත්වයි. පැය 90 ක් අවසන් කර ඇත. | 2,295,000.00 | 2,025,000.00 | 471,351.56 | 1,553,668.44 |
| | **මුළු ශිෂ්‍ය සංඛ්‍යාව** | | **392** | **318** | | | | | |
| **අධ්‍යයන වර්ෂය 2022/2023** | | | | | | | | | |
| 1 | 2022/2023 උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව - හැටන්, නුවර හා මඩකළපුව (දෙමළ) | 30/07/2022 මාස 21 | 35<br>30<br>23 | 35<br>30<br>23 | පළමු සෙමෙස්තරය අදාළ පංති කාමර දේශන පවත්වයි. පැය 108 ක් අවසන් කර ඇත. | 3,009,000.00 | 1,551,000.00 | 1,313,401.04 | 237,598.96 |
| 2 | 2022/2023 උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව කුරුණෑගල. (සිංහල) | 08/01/2022 31/01/2024 මාස 21 | 64 | 51 | පළමු සෙමෙස්තරය අදාළ පංති කාමර දේශන අවසන්වී ඇත. | 2,939,000.00 | 2,939,000.00 | 1,102,657.98 | 1,836,342.02 |
| 3 | 2022/2023 උපදේශනය පිළිබඳ උසස් ඩිප්ලෝමා පාඨමාලාව – සීදුව. (සිංහල) | 16/01/2022 | 28 | 28 | පළමු සෙමෙස්තරය අදාළ විභාගය පවත්වා අවසන්. | 2,052,000.00 | 1,53,500.00 | 341,849.53 | 811,650.47 |

| අංකය | වැඩසටහනේ නම, මාධ්‍යය හා ස්ථානය | ආරම්භක දිනය, අවසාන දිනය හා කාල පරාසය | මුළු ශිෂ්‍ය සංඛ්‍යාව | | අධ්‍යයන ප්‍රගතිය | මූල්‍ය ප්‍රගතිය (රු.) 31.12.2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | ලියාපදිංචි ශිෂ්‍ය සංඛ්‍යාව | සාමාන්‍ය පැමිණීම | අධ්‍යයන වැඩසටහන වර්තමාන ප්‍රගතිය (එක්වි ෂයයක් සඳහා වෙන් කල ඇති පැය - 45) | ලියාපදංචි සිසුන් සඳහා ඇස්තමේන්තු ගත වැය | දිනපතා පැමිණෙන සිසුන් සංඛ්‍යාවට අදාලව මුදල් ලැබීම් | සමස්ත වියදම | සමස්ත ඉතිරිය |
| 4 | 2022/2023 උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව – සීදුව. (සිංහල, දෙමළ හා ඉංග්‍රීසි) | 03/04/2022 මාස 21 | 40<br>34<br>27 | 34<br>33<br>20 | පළමු සෙමෙස්තරය අදාළ පංති කාමර දේශන පවත්වයි. පැය 189 ක් අවසන් කර ඇත. | 4,998,000.00 | 4,998,000.00 | මෙම වර්ෂයතුල වියදම් දරා නොමැත | |
| 5 | 2022/2023 උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව – රන්න. (සිංහල)<br>2022/2023 උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව – අම්පාර | 12/03//2022 මාස 21<br>09/04/2022 මාස 21 | 25<br>25 | 19<br>20 | පළමු සෙමෙස්තරය අදාළ පංති කාමර දේශනඅවසන්වී ඇත. | 23,970,000.00 | 2,221,000.00 | මෙම වර්ෂයතුල වියදම් දරා නොමැත | |
| 6 | 2022/2023 උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව –චවුනියාව (දෙමළ) | 07/05/2022 මාස 21 | 62 | 56 | පළමු සෙමෙස්තරය අදාළ පංති කාමර දේශන පවත්වයි. පැය 128 ක් අවසන් කර ඇත. | 3,012,000.00 | 1,612,000.00 | 383,479.71 | 2,628,520.29 |
| | **මුළු ශිෂ්‍ය සංඛ්‍යාව 2022/2023** | | **393** | **352** | | | | | |

| අංකය | අධ්‍යයන වැඩසටහන් | ලියාපදිංචි ශිෂ්‍ය සංඛ්‍යාව | වර්තමාන ශිෂ්‍ය සංඛ්‍යාව |
|---|---|---|---|
| 1 | අධ්‍යයන වර්ෂය 2019/2020 | 382 | 301 |
| 2 | අධ්‍යයන වර්ෂය 2020/2021 | 94 | 83 |
| 3 | අධ්‍යයන වර්ෂය 2021/2022 | 392 | 318 |
| 4 | අධ්‍යයන වර්ෂය 2022/2023 | 392 | 353 |
| **ඩිප්ලෝමා පාඨමාලාවල මුළු ශිෂ්‍ය සංඛ්‍යාව** | | **1260** | **1055** |

| | |
|---|---|
| මුළු ඩිප්ලෝමා පාඨමාලාලාභීන් ගණන | 550 |
| මුළු උසස් ඩිප්ලෝමා පාඨමාලාලාභීන් ගණන | 14 |
| **එකතුව** | **564** |

## සමාජ සංවර්ධන ප්‍රතිපත්ති, පර්යේෂණ හා ප්‍රකාශන අංශය

### 2022 වර්ෂයේ ජනවාරි සිට දෙසැම්බර් දක්වා ප්‍රගතිය

### ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් වැඩසටහන් / ක්‍රියාකාරකම්

| අංකය | ව්‍යාපෘති වැඩසටහන | ක්‍රියාකාරකම | ස්ථානය | යෝජිත අරමුදල | භෞතික ප්‍රගතිය | මූල්‍ය ප්‍රගතිය Rs. | ප්‍රතිලාභීන් |
|---|---|---|---|---|---|---|---|
| 01 | ශ්‍රී ලංකා සමාජ වැඩ සඟරාව Sri Lanka Journal of Social Work 2021 අර්ධ වාර්ෂික | අධ්‍යයන කටයුතු මණ්ඩලයේ අනුමැතිය යටෙත් සමාජ වැඩ ජර්නලය අර්ධ වාර්ශිකව සකස් කර ඇත, දත්ත රැස් කිරීම, සමාලෝචනය හා ප්‍රකාශනය. | ජාතික සමාජ සංවර්ධන ආයතනය | 30,000.00 | අපගේ අන්තර්ජාල වෙබ් අඩවිය ඔස්සේ පලකිරීම කර ඇත | 27,000.00 | අධ්‍යයන කාර්ය මණ්ඩලය, ශිෂ්‍යයන්, ප්‍රතිපත්ති සම්පාදකයින් |
| 02 | ශ්‍රී ලංකා සමාජ සංවර්ධන සඟරාව අර්ධ වාර්ෂික | අධ්‍යයන කටයුතු මණ්ඩලයේ අනුමැතිය යටතේ සමාජ වැඩ ජර්නලය අර්ධ වාර්ශිකව සකස් කර ඇත, දත්ත රැස් කිරීම, සමාලෝචනය හා ප්‍රකාශනය. | ජාතික සමාජ සංවර්ධන ආයතනය | 30,000.00 | අපගේ අන්තර්ජාල වෙබ් අඩවිය ඔස්සේ පලකිරීම කර ඇත | 22,000.00 | අධ්‍යයන කාර්ය මණ්ඩලය, ශිෂ්‍යයන්, ප්‍රතිපත්ති සම්පාදකයින් |
| 03 | විද්‍යුත් සඟරාව අර්ධ වාර්ෂික | අධ්‍යයන කටයුතු මණ්ඩලයේ අනුමැතිය යටෙත් සමාජ වැඩ ජර්නලය අර්ධ වාර්ශිකව සකස් කර ඇත, දත්ත රැස් කිරීම, සමාලෝචනය හා ප්‍රකාශනය. | ජාතික සමාජ සංවර්ධන ආයතනය | 30,000.00 | අපගේ අන්තර්ජාල වෙබ් අඩවිය ඔස්සේ පලකිරීම කර ඇත | 27,000.00 | අධ්‍යයන කාර්ය මණ්ඩලය, ශිෂ්‍යයන්, ප්‍රතිපත්ති සම්පාදකයින් දේශීය හා විදේශීය |
| 04 | පුවත් හසුන අර්ධ වාර්ෂික (News Letter) | තොරතුරු රැස් කිරීම, පිටු සැකසීම, මුද්‍රණය | ජාතික සමාජ සංවර්ධන ආයතනය | 10,000.00 | අපගේ අන්තර්ජාල වෙබ් අඩවිය ඔස්සේ පලකිරීම කර ඇත | 7,500.00 | ජාතික සමාජ සංවර්ධන ආයතනය හා මහජනතාව |
| 05 | ශිෂ්‍ය සමාජ වැඩ ජර්නලය | ශිෂ්‍ය සමාජ වැඩ ජර්නලය ප්‍රකාශනය කිරීම | ජාතික සමාජ සංවර්ධන ආයතනය | අංශය මගින් | අපගේ අන්තර්ජාල වෙබ් අඩවිය ඔස්සේ පලකිරීම කර ඇත | අංශය මගින් | අධ්‍යයන කාර්ය මණ්ඩලය හා ශිෂ්‍යයන් |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 07 | පර්යේෂණ ක්‍රම වේදය පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාවේ විෂය නිර්දේශය සංවර්ධනය කිරීම | විෂය නිර්දේශය අවසන් කර ඇත. | ජාතික සමාජ සංවර්ධන ආයතනය | 50,000.00 | සකස් කරමින් පවතී. | වෙනත් අයවැය අයිතම වෙත මාරු කර ඇත. | පර්යේෂකයින්, රාජ්‍ය හා රාජ්‍ය නොවන නිලධාරීන් හා ශිෂ්‍ය ප්‍රජාව |
| 08 | සමාජ ප්‍රතිපත්ති පිළිබඳ ප්‍රකාශන ප්‍රකාශයට පත් කිරීම | තෝරාගත් පර්යේෂණ ප්‍රකාශයට පත් කරන ලදී | ජාතික සමාජ සංවර්ධන ආයතනය | අංශය මගින් | මාර්ගගත ප්‍රකාශනය | අංශය මගින් | අධ්‍යයන කාර්ය මණ්ඩලය, ශිෂ්‍යයන්, ප්‍රතිපත්ති සම්පාදකයින් |
| 09 | කාර්ය මණ්ඩල සංවර්ධනය | සදාචාරාත්මක නිෂ්කාශන ලේඛන සකස් කිරීම පිළිබඳ වැඩමුළුවක් පැවැත්වීම | ජාතික සමාජ සංවර්ධන ආයතනය | 25,000.00 | සදාචාරාත්මක නිෂ්කාශන ලේඛන සකස් කිරීම පිළිබඳ පැය 10 ක වැඩසටහනක් පවත්වන ලදී | 25,000.00 | අධ්‍යයන කාර්ය මණ්ඩලය |
| 10 | COVID-19 රෝගයෙන් සුවය ලැබූ පුද්ගලයන් ඔවුන්ගේ අන්තර් සබඳතා පවත්වාගෙන යාමේදී මුහුණ දෙන ගැටලු පිළිබඳ පර්යේෂණ | දත්ත එකතුව 2022 දිගටම පවතිනු ඇත | කොළඹ මහ නගර සභාව | 85,000.00 | සාහිත්‍ය විචාරය සිදු කරමින් පවතී | 65,000.00 | Covid 19 රෝගීන් සුවය ලැබූවන් |
| 11 | Covid 19 සෞඛ්‍ය රැකවරණය සහ අපද්‍රව්‍ය කළමනාකරණයේ පාරිසරික බලපෑම: අනාගතය සඳහා සමාජ ඔරොත්තු දීමේ හැකියාව | දත්ත එකතුව 2022 දිගටම පවත්වාගෙන යයි | ගම්පහ නගර සභාව | 80,000.00 | සාහිත්‍ය විචාරය සිදු කරමින් පවතී | 62,000.00 | මහජනතාව |

**පාලන හා මුදල් අංශය**
**2022 වර්ෂයේ ජනවාරි සිට දෙසැම්බර් දක්වා ප්‍රගතිය**
**ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් වැඩසටහන් / ක්‍රියාකාරකම්**

| අ. අංකය | වැඩසටහනේ නම | ආරම්භක දිනය අවසන් කළ දිනය / පවත්වන ලද දින | මූල්‍ය ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|
| | | | වෙන් කළ මුදල (මිලියන) | මුළු වියදම (මිලියන) | ශේෂය (මිලියන) |
| 1 | සිදුව ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු | 2017.10.26<br>2022.12.31 | 80 | 80 | - |
| 2 | නව ගොඩනැගිල්ලේ භෞතික සම්පත් වැඩිදියුණු කිරීම | 2022.01.13<br>2022.12.31 | 20 | - | 20* |
| 3 | අනුමත අධ්‍යයන හා පුහුණු වැඩසටහන සඳහා වන මාර්ගෝපදේශන මාලාව ක්‍රියාත්මක කිරීම. | 2022.02.02<br>2022.12.31 | 0.1 | 0.068 | 0.032 |

- සිදුව ගොඩනැගිලි සංකීර්ණයේ ඉදිකිරීම් සඳහා ප්‍රතිපාදන අමාත්‍යාංශයේ වැය ශීර්ෂය වෙත වෙන් කරනු ලබයි. Wing A හා B ලෙස නම් කරන ගොඩනැගිලි සංකීර්ණයේ Wing B ගොඩනැගිල්ලේ ඉදිකිරීම් අවසන් කර ඇති අතර Wing A ගොඩනැගිල්ලේ ඉදිකිරීම් 97.24% අවසන් කර ඇත.

**Wing B ගොඩනැගිල්ල**



## Wing A ගොඩනැගිල්ල

### ඉදිරිපස පෙනුම





### පළමු මහළ සඳහා විදුලිපහන් සහ වායු සමීකරණ සවිකිරීම









**පදික වේදිකාවට ගල් ඇතිරීම සහ ජලාපවාහන කටයුතු**





**පහත මහලේ නාන කාමර**





**ආයතනයේ දේශීය පුහුණු වීම් සඳහා සහභාගී වූ නිළධාරීන්**

| | | | |
|---|---|---|---|
| 1 | සේවයට බඳවා ගැනීමේ කාර්ය පටිපාටි, පත් කිරීම් සහ නිවාඩු | - | අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ නිලධාරීන් 27 - 2022.03.31 |
| 2 | ගිණුම් කටයුතු ප්‍රවර්ධනය පිළිබඳ පුහුණු වැඩමුළුව | - | ලක්මාලි විජේසිංහ මිය, රොෂ්නි මධුවන්ති මිය, ලක්ෂිකා දයාරත්න මිය - 2022.05.25 |
| 3 | මාර්ග නීති රීති සහ නව ප්‍රවණතා පිළිබඳ වැඩමුළුව | - | ආයතනයේ සියලුම රියදුරන් - 2022.06.28 |
| 4 | කාර්යාල ක්‍රම, විනය, අභිප්‍රේරණය | - | කාර්යාල කාර්ය සහායක නිලධාරීන් 11 – 2022.06.28 |
| 5 | කාර්ය මණ්ඩල පුහුණු (කැළණිය විශ්ව විද්‍යාලය) | - | ඉරෝන් ජයසේකර මයා, බී.කේ.එස්. කරුණාරත්න මයා, කාංචනා අධිකාරි මිය, මධු සමරසිංහ මිය, ප්‍රියාන් හෙට්ටිආරච්චි මයා, වයි.එම්.නිම්සාත් මයා 2022 ජනවාරි - 2022 ජුනි |
| 6 | මුදල් රෙගුලාසි හා හාණ්ඩ සමීක්ෂණය | - | කලමනාකරණ සහකාර නිලධාරීන් 27 – 2022.09.14 |
| 7 | ජාතික කළමනාකරණ ගිණුම්කරණ සමුළුව 2022 | - | යූ.ඩී.ඩී. උස්හෙට්ටි මිය - 2022.10.31 හා 2022.11.01 |
| 8 | කම්කරු නීති රීති | - | ආයතනයේ අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩල නිලධාරීන් 27 - 2022.12.13 |

## සමාජ සේවා විද්‍යාලය

ජාතික සමාජ සංවර්ධන ආයතනයේ විශාලතම හා පැරණිතම අංශය සමාජ සේවා විද්‍යාලය වේ. එම අංශය වෘත්තීය සමාජ වැඩ පිළිබඳ උපාධි ක්‍රියාත්මක කරනු ලබන අධ්‍යයන අංශයයි. වර්තමාන ශ්‍රී ලංකාවේ වෘත්තීය සමාජ වැඩ උපාධිය පිරිනමනු ලබන එකම රජයේ ආයතනය වන සමාජ සේවා විද්‍යාලය විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව අනුමත උපාධි පිරිනමනු ලබන උසස් අධ්‍යාපන ආයතනයයි. දැනට සමාජ සේවා විද්‍යාලය මඟින් ප්‍රධාන වැඩසටහන් තුනක් ක්‍රියාත්මක වේ. එනම්, සමාජ වැඩ එක් අවුරුදු ඩිප්ලෝමා, සමාජ වැඩ උසස් ඩිප්ලෝමා, සමාජ වැඩ උපාධිය, සමාජ වැඩ පශ්චාත් උපාධිය මෙම වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ අරමුණු හා පරමාර්ථ පහත පරිදි සඳහන් කළ හැකිය.



ජාතික සමාජ සංවර්ධන ආයතනයේ 2022 උපාධි ප්‍රධානෝත්සවය

### අරමුණු හා පරමාර්ථ

1. සමාජ වැඩ අධ්‍යාපනය පිළිබඳ නව වැඩසටහන් හදුන්වා දීම
2. දැනට ක්‍රියාත්මක අධ්‍යයන වැඩසටහන් උසස් කිරීම.
3. සමාජ වැඩ අධ්‍යාපනය තුළ තොරතුරු තාක්ෂණය හා ඉංග්‍රීසි භාෂාව භාවිතා කිරීම.
4. වෘත්තීය පිළිගැනීම අත්කරගැනීම.
5. වෘත්තීය සමාජ වැඩකරුවන් බිහි කිරීම.

## සමාජ වැඩ පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය (MSW)

### හැඳින්වීම

සමාජ වැඩ පිළිබඳ ශාස්ත්‍රපති උපාධි පාඨමාලාවේ අරමුණු වනුයේ වෘත්තීමය සුදුසුකම් සහ කළමනාකාරිත්වය දක්ෂතාවයක් සහිත මිනිස් බලපුහුණු ශ්‍රමය සමාජ සුභසාධන පද්ධතිය සඳහා නිපදවීමත් ඒ තුළින් සමාජ සංවර්ධනය දිරිගැන්වීමත්ය. මෙම වැඩසටහන නිර්මාණය කොට ඇත්තේ සමාජ වැඩ පිළිබඳ උසස් දැනුමත්, ප්‍රායෝගික පුහුණුවීම් ආදිය මුලික කරගෙන සහභාගිවන්නන් තුළ ආකල්පමය වෙනසක් ඇති කිරීම තුළින් ඔවුන් සමාජ සංවර්ධන ක්ෂේත්‍රයේ නියමුවන් ලෙස ප්‍රතිපත්ති සැළසුම් කිරීමේදී ඔවුන්ගේ සක්‍රීය දායකත්වය ලබාගැනීම සඳහාය. ඒ අනුව පාඨමාලාවට ඇතුළත් වීමේ සුදුසුකම් පහත පරිදි දැක්විය හැකිය.



2022 උපාධි ප්‍රධානෝත්සවය

**පාඨමාලාවේ විෂය අන්තර්ගතය**

ශාස්ත්‍රපති පාඨමාලාවේ විෂය අන්තර්ගතය සැකසීමේදී සමාජීය විද්‍යාවන් මෙන්ම සමාජ වැඩ විෂයට අදාළ ක්‍රමෝපායන්ගෙන් යුක්ත විෂය නිර්දේශයක් සකසා ඇත. මෙහිදි විශේෂයෙන්ම න්‍යායාත්මක දැනුම මෙන්ම ප්‍රායෝගික දැනුම ලබාගැනීම සඳහා ක්ෂේත්‍ර පුහුණුවීම් දෙකක්ද පර්යේෂණාත්මක නිබන්ධනයක් ද සකස් කිරීමත් සිසුන් විසින් සිදුකළ යුතුය. ඒ අනුව සමාජ වැඩ සඳහා සමාජ විද්‍යාව, සමාජ වැඩ සඳහා මනෝ විද්‍යාව, සමාජ වැඩ දර්ශනය සහ මුලිකාංග, ශ්‍රී ලංකා සමාජය අවබෝධ කරගැනීම, ශ්‍රී ලංකාවේ සමාජ සුභසාධන වැඩසටහන් ගෝලීයකරණය හා සමාජ සුභසාධනය, සමාජ වැඩ සහ මානව අයිතිවාසිකම්, සමාජ වැඩ කළමනාකරණය, සමාජ වැඩ ප්‍රතිපත්ති, සමාජ වැඩ සඳහා පර්යේෂණ ක්‍රමවේද යන විෂයන්ගෙන් මෙන්ම මුලික ක්ෂේත්‍ර පුහුණුවීම් ප්‍රජාව හා කණ්ඩායම් සමඟ වැඩ කිරීමේ ක්ෂේත්‍ර පුහුණුවීම් සහ පර්යේෂණාත්මක නිබන්ධනය සිදුකිරීමෙන් ප්‍රායෝගික දැනුම, කුසලතා ලබාගැනීමට සිසුන්ට අවස්ථාව සපයා ඇත.

මෙම පාඨමාලා Sri Lanka Qualification Frame work (SLQF) අනුව සකස් කර ඇති අතර, ජාත්‍යන්තර මට්ටමේ ප්‍රමිතියකින් යුක්තව ලකුණු ලබාදීම සිදුකරනු ලබයි. එබැවින් අප ආයතනයේ සමාජ වැඩ ශාස්ත්‍රපති උපාධිය හදාරනු ලැබූ ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට විදේශීය රැකියා ලබාගැනීමට ඇති හැකියාව ඉහළ මට්ටමක පවතී.

**සමාජ වැඩ පිළිබඳ ශාස්ත්‍රවේදී උපාධිය (BSW)**



2022 උපාධි ප්‍රධානෝත්සවය

**හැඳින්වීම**

සමාජ වැඩ පිළිබඳ උපාධිය වසර 4 ක පුර්ණකාලීන පාඨමාලාවකි. එය සමාසික 08 කින් සමන්විත අතර, පංති කාමර දේශන හා සමගාමී ක්ෂේත්‍ර පුහුණුවීම් තුනකින් යුක්ත වේ. විශේෂයෙන්ම සමාජ වැඩ ශාස්ත්‍ර වේදී උපාධිය ශ්‍රී ලංකාවේ ඇති අනෙකුත් විශ්වවිද්‍යාලවලින් පවත්වනු ලබන උපාධි පාඨමාලාවලට වඩා සුවිශේෂී වන්නේ න්‍යායාත්මක දැනුම පමණක් නොව ප්‍රායෝගික පුහුණුවීම්වලින් ද යුක්ත වන නිසයි. එසේ වන්නේ පංති කාමර දේශන අතරතුරදීම ශිෂ්‍යයින්ගේ දැනුම, ආකල්ප වෙනස් කිරීම සඳහා ක්ෂේත්‍ර ගත පුහුණුවීම්වලට ශිෂ්‍යයින් අනුයුක්ත කරන අතර, ක්ෂේත්‍ර අධීක්ෂකවරුන්ගේ සහ පීඨ අධීක්ෂකවරුන්ගේ මගපෙන්වීම, උපදෙස් මත ක්ෂේත්‍ර ක්‍රියාකාරකම් දියත් කරනු ලබයි.

මෙම ශාස්ත්‍රවේදී උපාධි පාඨමාලාවේ විෂය නිර්දේශය සමාජීය විද්‍යාවන්ගේ විෂය අන්තර්ගතයන් මෙන්ම සමාජ වැඩවලට පමණක් සුවිශේෂී වූ ක්‍රමෝපායන්වලින් යුක්ත වන අතර, සිසුන්ට ඒ පිළිබඳ පුළුල් දැනුමක් ලබා දෙනු ලබයි. එමෙන්ම ක්ෂේත්‍ර පුහුණුවීම් මගින් ප්‍රජා ක්‍රියාකාරකම් සිසුන් විසින් කළ යුතු අතර, එම ක්‍රියාකාරකම් අලලා වාර්තා සකස් කිරීම අනිවාර්යය වේ. මීට අමතරව සිසුන් විසින් පර්යේෂණයක් සිදුකර එහි සඳහන් වන නිගමනයන්ට අනුව ක්‍රියාකාරකම් සැළසුම් කර දියත් කළ යුතු අතර, පර්යේෂණ වාර්තාවක් ද එමගින් සකස් කළ යුතුය.

මෙම උපාධි පාඨමාලාවේ සුවිශේෂත්වය වන්නේ න්‍යායාත්මක දැනුම ලබා දෙනු ලබන පැය ගණනට වඩා වැඩි පැය ගණනක් ක්ෂේත්‍ර පුහුණුවීම් සඳහා යොදවා ඇති බැවිනි. පාඨමාලාව සඳහා බදවාගැනීමේ සුදුසුකම් පහත පරිදි දැක්විය හැකි අතර, එම සුදුසුකම්ලත් අයදුම්කරුවන් ආයතනය විසින් පවත්වනු ලබන ඇතුළත්වීමේ විභාගයකට පෙනී සිට එයින් සමත්වන සිසුන් සම්මුඛ පරීක්ෂණයක් ඉදිරියේ පෙනී සිටිය යුතු අතර, එයින් වැඩිම ලකුණු ලබාගන්නා සිසුන් උපාධි පාඨමාලාවට ඇතුළත් කරගනු ලබයි.

සමාජ වැඩ ශාස්ත්‍රවේදී උපාධිය 2013 වර්ෂයේ සිට සිංහල, ඉංග්‍රීසි, දමිළ යන භාෂා මාධ්‍යය තුනෙන්ම පවත්වනු ලබන අතර, පළමු සහ දෙවන වසර සිසුන්ට ඔවුන්ගේ මවු භාෂාවෙන් හෝ ඉංග්‍රීසි භාෂාවෙන් අධ්‍යාපන කටයුතු ආරම්භ කළ හැකිය. පළමු හා දෙවන වසර සිංහල හා දෙමළ භාෂාවෙන් හදාරන සිසුන් දෙවන වසර අවසානයේදී ඉංග්‍රීසි භාෂාව පිළිබඳ දැනුම පරීක්ෂා කිරීමේ විභාගයක් සහ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් ඉදිරියේ පෙනී සිටිය යුතු අතර, එයින් සමත්වන සිසුන් තෙවන වසර සිට ඉංග්‍රීසි මාධ්‍යයෙන් උපාධිය හැදෑරීම සඳහා සුදුසුකම් ලබයි.


සමාජ සේවා විද්‍යාලය මඟින් මෙතෙක් සහතිකපත් ලබා පිටවූ සිසුන්ගේ සංඛ්‍යාව පහත වගුවෙන් දැක්විය හැකිය.

**2021 වර්ෂය දක්වා ආයතනයෙන් උපාධි ලැබූ ශිෂ්‍ය සංඛ්‍යාව;**
**2009 සිට සමාජ වැඩ උපාධිය ලබා ගත් සිසුන් සංඛ්‍යාව**

| | | |
|---|---|---|
| 2005/2009 | - | 18 |
| 2006/2010 | - | 52 |
| 2007/2011 | - | 28 |
| 2008/2012 | - | 35 |
| 2009/2013 | - | 37 |
| 2010/2014 | - | 38 |
| 2011/2015 | - | 38 |
| 2012/2016 | - | 34 |
| 2013/2017 | - | 86 |
| 2014/2018 | - | 108 |
| 2015/2019 | - | 81 |
| 2016/2020 | - | 29 |
| 2017/2021 | - | 28 |
| Total | = | 612 |
| | | ==== |

**Table No - 01** උපාධිධාරීන් නියුක්ත රැකියා අවස්ථාවන්

| අංශය | සංඛ්‍යාව | ප්‍රතිශතය |
|---|---|---|
| **රාජ්‍ය** | 182 | 30% |
| **ජාතික/ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන** | 256 | 42% |
| **විදේශීය** | 32 | 5% |
| **පෞද්ගලික** | 82 | 13% |
| **ස්වේච්ඡා** | 14 | 2% |
| **නීතීඥ වෘත්තීය** | 05 | 1% |
| **රැකියා විරහිත** | 41 | 7% |
| එකතුව | **612** | **100** |




<u>උපාධිධාරීන් සඳහා ඇති රැකියා අවස්ථා</u>

**01. රාජ්‍ය අංශයේ රැකියා අවස්ථා.**

- සමාජ වැඩ කථිකාචාර්ය - වෛද්‍ය පීඨය (කොළඹ විශ්වවිද්‍යාලය)
- සමාජ වැඩ උපදේශක - වෛද්‍ය පීඨය (කොළඹ විශ්වවිද්‍යාලය)
- රේගු නිලධාරී.
- සංවර්ධන සහකාර.
- පරිවාස නිලධාරි.
- ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරි.
- ජාතික ළමා ආරක්ෂක නිලධාරීන්.
- කාන්තා සංවර්ධන නිලධාරීන්.
- උපදේශකවරුන්.
- ශ්‍රී ලංකා ගරු අධ්‍යාපන සේවය.
- මනෝ චිකිත්සක සමාජ වැඩ උපදේශක.

**02. රාජ්‍ය නොවන අංශය.**

සමාජ වැඩ වෘත්තිකයන්ට ජාතික හා ජාත්‍යාන්තර වශයෙන් විශාල ඉල්ලුමක් පවතී. ඒ අනුව අප ආයතනයෙන් බිහිවන උපාධිධාරීන් සඳහා පහත රැකියා අවස්ථා තිබේ.

- ව්‍යාපෘති කළමනාකරු / නිලධාරීන් / සම්බන්ධීකාරක.
- වැඩ සටහන් නිලධාරී.
- උපදේශක.
- අධීක්ෂණ හා ඇගයීම් නිලධාරී.

**03. පෞද්ගලික අංශය**

- සමාජ වගකීම් සම්බන්ධීකාරක.
- උපදේශක.
- මානව සම්පත් කළමනාකරු / නිලධාරීන්.

මීට අමතරව NORAD, AUS-AID, Common Wealth සහ ඉන්දියානු රජය වැනි ආයතන වලින් විදේශ ශිෂ්‍යත්ව ලබාගත් සිසුන් උසස් අධ්‍යාපනය හැදෑරීමට විදේශ ගතවී ඇත. මෙම සිසුන්ට ජාත්‍යන්තර වශයෙන් ඉහළ ඉල්ලුමක් ඇති අතර ඔවුන්ට ඉහළ මට්ටමේ රැකියා අවස්ථා ඇත.

## විෂය බාහිර ක්‍රියාකාරකම්

**සමාජ වැඩ දිනය :- මාර්තු 15. 2022**

**නව පාරිසරික සමාජ ලෝකයක් සම-ගොඩනැගීම: කිසිවෙකු අත්නොහැර යෑම**


2022 ලෝක සමාජ වැඩ දිනයේ තේමාව වන්නේ "නව පාරිසරික සමාජ ලෝකයක් සම-ගොඩනැගීම: කිසිවෙකු අත්නොහැර යෑම" යන්නයි. ලෝක සමාජ වැඩ දිනය සෑම වසරකම මාර්තු මස තුන්වන අඟහරුවාදා දින පවත්වනු ලැබේ, මේ වසරේ මාර්තු 15, 2022 අඟහරුවාදා දිනට යෙදී ඇත. එය සමාජ සේවකයින් සමාජ වැඩ වෘත්තිය සමරන සහ ශ්‍රී ලාංකිකයින්ට සමාජ සේවකයින්ගේ වැදගත්කම ප්‍රවර්ධනය කරන දිනයයි. ප්‍රජාව සහ ගෝලීය වශයෙන්. 2012 හි පළමු පොදු එකඟතාවයෙන් පසුව, ජාත්‍යන්තර සමාජ සේවකයින්ගේ සම්මේලනය (IFSW), ජාත්‍යන්තර සමාජ වැඩ පාසල් සංගමය (IASSW) සහ ජාත්‍යන්තර සමාජ සුභසාධන කවුන්සිලය (ICSW) 2020 දී සමාජ වැඩ සහ 2030 සඳහා ගෝලීය න්‍යාය පත්‍රයක් සම්මත කරන ලදී. සමාජ සංවර්ධනය. මෙම මුලපිරීම අපගේ සමාජවල ප්‍රධාන අභියෝගවලට විසඳුම් සෙවීමට සහ අපගේ වෘත්තියට සහ ඉන් ඔබ්බට අදාළ සමාජ ගැටලු හඳුනා ගැනීමට ඒකාබද්ධ ක්‍රියාමාර්ග සඳහා පොදු පදනමක් සපයයි. ගෝලීය න්‍යාය පත්‍රය සමාජ හා ආර්ථික සමානාත්මතාවය, මිනිසුන්ගේ අභිමානය සහ වටිනාකම සහ පාරිසරික සහ ප්‍රජා තිරසාරත්වය ප්‍රවර්ධනය කිරීම සඳහා ශක්තිමත් කැපවීමකි. COVID-19 වසංගත ගැටළු සහ මිනිසුන් මුහුණ දෙන ගැටළු වල ප්‍රතිවිපාක සම්බන්ධව, ආර්ථික අර්බුදය ලොව පුරා සිදුවෙමින් පවතින අතර සමාජීය, පාරිසරික අර්බුද මෙම 2022 සමාජ වැඩ දින තේමාවේ ප්‍රධාන කරුණු තුන වන අතර එය ගොඩනහයි. නව පාරිසරික සමාජ ලෝකය: කිසිවෙකු අත්හැර නොයෑම.

ලෝක සමාජ වැඩ දිනයේ IFSW තේමාවට අදාළව, ශ්‍රී ලංකාවේ පැවති webinar සාකච්ඡාව, ප්‍රධාන ක්ෂේත්‍ර කෙරෙහි අවධානය යොමු කළේ,

• පුද්ගලයන්, පවුල් සහ ප්‍රජාව සඳහා COVID 19 හි ප්‍රතිවිපාක
• වසංගත, ආර්ථික පසුබෑමක් සහ සමාජ සංකූලතා
• සමාජ පාරිසරික අර්බුදය රටේ වත්මන් පාරිසරික අර්බුදය හා සම්බන්ධයි.
• මෙම අර්බුදයට සමාජ සේවකයන් ප්‍රතිචාර දක්වන්නේ කෙසේද?
• ශ්‍රී ලංකාවේ ප්‍රතිචාරය වූයේ කිසිවකු අත් නොහැරීම පිළිබඳ ප්‍රතිචාරය වූයේ ගුණාත්මක ජීවිතයක් ළඟා කර ගැනීම සඳහා මෙම ජනතාව පරිවර්තනය කරන්නේ කෙසේදැයි විමසීමයි.

ඒ සම්බන්ධයෙන් ගත් කල, සමාජ වැඩ ප්‍රායෝගිකව පදනම් වූ වෘත්තියක් වන අතර සමාජ වෙනසක් සහ සංවර්ධනය, සමාජ ඒකාබද්ධතාවය සහ මිනිසුන්ගේ සවිබල ගැන්වීම සහ විමුක්තිය ප්‍රවර්ධනය කරන ශාස්ත්‍රීය විනයක් බැවින්, සම-ගොඩනැගීමක් තිබීම වැදගත් වේ. එය සමාජ සේවකයින්ට දැනටමත් ක්‍රියාත්මක වන ව්‍යුහාත්මක පද්ධති හඳුනා ගැනීමට උපකාරී වේ, ඔවුන් සමඟ එක්ව ගොඩනගා ගත යුත්තේ කවුරුන්ද සහ කාර්ය පරිසරයේ සිටින ක්‍රියාකාරීන් රටේ තත්වය සහ මිනිසුන්ගේ ජීවන තත්ත්වය වැඩිදියුණු කරන්නේ කෙසේද යන්න පිළිබඳව දැනුවත් කළ හැකි ක්‍රම. COVID-19 හි ප්‍රතිවිපාක සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ ප්‍රතිචාරය ආමන්ත්‍රණය කළ යුතු තීරණාත්මක කරුණක් විය. වත්මන් ආර්ථික අර්බුදයට විසඳුම් සෙවීමේදී සහ රටේ වඩාත්ම අවදානමට ලක්විය හැකි පුද්ගලයන්, පවුල් සහ ප්‍රජාවන් හඳුනා ගැනීම සඳහා සමාජ සේවකයින්ගේ කාර්යභාරය රටේ වත්මන් සමාජ-ආර්ථික තත්ත්වය සම්බන්ධයෙන් තීරණාත්මක වී ඇත. ශ්‍රී ලංකාව කිසිවකු අත් නොහැරීමට දක්වන ප්‍රතිචාරය සම්බන්ධයෙන් ගත් කල, වත්මන් සමාජ ආර්ථික අර්බුදයෙන් අහිමි වූ ජනතාව හඳුනාගෙන ඔවුන් ගොදුරු බවට පත්වීමේ සිට ගුණාත්මක භාවයෙන් යුත් සම්පූර්ණ ජීවිතයකින් දිවි ගලවා ගන්නන් බවට පරිවර්තනය කිරීම වැදගත් වේ. ගුණාත්මකව තිරසාර. ඒ සම්බන්ධයෙන්, සමාජ සේවකයන්ට පවතින ප්‍රතිපත්තිවල හිඩැස් හඳුනා ගැනීම සහ ප්‍රතිපත්ති සම්පාදකයින් දැනුවත් කිරීම හෝ බලපෑම් කිරීම වැදගත් වන අතර එමඟින් පුද්ගලයන්ගේ අයිතිවාසිකම් වඩාත් හොඳින් ආරක්ෂා වන අතර සෑම කෙනෙකුටම සමාන අයිතිවාසිකම් ඇත. මිනිසුන්ගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීමට අවශ්‍ය හිඩැස් හඳුනාගෙන නව ප්‍රතිපත්ති සැකසීමේදී පර්යේෂණ තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරන බැවින්, නව ප්‍රතිපත්ති ඇගයීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා සංවර්ධනය කළ යුතු සමාජ වැඩ පර්යේෂණ ක්ෂේත්‍ර මොනවාද යන්න තේරුම් ගැනීම ඉතා වැදගත් වේ.

ලෝක සමාජ වැඩ දිනය අප සියල්ලන්ම සම්බන්ධ වී ඇති අතර අපගේ අනාගතය සමාජීය සාධාරණ අනාගතයක් ගොඩනැගීමට සෑම පුද්ගලයෙකුගේම මැදිහත්වීම මත රඳා පවතී යන අදහස ශක්තිමත් කරයි. සමාජ සේවකයින්, හවුල්කාර සංවිධාන සහ අපගේ ලෝකය යහපත් ලෙස වෙනස් කිරීමට අනාගතය ගැන සැලකිලිමත් වන අය ඇතුළුව ඕනෑම කෙනෙකුට ලෝක සමාජ වැඩ දිනය සඳහා එක්විය හැකිය. පවතින ආර්ථික හා සමාජීය තත්ත්වයන් හමුවේ ජනතාව දිනෙන් දින අගාධයට වැටෙන තත්ත්වයක් නිර්මාණය වී තිබේ. එම තත්ත්වය තුළ පුද්ගලයන්ගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම සඳහා සමාජ සේවකයන්ට අත්වැල් බැඳගෙන අනෙකුත් පාර්ශ්ව සමඟ සහයෝගයෙන් ගොඩනැගීමට කාලය පැමිණ තිබේ. මේ සඳහා සියලු දෙනා අත්වැල් බැඳගෙන ඉදිරියට යා යුතුයි.




ලෝක සමාජ වැඩ දිනය - 2022

## 2022 මානව ජනාවාසවල සේවා සැපයීම පිළිබඳ වැඩසටහන

BSW 2017/2018 කාණ්ඩයේ තෙවන වසරේ සිසුන් විසින් පවත්වන ලද ග්‍රාමීය කඳවුර ඔක්තෝබර් 26 සිට නොවැම්බර් 05 දක්වා මීගමුවේදී සංවිධානය කරන ලදී. මීගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් ගම්මාන ආවරණය කරමින් මෙම වැඩසටහන ක්‍රියාත්මක විය. සිසුන් දින 10 ක් ක්ෂේත්‍ර පසුබිමේ නේවාසිකව සිටි අතර ප්‍රදේශයේ ජනතාව මුහුණ දෙන ගැටලු පෙන්වා දෙන ලදී. විශේෂයෙන්ම එම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සේවා සැපයීමේ දුර්වලතා, සේවා පිළිබඳ ජනතාව දැනුවත් කිරීම මෙන්ම නිලධාරීන්ගේ අවබෝධයේ ඌනතාවය පිළිබඳව ද මෙම මැදිහත්වීමේදී අවධාරණය කෙරිණි.





මීගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට සහ ජාතික ධීවර සහයෝගීතාවයට සිසුන්ට සහ පීඨ සාමාජිකයින්ට මානව ජනාවාසවල සේවා සැපයීම සාර්ථකව නිම කිරීම සඳහා උපරිම සහයෝගය ලබා දෙන ලදී.

# පුහුණු අංශය



**හැඳින්වීම**

2004 වර්ෂයේදී ස්ථාපනය කරනු ලැබූ පුහුණු අංශය, ජාතික සමාජ සංවර්ධන ආයතනයේ ආයතනික ව්‍යුහයේ ප්‍රධාන අංශ හතර අතුරින් එකක් වශයෙන් හැඳින්විය හැකිය. මෙම අංශය අධ්‍යක්ෂක (පුහුණු) යටතේ ක්‍රියාත්මක වේ. ජ්‍යෙෂ්ඨ පුහුණු කිරීමේ නිළධාරිනියන් දෙදෙනෙකු සහ දෙවන ශ්‍රේණියේ පුහුණු කිරීමේ නිළධාරීන් / නිළධාරිනියන් 08 දෙනෙකු මෙම අංශය තුළ සේවය කරනු ලබයි. මීට අමතරව කළමණාකාර සහකාර I එක් නිළධාරිනියක්, කළමණාකාර සහකාර II නිළධාරිනියන් දෙදෙනෙකු, කළමණාකාර සහකාර III එක් නිළධාරියෙකු සහ කාර්යාල කාර්ය සහායකවරියක මෙම අංශයට අනුයුක්තව සේවය කරයි.

2022 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට අනුව පුහුණු අංශයට පැවරී ඇති වගකීම් වනුයේ ,සමාජ සුභසාධන ක්‍රම සහ සමාජ සංවර්ධන වැඩසටහන් පිළිබඳ අධ්‍යයන කටයුතු පැවැත්වීම සහ ඒවා ප්‍රවර්ධනය කිරීමසමාජ වැඩ වලදී , තාක්ෂණය උපයෝගී කරගැනීම ඇතුලුව සමාජ වැඩ සහ සමාජ සංවර්ධන අධ්‍යාපන ක්‍රමයෙහි නිර්මාණාත්මක පරිවයක් ආරම්භ කිරීම සහ ප්‍රවර්ධනය කිරීම ,ඒ හා සමාන අරමුණු ඇති වෙනත් ආයතන සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම හා සමාජ සුභසාධනයෙහි නිරත නිළධරයන් සහ වෙනත් කාර්ය මණ්ඩල සඳහා පුහුණුවීමේ පාඨමාලා සහ ශික්ෂණ වැඩසටහන් පවත්වාගෙන යාමයි.

සංවර්ධනය හා සම්බන්ධ ක්ෂේත්‍රයන් හා බැඳුණු පුහුණු වැඩසටහන් මෙම අංශය මගින් ක්‍රියාත්මක කරනු ලබන අතර, වෙනත් රාජ්‍ය සහ රාජ්‍ය නොවන ආයතන සඳහා ද පුහුණු වැඩසටහන් සංවිධානය කරනු ලැබේ. එසේම පුහුණු අංශය පුහුණු කිරීමේ වැඩසටහන් ප්‍රාදේශීය පුහුණු මධ්‍යස්ථාන හා ඒ ආශ්‍රිත ප්‍රදේශ කේන්ද්‍ර කරගනිමින් සංවිධානය කරනු ලැබේ. පුහුණු අංශය මගින් සිදුකරනු ලබන අධ්‍යයනික කාර්යභාරයන් වඩාත් පුළුල් කරමින් මෙම වසර තුළදී උපදේශනය පිළිබඳ ශාස්ත්‍රවේදී (ගෞරව) උපාධි පාඨමාලාව ආරම්භ කිරීමේ අරමුණින් එහි මූලික කටයුතු සිදුකරමින් තිබේ.සමාජ සුභසාධනය සහ සමාජ සංවර්ධනය පිළිබඳ ඉල්ලුම මත පදනම් වූ අඛණ්ඩ වෘත්තීය සංවර්ධන (CPD) වැඩසටහන් පැවැත්වීම, පුහුණු අවශ්‍යතා හඳුනා ගැනීම සහ ප්‍රජා නායකයින්, ක්ෂේත්‍ර නිලධාරීන් සඳහා ප්‍රජා සංවර්ධනය පදනම් කරගත් ප්‍රජා පාදක පුහුණු වැඩසටහන් පැවැත්වීම හා සමාජ සුභසාධනය සහ සමාජ සංවර්ධන සම්බන්ධ අධ්‍යයන පාඨමාලා හඳුන්වා දීම සහ පැවැත්වීම පුහුණු අංශයේ අරමුණු වේ.

මෙම අංශය මගින් දීර්ඝ කාලීන සහ කෙටි කාලීන පුහුණු වැඩසටහන් සහ පාඨමාලාවන් මෙන්ම අනෙකුත් වෘත්තීය පාඨමාලා ද සංවිධානය කරනු ලැබේ. එලෙස සංවිධානය කරනු ලබන අධ්‍යයනික පාඨමාලා පහත

ආකාර වේ: උපදේශනය පිළිබඳ උසස් ඩිප්ලෝමා පාඨමාලාව, උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව, වෘද්ධ විද්‍යාව හා වැඩිහිටි රැකවරණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව ළමා ආරක්ෂණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව, සමාජ රැකවරණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව, ප්‍රජාපාදක විශෝධනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව, උපදේශනය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව, ළමා පාදක ප්‍රජා සංවර්ධනය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව, විශේෂ අධ්‍යාපනය ඉගැන්වීම පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව හා සමාජ වැඩ පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව

මෙම වැඩසටහන් සිංහල, ඉංග්‍රීසි හා දෙමළ යන මාධ්‍ය ත්‍රිත්ත්වයෙන් ම පැවැත්වීමේ හැකියාව පවතින අතර, අදාළ අධ්‍යයනික වැඩසටහනට පවතින ඉල්ලුමට අනුව භාෂා මාධ්‍යය තීරණය කෙරේ. පුහුණු අංශය වෙත ලැබෙන ඉල්ලුම මත පදනම්ව පහත ආකාරයේ කෙටිකාලීන පුහුණු වැඩසටහන් ද සංවිධානය කරනු ලැබේ.

සතුටු පවුල, උපදේශනය තුළ තක්සේරුකරණය, ආතතිය සහ මනෝවිද්‍යාත්මක උපදේශනය, අනපේක්ෂිත ගැබ්ගැනීම් සහ උපදේශනය, සමාජ භීතිකාව කළමනාකරණය කිරීම, උපදේශන මැදිහත්කරණ ක්‍රමශිල්ප, විශෝධන සේවා හා බැඳුනු උපදේශනය, මත්ද්‍රව්‍ය සඳහා උපදේශනය, මෘදු කුසලතා, සිද්ධි කළමනාකරණය සඳහා මූලික කුසලතා, පවුල් සමඟ වැඩ කිරීම සඳහා මූලික කුසලතා, කණ්ඩායම් සමඟ වැඩ කිරීම සඳහා මූලික කුසලතා, ප්‍රජාව සමඟ වැඩ කිරීම සඳහා මූලික කුසලතා, නායකත්වය, ගැටුම් කළමනාකරණය, සමාජ රැකවරණය, වැඩ පරිසරය සහ සාමාන්‍ය ජීවිතය සමබර කරගැනීම සඳහා ජීවන කුසලතා, ළමා සංවර්ධනය, විශේෂ අවශ්‍යතා සහිත දරුවන් වෙනුවෙන් සමාජ වැඩ මැදිහත්කරණය, ව්‍යාපෘති ලිවීම සඳහා වැඩමුලු, ප්‍රජා ව්‍යාපෘති කළමනාකරණය සඳහා වැඩමුලු, වැඩිහිටි රැකවරණය සඳහා උපදේශන මැදිහත්කරණය, දුගීබව අවම කිරීමේ ක්‍රමෝපාය සහ තිරසාර ජීවන සංවර්ධනය, ගැටුම් නිරාකරණය සඳහා ප්‍රජා සංවර්ධනය සහ ප්‍රජා මූල කළමනාකරණය හා ධාරිතාව ගොඩනැවීමේ පුහුණු වැඩසටහන්.

## 2022 වර්ෂයේදී පුහුණු අංශය මඟින් පැවැත්වූ අධ්‍යයන පාඨමාලා

### උපාධි පාඨමාලා

### 1. උපදේශනය පිළිබඳ ශාස්ත්‍රවේදී (ගෞරව) උපාධි පාඨමාලාව ආරම්භ කිරීම

**හැඳින්වීම**

රාජ්‍ය මෙන්ම රාජ්‍ය නොවන අංශයන්ගෙන් පවා උපදේශනය පිළිබඳ උපාධි පාඨමාලාවක් සඳහා ඉල්ලුම අප ආයතනය වෙත ලැබී ඇත. තවද ශ්‍රී ලංකාවේ සමාජ සංස්කෘතික පසුබිම තුළ විවිධාකාර ගැටලුවලට පුද්ගලයින් මුහුණපාන අතර, ඒවා විසඳා ගැනීමෙහිලා වෘත්තිය මැදිහත්කරණයක අවශ්‍යතාව මතුව ඇත. එම අධ්‍යයනික අවශ්‍යතාව තෘප්ත කිරීමෙහි අරමුණින් මෙම උපාධි පාඨමාලාව ආරම්භ කිරීම සඳහා ජාතික සමාජ සංවර්ධන ආයතනය මෙම වසර තුළදී කටයුතු ආරම්භ කර තිබේ.

බහු සංස්කෘතික ඉලක්ක කණ්ඩායම් සඳහා තනි පුද්ගල, කණ්ඩායම් සහ පවුල් උපදේශනය ඵලදායී ලෙස සැපයීම සඳහා දැනුම සහ කුසලතා ලබා දීම, විවිධ පුද්ගලයින් හා කණ්ඩායම් සමඟ අන්තර් සම්බන්ධතා ගොඩනගා ගැනීම තුළින් ස්වයං ආවර්ජනය කිරීමට හා ස්වයං ඇගයීමට මෙන්ම ඵලදායී සහායක් ලබාදීමට ඇති කැමැත්ත හා හැකියාව ප්‍රදර්ශනය කිරීම, උපදේශන භාවිතයේදී අදාළ තක්සේරුකරණ මෙවලම් යෙදීම, මානව සංවර්ධන අවධීන් හා සංවර්ධන අවශ්‍යතා හඳුනා ගැනීම, අන්තර්විෂයික කණ්ඩායම් සමඟ වැඩ කිරීමේදී වෘත්තීය කුසලතා සංවර්ධනය කිරීම, තනි පුද්ගල හා කණ්ඩායම් උපදේශනයෙහි ඵලදායී ශිල්පීය ක්‍රම සහ කුසලතා ප්‍රදර්ශනය කිරීම, මානසික අක්‍රමතා සහිත පුද්ගලයින් සමඟ මැදිහත්වීම සැලසුම් කිරීම, අවශ්‍යතා ඇති අය සඳහා මැදිහත්වීමේ ක්‍රියාවලියක් සංවර්ධනය කිරීම, උපදේශන අධ්‍යාපනයේ කාර්යභාරය හා වගකීම්, වටිනාකම්

හඳුනාගැනීම, උපදේශනයේදී පර්යේෂණ හා අධීක්ෂණය සිදු කිරීම හා අවදානම් කණ්ඩායම් හා ආන්තික ජනගහනය සඳහා වෘත්තීය උපදේශන සේවා සැපයීම මෙම උපාධි පාඨමාලාවේ අපේක්ෂිත අරමුණු වේ.

යෝජිත උපදේශනය පිළිබඳ ශාස්ත්‍රවේදී (ගෞරව) උපාධි පාඨමාලාවේ විෂය සමාලෝචන පළමු වාර්තාව ලැබී ඇති අතර, එහි සමාලෝචන වාර්තාව ද සකස් කොට උසස් අධ්‍යාපන අමාත්‍යාංශය වෙත මෙම වසරේදී භාර දෙන ලදි. මෙහි අවසාන සමාලෝචන වාර්තාව ජාතික සමාජ සංවර්ධන ආයතනය වෙත ලැබීමට නියමිතය. තවද උපදේශනය පිළිබඳ ශාස්ත්‍රවේදී (ගෞරව) උපාධි පාඨමාලාවේ සමාලෝචන වාර්තාව සකස් කිරීම සඳහා අධ්‍යයන සභාවේ උපදෙස් පරිදි තාක්ෂණික කමිටුවක් පත් කර ඇත.

## උසස් ඩිප්ලෝමා / ඩිප්ලෝමා පාඨමාලා

### 1. උපදේශනය පිළිබඳ උසස් ඩිප්ලෝමා පාඨමාලාව

**හැඳින්වීම**

උපදේශනය පිළිබඳ උසස් ඩිප්ලෝමා පාඨමාලාව, සති අන්ත අධ්‍යයන පාඨමාලාවක් වශයෙන් ජාතික සමාජ සංවර්ධන ආයතනයේ පුහුණු අංශය විසින් ක්‍රියාත්මක කරනු ලැබේ. මෙම උසස් ඩිප්ලෝමා පාඨමාලාව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ප්‍රතීකන නිර්දේශයන්ට අනුකූල වන පරිදි සිදුව මධ්‍යස්ථානය කේන්ද්‍ර කරගනිමින් සැලසුම්කොට පවත්වාගෙන යයි. උපදේශන ක්ෂේත්‍රය සඳහා ගුණාත්මක බවින් හෙබි වෘත්තිකයන් බිහිකිරීම, උපදේශන වෘත්තිකයන්ගේ උසස් වෘත්තීය කුසලතා පුළුල් කිරීම හා උපදේශන වෘත්තිකයාගේ මැදිහත්වීමේ හැකියාව සංවර්ධනය කිරීම මෙම පාඨමාලාවේ අරමුණු වේ. දැනුම, කුසලතා, ආකල්ප සහ මානසික සෞඛ්‍යය සහිත මනා පරිවයන්ගෙන් යුතු වෘත්තීය උපදේශකවරුන් බිහිකිරීම මෙහි ඉලක්කය වේ. මෙම පාඨමාලාව සිංහල මාධ්‍යයෙන් පැවැත්වෙන අතර, කාලය මාස 21කි. මෙම පාඨමාලාවෙහි මාස 03ක ක්ෂේත්‍ර පුහුණුවක් අන්තර්ගත වේ (සති අන්ත පාඨමාලාවකි). පාඨමාලාවේ සම්පූර්ණ සම්මාන ඒකක (credit) 32කි. දේශන පැය 420 ක් සහ ක්ෂේත්‍ර පුහුණුව පැය 200 කි. ඒ අනුව මුළු පැය ගණන පැය 620 කි. උපදේශනය පිළිබඳ උසස් ඩිප්ලෝමා පාඨමාලාව පාඨමාලා ඒකක 07 හා ක්ෂේත්‍ර පුහුණුව යන සංරචකයන්ගෙන් සමන්විත විය

**2022 වර්ෂය තුළ උසස් ඩිප්ලෝමා පාඨමාලාව පැවැත්වූ ස්ථාන**

ජාතික සමාජ සංවර්ධන ආයතනයේ සිදුව ප්‍රධාන මධ්‍යස්ථානය කේන්ද්‍ර කොට ගනිමින් 2022.01.16 වන දින මෙම පාඨමාලාව ආරම්භ කර ඇත. මේ වනවිට උසස් ඩිප්ලෝමා පාඨමාලාවේ සිසුන් පළමු සෙමෙස්තරයේ විභාග කටයුතු අවසන් කර ඇත.

### 2. උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව

**හැඳින්වීම**

ජාතික සමාජ සංවර්ධන ආයතනයේ පුහුණු අංශය විසින් උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව සති අන්ත අධ්‍යයන පාඨමාලාවක් වශයෙන් පවත්වාගෙන යනු ලැබේ. මෙම පාඨමාලාව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ප්‍රතීකන නිර්දේශයන්ට (SLQF) අනුකූලවන පරිදි සකස්කර ඇත. දැනුම, කුසලතා, ආකල්ප සහ මානසික සෞඛ්‍යය සහිත මනා පරිවයන්ගෙන් යුතු වෘත්තීය උපදේශකවරුන් බිහිකිරීම මෙහි ඉලක්කය වේ. උපදේශන

ක්ෂේත්‍රය සඳහා ගුණාත්මක බවින් හෙබි වෘත්තිකයන් බිහිකිරීම, උපදේශන වෘත්තිකයන්ගේ වෘත්තීය කුසලතා පුළුල් කිරීම හා උපදේශන වෘත්තිකයාගේ මැදිහත්වීමේ හැකියාව සංවර්ධනය කිරීම පාඨමාලාවේ අරමුණු වේ. සිංහල/දෙමළ/ඉංග්‍රීසි මාධ්‍ය ත්‍රිත්ත්වයෙන්ම පැවැත්වෙන මෙම පාඨමාලාවේ කාල සීමාව මාස 21 කි. මෙම පාඨමාලාවේ මාස 03ක ක්ෂේත්‍ර පුහුණුවක් අන්තර්ගත වේ. (සති අන්ත පාඨමාලාවකි). පාඨමාලාවේ සම්පූර්ණ සම්මාන ඒකක (credit) 30කි. දේශන පැය 405 ක් සහ ක්ෂේත්‍ර පුහුණුව පැය 150 කි. ඒ අනුව මුලු පැය ගණන පැය 555 කි. උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව විෂය එකක් 09ක්, ක්ෂේත්‍ර පුහුණුව හා අධ්‍යයන චාරිකාව යන අංගයන්ගෙන් සමන්විත වේ.

### 2022 වර්ෂය තුළ ඩිප්ලෝමා පාඨමාලාව පැවැත්වූ ස්ථාන

ජාතික සමාජ සංවර්ධන ආයතනය, සීදුව ප්‍රධාන මධ්‍යස්ථානය (සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍ය), ප්‍රජා පාදක විශෝධන නිළධාරීන් සඳහා - මාතර, කුරුණෑගල හා රත්නපුර, ප්‍රජා පාදක විශෝධන නිළධාරීන් සඳහා - කිලිනොච්චිය (දෙමළ මාධ්‍ය), තලාව ප්‍රාදේශීය මධ්‍යස්ථානය, අම්පාර ප්‍රාදේශීය මධ්‍යස්ථානය (සිංහල හා දෙමළ), රත්නපුර, කුරුණෑගල, රන්න ප්‍රාදේශිය මධ්‍යස්ථානය, නුවර (දෙමළ මාධ්‍ය), පුත්තලම (දෙමළ මාධ්‍ය), කිලිනොච්චිය (දෙමළ මාධ්‍ය), මඩකලපුව (දෙමළ මාධ්‍ය), යාපනය (දෙමළ මාධ්‍යය), ත්‍රිකුණාමලය (දෙමළ මාධ්‍ය), හැටන් (දෙමළ මාධ්‍ය) හා වවුනියාව (දෙමළ මාධ්‍ය)

2022 වර්ෂය තුළ ආරම්භකරන ලද උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවන්හි සම්මුඛ පරීක්ෂණ පවත්වා පළමු සෙමෙස්තර පංති කාමර දේශන පවත්වාගෙන යනු ලැබේ.

## සහතිකපත්‍ර පාඨමාලා

### 1. සමාජ වැඩ සහතික පත්‍ර පාඨමාලාව

**හැඳින්වීම**

සමාජ වැඩ පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව සමාජ වැඩ විෂය හා සම්බන්ධ වෘත්තිකයන් හා සමවෘත්තිකයන්ගේ සමාජ වැඩ කුසලතා සංවර්ධනය කිරීමේ අරමුණින් සකස් කර ඇත. මෙමගින් තනිපුද්ගල, කණ්ඩායම් සහ ප්‍රජාවන් සවිබල ගැන්වීම තුළින් ඔවුන්ගේ ආර්ථික හා සමාජ සංවර්ධනය ඇති කිරීම තවදුරටත් අරමුණු වේ. තවද ශ්‍රී ලංකාව තුළ ඵලදායී සමාජ සුභසාධන සේවාවන් ව්‍යාප්ත කිරීම ද මෙමගින් බලාපොරොත්තුවේ. දැනුම, කුසලතා හා ආකල්පයන්ගෙන් හෙබි සමාජ වැඩ වෘත්තිකයන් හා සම- වෘත්තිකයන් බිහිකිරීම මෙම පාඨමාලාවේ ඉලක්කය වේ. සමාජ වැඩ ක්ෂේත්‍රය සඳහා ගුණාත්මක බවින් හෙබි වෘත්තිකයන් හා සම - වෘත්තිකයන් බිහිකිරීම, බලගැන්වීමේ ප්‍රවේශය යොදාගනිමින් සමාජ සුභසාධන සේවාවන්හි නියුතු සේවා සපයන්නන්ගේ වෘත්තීය කුසලතා පුළුල් කිරීම හා තිරසාර සංවර්ධනය සඳහා තනි පුද්ගල, පවුල්, කණ්ඩායම් සහ ප්‍රජාවන්ගේ සමාජ සුභසාධන හා සමාජ සංවර්ධනය ගැටලු වලට මැදිහත්කරණය කිරීමේ හැකියාව මෙවැනි නිලධාරීන් හා සේවා සපයන්නන් තුළ සංවර්ධන කිරීම පාඨමාලා අරමුණු වේ. සිංහල හා දෙමළ මාධ්‍ය යෙන් පැවැත්වෙන මෙම පාඨමාලාවේ කාලය මාස 06 කි. මෙම පාඨමාලාවේ පැය 150 ක ක්ෂේත්‍ර පුහුණුවක් අන්තර්ගත වේ (මෙය සතියේ දිනවල සමෘද්ධි සංවර්ධන නිලධාරීන් සඳහා පැවැත්වේ).

පාඨමාලාවේ සම්පූර්ණ සම්මාන ඒකක (credit) 15 කි. දේශන පැය 180ක් සහ ක්ෂේත්‍ර පුහුණුව පැය 150 කි. ඒ අනුව මුලු පැය ගණන පැය 330 කි. සමාජ වැඩ පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව විෂය ඒකක 04 ක් හා ක්ෂේත්‍ර පුහුණුව යන අංගයන්ගෙන් සමන්විත වේ.

මෙම සහතික පත්‍ර පාඨමාලාව 2022.12.27 දින සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ ඉල්ලීම මත සමෘද්ධි සංවර්ධන නිලධාරීන් 600 දෙනෙකු වෙනුවෙන් මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ ආරම්භකරන ලදි. මෙම සහතික පත්‍ර පාඨමාලාව සිංහල හා දෙමළ මාධ්‍ය ඔස්සේ පැවැත්වේ.

## 2. ළමා කේන්ද්‍රීය ප්‍රජා සංවර්ධනය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව (සිංහල හා දෙමළ මාධ්‍ය)

**හැඳින්වීම**

මෙම සහතික පත්‍ර පාඨමාලාව ශ්‍රී ලංකාවේ ප්‍රජාපාදක ළමාරක්ෂණ පද්ධතිය සහ ළමා සුභසාධනය සංවර්ධන කිරීම සඳහා වෘත්තිකයන් හා සම-වෘත්තිකයන්ගේ කුසලතා සංවර්ධන අරමුණු කරගනිමින් නිර්මාණය කර ඇත. ප්‍රජා මට්ටම තුළ මනා පුහුණුව සඳහා දැනුම හා කුසලතා සංවර්ධනය, ළමා රක්ෂණය සහ සුභසාධනය පිළිබඳ වෘත්තිකයන් හා සම වෘත්තිකයින් බිහි කිරීම හා ප්‍රජා මට්ටම තුළ ළමා අයිතිවාසිකම් උල්ලංඝණය වන සමාජ ව්‍යුහය අභියෝගයට ලක් කිරීම හා ළමා අයිතිවාසිකම් මත පදනම්ව දිළිඳු කම තුරන්කිරීමේ මූලධර්ම ආමන්ත්‍රණය කිරීම පාඨමාලාවේ ඉලක්ක වේ.

ප්‍රජා පාදක ළමා ආරක්ෂණ ක්ෂේත්‍රය තුළ ගුණාත්මක බවින් හෙබි වෘත්තිකයන් / සමවෘත්තිකයන් බිහිකිරීම, ප්‍රජා පාදක ළමා සංවර්ධන මොඩලය භාවිතා කරමින් ළමා සුභ සාධන, ළමුන් රැකබලා ගැනීම හා ළමා ආරක්ෂණ සේවා සපයන්නන්ගේ වෘත්තීය කුසලතා පුළුල් කිරීම හා තිරසාර ප්‍රජා සංවර්ධනය සඳහා තනි පුද්ගල, පවුල්, කණ්ඩායම් සහ ප්‍රජාවන්ගේ ළමා ආරක්ෂණය පිළිබඳ ගැටලු වලට මැදිහත්කරණය කිරීමේ හැකියාව මෙවැනි නිලධාරීන් හා සේවා සපයන්නන් තුළ සංවර්ධන කිරීම පාඨමාලා අරමුණු වේ. සිංහල හා දෙමළ මාධ්‍ය යෙන් පැවැත්වෙන මෙම පාඨමාලාවේ කාල සීමාව මාස 06 සිට මාස 09 දක්වා වේ. තවද මාස 03 ක ක්ෂේත්‍ර පුහුණුවක් අන්තර්ගත වේ. මෙම පාඨමාලාවේ සම්පූර්ණ සම්මාන ඒකක (credit) 15 කි. දේශන පැය 180 ක් සහ ක්ෂේත්‍ර පුහුණුව පැය 150 කි. ඒ අනුව මුලු පැය ගණන පැය 330 කි. ළමා කේන්ද්‍රීය ප්‍රජා සංවර්ධනය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව විෂය ඒකක 04 ක් හා ක්ෂේත්‍ර පුහුණුව යන අංගයන්ගෙන් සමන්විත වේ.

මෙම සහතික පත්‍ර පාඨමාලාව සිංහල හා දෙමළ මාධ්‍යයන්ගෙන් පැවැත්වේ. සිංහල පාඨමාලාව ශුද්ධ වූ පවුලේ කන්‍යාරාම මූලස්ථානයේ ඉල්ලීම මත ළමුන් සමග කටයුතු කරන කන්‍යා සොයුරියන් 18 දෙනෙකු වෙනුවෙන් 2022.01.27 දින මාර්ගගත ක්‍රම වේදය ඔස්සේ ආරම්භකරන ලදී.

දෙමළ පාඨමාලාව සඳහා අයදුම්පත් යොමු කරන ලද සිසුන් 19 දෙනෙකු වෙනුවෙන් 2022.12.08 වන දින මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ ආරම්භ කරන ලදි. මෙම සහතික පත්‍ර පාඨමාලා දෙකම සතියේ දිනයන්හිදී පැවැත්වේ.

### 3. විශේෂ අධ්‍යාපනය ඉගැන්වීමේ ක්‍රමවේද පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව

**හැඳින්වීම**

මෙම සහතික පත්‍ර පාඨමාලාව සමාජ සේවා දෙපාර්තමේන්තුව විසින් කරනු ලැබූ ඉල්ලීමකට අනුව පැවැත්වූ අතර, සමාජ සේවා දෙපාර්තමේන්තුව යටතේ ඇති ආබාධ සහිත තරුණ තරුණියන් සඳහා වන වෘත්තීය පුහුණු ආයතන වල වෘත්තීය උපදේශකවරුන් පදනම් කරගනිමින් මෙම වැඩසටහන ක්‍රියාත්මක විය. මෙම සහතික පත්‍ර පාඨමාලාව සඳහා 2018 සහ 2019 වර්ෂ වල බඳවා ගත් වෘත්තීය උපදේශකවරුන් 11 දෙනෙකු සහභාගි විය. ඔවුන් ජුකී, මැහුම්, හස්ත කර්මාන්ත, පරිගණක, ගෘහස්ත, විදුලි කාර්මික, රූපලාවන්‍ය, මෝටර් කාර්මික, ඉලෙක්ට්‍රොනික් හා ගෘහස්ත විදුලි කාර්මික යන අංශයන්හි වෘත්තීය උපදේශකවරුන් ලෙස සේවය කරනු ලබයි. වෘත්තීය උපදේශකවරුන් තුළ ආබාධ සහිත තරුණ තරුණියන් සමඟ වැඩ කිරීමට අවශ්‍ය වන දැනුම, කුසලතා, ආකල්ප සහ මානසික සැකැස්ම නිර්මාණය කිරීම හා තම වෘත්තීය කාර්යභාරය වඩාත් ඵලදායී ලෙස ඉටු කිරීම මෙහි ඉලක්කය වේ. ගුණාත්මක බවින් පිරි වෘත්තීය උපදේශකවරුන් බිහිකිරීම හා වෘත්තීය උපදේශකවරුන් විසින් ඉගැන්වීමේදී එම කාර්යය වඩාත් ඵලදායී ලෙස ඉටු කිරීමට අවශ්‍ය පුහුණුව ලබා දීම පාඨමාලාවේ අරමුණු වේ. සිංහල මාධ්‍යයන් පැවැත් වූ මෙම පාඨමාලාවේ කාල සීමාව මාස 03කි. මේ පාඨමාලාව සාර්ථකව සම්පූර්ණ කරන ලද සිසුන් සඳහා සහතික පත්‍ර ප්‍රධානෝත්සවය ජාතික සමාජ සංවර්ධන ආයතනයේ 2022.08.23 දින පවත්වන ලදි.

**ඡායාරූප** - විශේෂ අධ්‍යාපනය ඉගැන්වීමේ ක්‍රමවේද පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාවේ සහතික පත්‍ර ප්‍රධානෝත්සවය





## පුහුණු අංශය මගින් 2022 වර්ෂයේ පැවැත් වූ අධ්‍යයන හා පුහුණු වැඩසටහන් අධ්‍යයනික වැඩසටහන්

### 1. උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවේ ක්ෂේත්‍ර අධ්‍යාපන අත්පොත සංශෝධනය කිරීම

**හැඳින්වීම**

උපදේශන විෂයය ක්ෂේත්‍රය අධ්‍යයනය කිරීමේදී උපදේශනය පිළිබඳ න්‍යායාත්මක දැනුම පමණක් නොව ඒ හා සමගාමී කුසලතා මෙන්ම ක්ෂේත්‍ර අධ්‍යාපනය ලබාදීම ද වැදගත් වේ. ඒ අරමුණින් උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව හදාරන සිසුන් පන්ති කාමර දේශන අවසානයේ ක්ෂේත්‍ර පුහුණුව සඳහා අනුයුක්ත කරනු ලැබේ. එහිදී උපදේශනය වැනි වෘත්තිය පාඨමාලාවල තත්ත්වය පවත්වාගෙන යාමේ අරමුණින් මෙම ක්ෂේත්‍ර අධ්‍යාපන

අත්පොත විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ප්‍රතිකන නිර්දේශයන්ට අනුකූල වන පරිදි (SLQF) අනුගත වෙමින් සංශෝධනය කරනු ලැබේ.

මේ දක්වා භාවිත කරනු ලැබූ ක්ෂේත්‍ර අධ්‍යයන අත්පොත සංශෝධනය කිරීම සඳහා 2021.05. 10 වන දින සායනික මනෝවිද්‍යාඥ රොෂාන් ධර්මපාල මෙනවියගේ ප්‍රධානත්වයෙන් එක් වැඩමුලුවක්ද, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ධනපාල විජේසිංහ හා මහාචාර්ය වසන්තා සුභසිංහ ගේ සහභාගීත්වයෙන් 2021.12.09 දින අනෙක් වැඩමුලුව ද පවත්වන ලදි. මේ සඳහා පුහුණු අංශයේ අධ්‍යක්ෂිකා ඇතුලු සියලුම ජ්‍යෙෂ්ඨ පුහුණු කිරීමේ / පුහුණු කිරීමේ නිළධාරීන් සහභාගි විය. උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව හදාරන සිසුන්ගේ ක්ෂේත්‍ර කටයුතු වඩාත් ගුණාත්මක අන්දමින් පවත්වාගෙන යාම මෙහි අරමුණ වේ. මේ වනවිට උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවේ ක්ෂේත්‍ර අධ්‍යයන අත්පොත සිංහල සහ දෙමළ මාධ්‍ය සඳහා පරිවර්තනය සිදු කරමින් පවතී.

## කෙටිකාලීන පුහුණු වැඩසටහන්

### 1. ගිරිඋල්ල අරක්කියාල මහා විද්‍යාලයේ උසස් පෙළ සිසුන් සඳහා සිදුකරන ලද වෘත්තීය මාර්ගෝපදේශනය පිළිබඳ කෙටි කාලීන පුහුණු වැඩසටහන

උසස් පෙළ සිසුන් ගේ අනාගත අභිවෘද්ධිය සඳහා යොමුවිය යුතු වෘත්තීන් පිළිබඳ දැනුවත්භාවයක් ලබාදීමේ අරමුණින් මෙම වැඩසටහන ක්‍රියාත්මක කරන ලදි. උසස් පෙළ අවසන් කළ සිසුන්ට යොමුවිය හැකි වෘත්තීය ක්ෂේත්‍රයන් හඳුන්වාදීම හා වෘත්තීය ක්ෂේත්‍රයන් තුළ අපේක්ෂිත කුසලතා පිළිබඳ පාසල් සිසුන්ගේ දැනුවත්භාවය වර්ධනය කිරීම මෙහි අරමුණ විය. උසස් පෙළ සිසුන් 37 දෙනෙකු මේ සඳහා සහභාගි විය. 2022.11.16 දින මෙම වැඩසටහන පැවැත්විණි. මේ දක්වා මෙම පාසලේ උසස් පෙළ සිසුන් අධ්‍යයනික කාර්යභාරයන්හී නියුතුවූ අතර, වෘත්තීය ජීවිතය පිළිබඳ වැඩි අවධානයක් යොමුකර නොතිබුනි. උසස් පෙළ සිසුන්ගේ ප්‍රතිචාර අනුව මෙම වැඩසටහන ඔවුන්ගේ අනාගත වෘත්තීය ජීවිතය සැලසුම් කිරීම සඳහා වඩාත් ඵලදායී වී ඇත.

### 2. ගිරිඋල්ල අරක්කියාල මහා විද්‍යාලයේ සාමාන්‍ය පෙළ සිසුන් සඳහා සිදුකරන ලද ක්ලමතථ කළමනාකරණය හා අභිප්‍රේරණය පිළිබඳ කෙටි කාලීන පුහුණු වැඩසටහන

සාමාන්‍ය පෙළ විභාගය වඩාත් තරහකාරී විභාගයක් වන බැවින් එමගින් ඇතිවන ක්ලමථකාරී තත්ත්වයන් කළමනාකරණය කළ යුතු ආකාරය පිළිබඳ දැනුවත් කිරීමත්, සාමාන්‍ය පෙළ විභාගය සඳහා සිසුන් අභිප්‍රේරණය කිරීමත් අරමුණු කරගනිමින් මෙම වැඩසටහන පවත්වන ලදි. සාමාන්‍ය පෙළ සිසුන් මුහුණපාන ක්ලමථකාරී තත්ත්වයන් හඳුනාගැනීමට, සාමාන්‍ය පෙළ සිසුන් සඳහා ක්ලමථ කළමනාකරණ ක්‍රමවේද හඳුන්වාදීමට හා සාමාන්‍ය පෙළ සිසුන් ගේ අධ්‍යයනික ධාරිතා වර්ධනය කිරීමට අරමුණු විය. සාමාන්‍ය පෙළ සිසුන් 82 දෙනෙකු මේ සඳහා සහභාගි විය. 2022.11.16 දින මෙය පැවැත්විණි.

මෙම පාසලේ සාමාන්‍ය පෙළ හදාරන සිසුන් බොහෝ පිරිසක් මානසික ගැටලුකාරී තත්ත්වයන්ගෙන් පෙලුනු අතර, ඒවා කළමනාකරණය කරගැනීමට මෙම වැඩසටහන වඩාත් ප්‍රයෝජනවත් වී ඇත. එසේම ඔවුන්ගේ අධ්‍යයනික කටයුතු සාර්ථක කරගැනීමටද මෙමගින් උනන්දුවක් ඇතිකර ඇත.

**ඡායාරූප -** සාමාන්‍ය පෙළ සිසුන් සඳහා සිදුකරන ලද ක්ලමථ කළමනාකරණය හා අභිප්‍රේරණය පිළිබඳ කෙටි කාලීන පුහුණු වැඩසටහනේ සිදුකරන ලද ක්‍රියාකාරකමක්





### 3. තලාව ප්‍රාදේශිය මධ්‍යස්ථානයෙහි පෙර පාසල් ගුරුවරුන් සඳහා පවත්වන ලද කෙටි කාලීන පුහුණු වැඩසටහන

ජාතික සමාජ සංවර්ධන ආයතනයට අයත් තලාව මධ්‍යස්ථානය පදනම් කරගෙන පවත්වනු ලබන කෙටි පුහුණු වැඩසටහන් යටතේ අනුරාධපුර පළාත් පාසල් වල සිටින උපදේශන ගුරුවරුන් සඳහා මෙම අධ්‍යාපන උපදේශනය පිළිබඳ කෙටිකාලීන පුහුණු වැඩසටහන සංවිධානය කරන ලදී. සියලුම සම්බන්ධිකරණ කටයුතු තලාව පුහුණු මධ්‍යස්ථානය මගින් සිදුකරනු ලැබීය. පාසලේ වැඩකටයුතු පවත්වාගෙන යාමේදී උපදේශන ගුරුවරුන්ගේ ගැටළු සාකච්ඡා කරමින් ඔවුන් සවිබලගැන්වීම අරමුණ විය. උපදේශන ගුරුවරුන් 35 දෙනෙකු මේ සඳහා සහභාගි විය. 2022.11.15 දින මෙම වැඩසටහන පැවැත්විණි.

පාසල් සිසුන් මුහුණපාන ගැටලු හඳුනාගැනීම සහ ඒවාට අවශ්‍ය උපදේශන මැදිහත්කරණය සිදුකිරීම සඳහා අවශ්‍ය මූලික දැනුම හා කුසලතා පුහුණුව ලබා ගැනීමට මෙම වැඩසටහන හේතුවී ඇත.

**ඡායාරූප -** උපදේශන ගුරුවරුන් පුහුණු කරන අවස්ථාවක්



### 4. මහවැලි අධිකාරියට අනුයුක්ත සමාජ සංවර්ධන නිලධාරීන් සඳහා පවත්වනු ලැබූ කෙටි පුහුණු වැඩසටහන

ජාතික සමාජ සංවර්ධන ආයතනයට අයත් තලාව මධ්‍යස්ථානය පදනම් කරගෙන පවත්වනු ලබන කෙටි පුහුණු වැඩසටහන් යටතේ තඹුත්තේගම මහවැලි අධිකාරියට අනුයුක්ත සමාජ සංවර්ධන නිලධාරීන් සඳහා තඹුත්තේගම මහවැලි කාර්යාලයේ ශ්‍රවණාගාරය දී වැඩසටහනක් සංවිධානය කරන ලදී. මෙම වැඩසටහන මගින් මහවැලි අධිකාරියේ සේවයේ නියුතු සමාජ සංවර්ධන නිලධාරීන් මුහුණපාන වෘත්තීය ගැටලු හඳුනාගැනීමටත් ඒවා කළමනාකරණය කිරීම සඳහා ඔවුන්ගේ ධාරිතා සංවර්ධනය කිරීමටත් අපේක්ෂා කරන ලදි. කාර්යාලය තුළ

සහ ප්‍රජාව සමග වැඩ කිරීමේදී මෙම නිලධාරීන් මුහුණ පාන ගැටලු හඳුනාගැනීම හා එම ගැටලු කළමනාකරණය කිරීම සඳහා නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධනය කිරීම මෙහි අරමුණු විය. 2022.11.16 දින පැවැත්වුණු මෙම වැඩසටහනට මහවැලි අධිකාරියට අනුයුක්ත සමාජ සංවර්ධන නිලධාරීන් 50 දෙනෙකු සහභාගි විය. මෙම නිලධාරීන් සමාජ සංවර්ධනය හා සම්බන්ධ සේවාවන්හී නියුතු වන අතර, එම කාර්යයන් වඩාත් ඵලදායී ලෙස ඉටුකිරීමට අවශ්‍ය දැනුම මෙම වැඩසටහන මගින් ලබා ගෙන ඇත.

## 5. ගල්ගමුව ගාමිණී මධ්‍ය මහා විද්‍යාලයේ ගුරුවරුන් සහ පාසල් දරුවන් සඳහා පවත්වනු ලැබූ කෙටි පුහුණු වැඩසටහන

තලාව ප්‍රාදේශිය පුහුණු මධ්‍යස්ථානය පදනම් කරගෙන පවත්වනු ලබන කෙටි පුහුණු වැඩසටහන් යටතේ ගල්ගමුව ගාමිණී මධ්‍ය මහා විද්‍යාලයේ ගුරුවරුන් සහ සිසුන් සඳහා පුහුණු වැඩසටහනක් සංවිධානය කරන ලදී. මෙම පුහුණු වැඩසටහන එම විද්‍යාලයේ ඉල්ලීම මත සිදු කරන ලදි. පාසලේ වැඩකටයුතු පවත්වාගෙන යාමේදී ගුරුවරුන්ගේ ගැටළු සාකච්ඡා කරමින් ඔවුන් සවිබලගැන්වීම හා පාසල සිසුන් මුහුණපාන අධ්‍යයනික ගැටලු හඳුනාගෙන ඒවා කළමනාකරණය කිරීමට පුහුණු කිරීම මෙහි අරමුණු විය. 2022.11.17 දින පැවැත්වූ මෙම වැඩසටහනට ගුරුවරුන් 45 දෙනෙකු හා සිසුන් 60 දෙනෙකු සහභාගි විය. මෙම පුහුණු වැඩසටහන අධ්‍යාපනික ගැටලු වලට මෙන්ම වෘත්තීය ගැටලු වලට සාර්ථකව මුහුණ දීමට අවශ්‍ය ශක්තීන් ගුරුවරුන් මෙන්ම සිසුන් තුළ ඇති කිරීමට හේතුවී ඇත.

**ඡායාරූප -** ගල්ගමුව පාසලේ ගුරුවරුන් හා සිසුන් සඳහා පවත්වන ලද කෙටිකාලීන පුහුණු වැඩසටහනේ අවස්ථාවක්





## 6. තලාව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිලධාරීන් සඳහා පවත්වන ලද කෙටි පුහුණු වැඩසටහන

තලාව ප්‍රාදේශිය පුහුණු මධ්‍යස්ථානය පදනම් කරගෙන පවත්වනු ලැබූ මෙම කෙටි පුහුණු වැඩසටහන තලාව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සේවයේ නියුතු සියළුම නිලධාරීන් වෙනුවෙන් සංවිධානය කරන ලදි. මෙම වැඩසටහන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ඉල්ලීම මත පවත්වන ලදි. වෘත්තීය සහ ප්‍රජා කටයුතු පදනම් කරගනිමින් මතුවන ක්ලමථකාරී ස්වභාවයන් කළමනාකරණය කිරීමට නිලධාරීන් පුහුණු කිරීම මෙහි අරමුණ විය. 2022.11.16 දින පැවැත් වූ මෙම වැඩසටහනට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සියලුම නිලධාරීන් මේ සඳහා සහභාගි විය. මෙම වැඩසටහන තලාව ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ නිලධාරීන් මුහුණපාන ක්ලමථකාරී අවස්ථාවන් කළමනාකරණය කර ගැනීමට අවශ්‍ය පුහුණුව ලබා දීමට සමත්වී ඇත.

**ඡායාරූප** - ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සේවයේ නියුතු නිලධාරීන් පුහුණුවන අවස්ථාවක්




## 7. මුලතිවු දිස්ත්‍රික්කයේ උසස් පෙළ හදාරන සිසුන් සඳහා වෘත්තීය මාර්ගෝපදේශනය පිළිබඳ කෙටිකාලීන පුහුණු වැඩසටහන

ජාතික සමාජ සංවර්ධන ආයතනයට අයත් කිලිනොච්චි ප්‍රාදේශිය පුහුණු මධ්‍යස්ථානය පදනම් කරගෙන පවත්වනු ලබන කෙටි පුහුණු වැඩසටහන් යටතේ මුලතිවු දිස්ත්‍රික්කයේ උසස් පෙළ හදාරන සිසුන් වෙනුවෙන් අනාගත වෘත්තීය තෝරාගැනීම් සිදුකිරීම සඳහා මග පෙන්වීමේ අරමුණින් මෙම වැඩසටහන සංවිධානය කරන ලදී. උසස් පෙළ අධ්‍යාපනය අවසන් කළ පසු සිසුන්ට යොමුවිය හැකි වෘත්තීය ක්ෂේත්‍රයන් හඳුන්වාදීම හා වෘත්තීය ක්ෂේත්‍රයන් තුළ අපේක්ෂිත කුසලතා පිළිබඳ පාසල් සිසුන්ගේ දැනුවත්භාවය වර්ධනය කිරීම මෙහි අරමුණු වේ. 2022.9.15 දින පැවැත්වූ මෙම වැඩසටහනට උසස් පෙළ අවසන් කල සිසුන් 100 දෙනෙකු සහභාගි විය. උසස් පෙළ අධ්‍යාපනය අවසන්වූ පසු ඉදිරි වෘත්තීන් තෝරාගැනීම සඳහා මෙම වැඩසටහන මගින් ලැබුණු දැනුම වැදගත්වේ.

**ඡායාරූප** - උසස් පෙළ හදාරන සිසුන් පුහුණුවන අවස්ථාවක්




## 8. යාපනය මානිප්පායි හින්දු විද්‍යාලයේ උසස් පෙළ සිසුන් සඳහා වෘත්තීය මාර්ගෝපදේශනය පිළිබඳ කෙටිකාලීන පුහුණු වැඩසටහන

කිලිනොච්චිය ප්‍රාදේශිය පුහුණු මධ්‍යස්ථානය කේන්ද්‍ර කරගනිමින් මෙම වැඩසටහන පවත්වන ලදි. යාපනය මානිප්පායි හින්දු විද්‍යාලයේ උසස් පෙළ හදාරන සිසුන්ගේ වෘත්තීය අවස්ථා පිළිබඳ දැනුවත්භාවය වර්ධනය කිරීමේ අරමුණින් මෙම වැඩසටහන පවත්වන ලදි. එසේම ඔවුන් තුළ උපදේශන විෂය කෙරෙහි දැනුවත් භාවයක් ඇති කිරීමද මෙමගින් අරමුණු කරන ලදි. උසස් පෙළ අධ්‍යාපනය අවසන් කළ පසු සිසුන්ට යොමුවිය හැකි වෘත්තීය ක්ෂේත්‍රයන් හඳුන්වාදීම, වෘත්තීය ක්ෂේත්‍රයන් තුළ අපේක්ෂිත කුසලතා පිළිබඳ පාසල් සිසුන්ගේ දැනුවත්භාවය වර්ධනය කිරීම හා උපදේශනය පිළිබඳ දැනුවත්භාවය පාසල් සිසුන් තුළ ඇති කිරීම අරමුණු විය. 2022.10.10 දින පැවැත්වූ මෙම වැඩසටහනට උසස් පෙළ හදාරන සිසුන් 50 දෙනෙකු සහභාගි විය. මෙම වැඩසටහන ඔවුන්ගේ අනාගත වෘත්තීය සංවර්ධනයට ඉවහල්වී ඇති අතර, උපදේශනය පිළිබඳ දැනුම දෛනික වැඩකටයුතු සාර්ථකව සිදුකරගැනීමට හේතුවී ඇත.

## 9. ආදර්ශ ගම්මාන වැඩසටහන (model village)

ආදර්ශ ගම්මාන සංකල්පය පදනම් කරගනිමින් මරුදනගර් ප්‍රදේශයේ ජීවත්වන වැඩිහිටියන්ගේ මානසික සෞඛ්‍ය ඉහල නැංවීමේ අරමුණින් මෙම වැඩසටහන මරුදනගර් ප්‍රදේශයේදී පවත්වන ලදි. කිලිනෙච්චි ප්‍රාදේශීය මධ්‍යස්ථානයේ මූලිකත්වයෙන් මෙම වැඩසටහන සංවිධානය කෙරුනි. මරුදනගර් ප්‍රදේශයේ ජීවත්වන වැඩිහිටියන්ගේ මානසික සෞඛ්‍ය ඉහල නැංවීම මෙහි අරමුණ විය. 2022.10.13 දින පැවැත් වූ මෙම වැඩසටහන මරුදනගර් ප්‍රදේශයේ ජීවත්වන වැඩිහිටියන් 50 දෙනෙකු වෙනුවෙන් පවත්වන ලදි. මෙම වැඩසටහනට සහභාගී වූ වැඩිහිටියන්ට ඔවුන් මුහුණපාන මානසික ගැටලු සාකච්ඡා කිරීමටත් ඒවා කළමනාකරණය කිරීමටත් මෙම වැඩසටහන හේතුවී ඇත.

ඡායාරූප - සුහුරු ගම්මාන වැඩසටහනට සහභාගීවූ වැඩිහිටියන්





## 10. පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන

කිලිනොච්චි ප්‍රාදේශිය පුහුණු මධ්‍යස්ථානය කේන්ද්‍ර කරගනිමින් මෙම වැඩසටහන සංවිධානය කල අතර, ජාතික සමාජ සංවර්ධන ආයතනයේ සීදුව ප්‍රධාන මධ්‍යස්ථානයේදී එය පවත්වන ලදි. රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතනයන්හී කළමනාකරුවන්ගේ වෘත්තීය සංවර්ධනය ඇති කිරීම මෙහි අරමුණ විය. මේ සඳහා රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතනයන්හී කළමනාකරුවන් 40 දෙනෙකු සහභාගි විය. මෙම පුහුණු වැඩසටහන සඳහා සහභාගි වූ කළමනාකරුවන්ට මෙම වැඩසටහන වෘත්තීය ජීවිතයේ සංවර්ධනයට හේතු වූ බව දක්වා ඇත.

ඡායාරූප - පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහනේ සමාරම්භක උත්සවය





## 11. ප්‍රජා පාදක සංවිධානයන්හි ධාරිතා සංවර්ධනය පිළිබඳ කෙටි කාලීන පුහුණු වැඩසටහන

ප්‍රජා පාදක සංවිධානයන් හි සාමාජිකයින් හා සමෘද්ධි ප්‍රතිලාභීන් පදනම් කරගනිමින් මෙම වැඩසටහන සංවිධානය කරන ලදි. කිලිනොච්චිය ප්‍රාදේශීය පුහුණු මධ්‍යස්ථානය කේන්ද්‍ර කරගනිමින් තුනුක්කායි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මෙම වැඩසටහන පවත්වන ලදි. ග්‍රාම නිළධාරී වසම් දෙකක් පදනම් කර ගනිමින් වැඩසටහන් දෙකක් මෙලෙස පවත්වනු ලැබීය. ප්‍රජා පාදක සංවිධානයන් හි නායකයින්ගේ හා සමෘද්ධි

ප්‍රතිලාභීන්ගේ ධාරිතා සංවර්ධනය කිරීම මෙහි අරමුණ විය. 14.02.2022 දින පැවැත් වූ මෙම වැඩසටහනට ප්‍රජා පාදක සංවිධානයන් හි සාමාජිකයින් හා සමෘද්ධි ප්‍රතිලාභීන් 55දෙනෙකු සහභාගි විය.

**12. ජීවනෝපාය සංවර්ධනය සඳහා සමාජවැඩ කුසලතා පිළිබඳ කෙටි කාලීන පුහුණු වැඩසටහන**

උතුරු පළාත තුළ සමාජ වැඩකරුවන්ගේ සමාජ වැඩ කුසලතා සංවර්ධනය කිරීමේ අරමුණින් මෙම වැඩසටහන කිලිනොච්චිය ප්‍රාදේශීය පුහුණු මධ්‍යස්ථානය කේන්ද්‍රකර ගනිමින් පවත්වන ලදි. උතුරු පළාත් සමාජවැඩකරුවන්ගේ සමාජ වැඩ කුසලතා සංවර්ධනය කිරීම මෙහි අරමුණ විය. 14.02.2022 දින පැවැත් වූ මෙම වැඩසටහනට උතුරු පළාත් සමාජ වැඩකරුවන් 55 දෙනෙකු සහභාගි විය. සමාජ වැඩ කරුවන්ගේ වෘත්තීය සංවර්ධනය සඳහා මෙම වැඩසටහන ඵලදායී වී ඇත.

ඡායාරූප - උතුරු පළාත් සමාජ වැඩකරුවන් පුහුණු වන අවස්ථාවක





**13. සමන්තුරේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ප්‍රජා පාදක සංවිධානයන්හී ධාරිතා සංවර්ධනය පිළිබඳ කෙටි කාලීන පුහුණු වැඩසටහන**

කිලිනොච්චිය ප්‍රාදේශීය පුහුණු මධ්‍යස්ථානය පදනම් කරගනිමින් මෙම වැඩසටහන සමෘද්ධිලාභීන් වෙනුවෙන් පවත්වන ලදි. මෙමගින් ඔවුන්ගේ ධාරිතා සංවර්ධනය කිරීම අරමුණු කරන ලදි. සමෘද්ධි ප්‍රතිලාභින්ගේ ධාරිතා සංවර්ධනය කිරීම මෙහි අරමුණ විය. 29.03.2022 දින පැවැත් වූ මෙම වැඩසටහනට සමෘද්ධි ප්‍රතිලාභීන් 66 දෙනෙකු සහභාගි විය. මෙම වැඩසටහන ඔවුන්ගේ ජීවන තත්ත්වය ඉහළ නංවා ගැනීම සඳහා නව මාවත් පිළිබඳ සිතීමට හේතු වී ඇත.

**14. කල්මුනේ අධ්‍යාපන කලාපයේ පෙර පාසල් ගුරුවරුන් සහ පාසල් ගුරුවරුන් සඳහා පවත්වන ලද උපදේශන කුසලතා පිළිබඳ පුහුණු වැඩසටහන**

කිලිනොච්චිය ප්‍රාදේශීය පුහුණු මධ්‍යස්ථානය පදනම් කර ගනිමින් මෙම කෙටි කාලීන පුහුණු වැඩසටහන පවත්වන ලද අතර, එය පෙර පාසල් ගුරුවරුන් සහ පාසල් ගුරුවරුන් කේන්ද්‍ර කර ගනිමින් සංවිධානය කරන ලදි. පාසල් ගුරුවරුන් සහ පාසල් ගුරුවරුන්ගේ උපදේශන කුසලතා සංවර්ධනය කිරීම මෙහි අරමුණ විය. 2022.03. 29 සහ 30 දෙදින පුරා පැවති මෙම වැඩසටහනට ප්‍රාථමික පාසල් ගුරුවරුන් සහ උපදේශන ගුරුවරුන් 60 දෙනෙකු සහභාගි විය. මෙම වැඩසටහන ප්‍රාථමික පාසල් ගුරුවරුන්ට උපදේශන ක්ෂේත්‍රය කෙරෙහි උනන්දුවක් ඇති කිරීමට හේතු වී ඇති අතර ම, උපදේශන ගුරුවරුන්ගේ උපදේශන කුසලතා සංවර්ධනය කිරීමට හේතු වී ඇත.

### 15. සිසුන් අධීක්ෂණය පිළිබඳ සිදු කරන ලද පුහුණු වැඩසටහන

ජාතික සමාජ සංවර්ධන ආයතනයේ පුහුණු අංශය මගින් පවත්වාගෙන යනු ලබන අධ්‍යයනික පාඨමාලාවල ක්ෂේත්‍ර අධීක්ෂණ කටයුතුවල ගුණාත්මකභාවය ඉහල නැංවීමේ අරමුනින් යැස්මින් පෙරේරා මහත්මියගේ සම්පත්දායකත්වයෙන් මෙම වැඩසටහන පුහුණු අංශයේ පුහුණු නිලධාරීන් වෙනුවෙන් පවත්වන ලදි. පුහුණු අංශය මගින් පවත්වනු ලබන අධ්‍යයනික පාඨමාලාවල ක්ෂේත්‍ර පුහුණුව වඩාත් විධිමත් කිරීම හා ක්ෂේත්‍ර පුහුණුවේ නියුතු අධ්‍යයනික කාර්ය මණ්ඩලය මුහුණපාන ක්ෂේත්‍ර පුහුණුව හා සම්බන්ධ ගැටලු අවම කිරීම මෙම වැඩසටහනේ අරමුණු විය. 30.03.2022 දින පැවති මෙම වැඩසටහනට ක්ෂේත්‍ර අධීක්ෂණයේ නියුතු අධ්‍යනික කාර්යය මණ්ඩලයේ නිලධාරීන් 10 දෙනෙකු සහභාගි විය.

### 16. උතුරු පළාතේ ළමා රැකවරණ කළමනාකරුවන් සඳහා කෙටිකාලීන පුහුණු වැඩසටහන

මෙම පුහුණු වැඩසටහන කිලිනොච්චි ප්‍රාදේශීය පුහුණු මධ්‍යස්ථානය කේන්ද්‍ර කරගනිමින් මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ පවත්වන ලදි. පරිවාස හා ළමාරක්ෂණ දෙපාර්තමේන්තුවේ ඉල්ලීමක් මත මෙම වැඩසටහන පවත්වන ලදි. ළමා රැකවරණ කළමනාකරුවන් තුළ මානව වර්ධනය හා සංවර්ධනය පිළිබඳ දැනුවත්භාවය වර්ධනය කිරීම මගින් ළමා රැකවරණය තහවුරු කිරීම මෙහි අරමුණ විය. 30.03.2022 දින පැවති වැඩසටහනට ළමා රැකවරණ කළමනාකරුවන් 66 දෙනෙකු සහභාගි විය. සහභාගීවූවන්ගේ ප්‍රතිචාර අනුව මෙම වැඩසටහන ඔවුන්ගේ ප්‍රායෝගික භාවිතයට අවශ්‍ය න්‍යායාත්මක දැනුම සැපයීමට හේතු වී ඇත.

### 17. මරුතංගා වැඩිහිටි සංගමයේ ප්‍රීතිමත් පවුල් ජීවිතයක් සඳහා කෙටිකාලීන පුහුණු වැඩසටහන

මෙම පුහුණු වැඩසටහන කිලිනොච්චි ප්‍රාදේශීය පුහුණු මධ්‍යස්ථානය කේන්ද්‍ර කරගනිමින් වැඩිහිටියන්ගේ මානසික සෞඛ්‍ය ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් පවත්වන ලදි. මරුතංගා වැඩිහිටි සංගමයේ වැඩිහිටියන්ගේ මානසික සෞඛ්‍ය ප්‍රවර්ධනය කිරීම මෙහි අරමුණ විය. 2022.06.23 දින පැවති මෙම වැඩසටහනට මරුතංගා වැඩිහිටි සංගමයේ වැඩිහිටියන් 40 දෙනෙකු සහභාගි විය. වියපත්වීමත් සමග ඇතිවන කායික, මානසික මෙන්ම සමාජීය වෙනස්කම් සඳහා සාර්ථකව මුහුණ දීමටත් ප්‍රීතිමත් ජීවිතයක් ඇති කරගැනීමටත් මෙම වැඩසටහන හේතු වී ඇත.

### 18. පෙරපාසල් ගුරුවරන් සඳහා ක්ලමථ කළමනාකරණය පිළිබඳ කෙටිකාලීන පුහුණු වැඩසටහන

ක්ලමත කළමනාකරණය පිළිබඳ කෙටි කාලීන පුහුණු වැඩසටහන දින පහක් මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ පෙරපාසල් ගුරුවරුන් වෙනුවෙන් කිලිනොච්චිය ප්‍රාදේශීය මධ්‍යස්ථානය කේන්ද්‍ර කරගනිමින් පවත්වන ලදි. පෙර පාසල් ගුරුවරුන්ගේ ක්ලමථ කළමනාකරණය මගින් කාර්ය සාධනය වර්ධනය කිරීම මෙහි අරමුණ විය. 2022.08. 15, 16, 17, 18 සහ 19 දිනයන් හිදී පැවැත් වූ මෙම වැඩසටහනට පෙර පාසල් ගුරුවරුන් 110 දෙනෙකු සහභාගි විය. පෙර පාසල් ගුරුවරුන් වෙනුවෙන් පවත්වන ලද මෙම වැඩසටහන ඔවුන්ට ඔවුන්ගේ පෞද්ගලික මෙන්ම වෘත්තීය ජීවිතය දෙස ධනාත්මක ලෙස දැකීමට හේතු වී ඇත.

## 19. කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශයේ උපදේශන නිලධාරීන් වෙනුවෙන් පවත්වන ලද ප්‍රජා පුහුණුව සඳහා සමාජ වැඩ මැදිහත්කරණය පිළිබඳ කෙටිකාලීන පුහුණු වැඩසටහන

උපදේශන සේවා සැපයීමේදී වඩාත් ඵලදායී සේවාවක් සැපයීම සඳහා සමාජ වැඩ මැදිහත්කරණ ක්‍රමවේද පිළිබඳ අවබෝධය වෘත්තීය උපදේශකවරුන් තුළ ඇති කිරීමේ අරමුණින් මෙම වැඩසටහන සති දෙකක කාලයක් තුළදී මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ පවත්වන ලදි. උපදේශන නිලධාරීන්ගේ වෘත්තීය සංවර්ධනය ඇතිකිරීම හා උපදේශන පුහුණුව තුළ සමාජ වැඩ භාවිතය ප්‍රවර්ධනය කිරීම මෙහි අරමුණු විය. 14.10. 2022 සිට 27.10.2022 දක්වා පැවැත්වූ මෙම වැඩසටහනට කාන්තා ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශයේ උපදේශන නිලධාරීන් 210 දෙනෙකු සහභාගි විය. සමාජ වැඩ පිළිබඳ දැනුම උපදේශක වරුන්ගේ වෘත්තීය සංවර්ධනය සඳහා වැදගත්වී ඇත.

**ඡායාරූප -** උපදේශන නිලධාරීන් වෙනුවෙන් පවත්වන ලද ප්‍රජා පුහුණුව සඳහා සමාජ වැඩ මැදිහත්කරණය පිළිබඳ කෙටිකාලීන පුහුණු වැඩසටහනේ සමාරම්භක උත්සවය




## 20. නායකත්වය හා වෘත්තීය මාර්ගෝපදේශනය පිළිබඳ පුහුණු වැඩසටහන

ජාතික සමාජ සංවර්ධන ආයතනයේ රන්න ප්‍රාදේශිය පුහුණු මධ්‍යස්ථානය විසින් 2022 වර්ෂය සඳහා වූ ක්‍රියාකාරී සැලැස්මට අනුව සිදුකළ යුතු වැඩසටහන් අතුරින් එක් වැඩසහනක් ලෙස මෙම වැඩසටහන සෞභාග්‍ය සතියට සමගාමීව  රන්න ප්‍රදේශයේ උසස් පෙළ සමත් සිසුන් ඉලක්කකොට ගෙන පවත්වන ලදි. නායකත්වය හඳුනාගැනීම සහ උසස් අධ්‍යාපන වෘත්තීය මාර්ගෝපදේශනය යන මාතෘකා මෙම වැඩසටහනේදී මූලික වශයෙන් සාකච්ඡාවට භාජනය කරන ලදි. උසස් පෙළ සමත් සිසුන්ගේ නායකත්ව කුසලතා සංවර්ධනය කිරීම හා උසස් පෙළ සමත් සිසුන්ට වෘත්තීය මාර්ගෝපදේශනය පිළිබඳ දැනුවත්භාවය ඇති කිරීම මෙහි අරමුණ විය. 2022.03.21 දින පැවැත් වූ මෙම වැඩසටහනට රන්න ප්‍රදේශයේ උසස් පෙළ සමත් සිසුන් 15 දෙනෙකු සහභාගි විය.

මෙම වැඩසටහන පිළිබඳ යහපත් ප්‍රතිචාර ලැබුණු අතර ඔවුනට සුදුසු වෘත්තියකට හෝ උසස් අධ්‍යාපනය කරා යොමු වීමට අවශ්‍ය උපදේශ මෙම සැසිය තුළින් ලැබුණු බවත් තවදුරටත් මෙවැනි වැඩසටහන් පුදේශයේ තරුණ ප්‍රජාව ඉලක්ක කොට ගෙන අප ආයතනය මඟින් සංවිධානය කිරීම ඔවුන්ගේ යෝජනාත්මක අදහස විය.

**ඡායාරූප -** උසස් පෙළ සිසුන් වෙනුවෙන් පවත්වන ලද වෘත්තීය මාර්ගෝපදේශනය පිළිබඳ පුහුණු වැඩසටහනෙහි අවස්ථා කිහිපයක්




## 21. වැඩිහිටියන්ගේ මානසික සෞඛ්‍ය පිළිබඳ පුහුණු වැඩසටහන

2022 සෞභාග්‍ය සතියට සමගාමීව රන්න ප්‍රදේශයේ වැඩිහිටි සමිතියක වැඩිහිටියන් 25 දෙනෙකු ඉලක්කකොට ගෙන පවත්වන ලදි. වැඩිහිටියන් මුහුණ දෙන ගැටළු හඳුනාගැනීම හා වැඩිහිටියන්ගේ මානසික යහපැවැත්ම දියුණු කිරීම මෙහි අරමුණු විය. 2022.03.30 දින රන්න ප්‍රදේශයේ වැඩිහිටි සමිතියක සාමාජිකයන් 25 දෙනෙකු මේ සඳහා සහභාගි විය. වැඩිහිටියන්ට තමන්ගේ මානසික යහ පැවැත්ම සමබරව පවත්වා ගැනීමට අවශ්‍ය උපදේශය මෙම සැසිය තුළින් ලැබුණු බවත් තවදුරටත් මෙවැනි වැඩසටහන් පුදේශයේ වැඩිහිටි ප්‍රජාව ඉලක්ක කොට ගෙන අප ආයතනය මඟින් සංවිධානය කිරීම ඔවුන්ගේ යෝජනාත්මක අදහස විය.

**ඡායාරූප -** වැඩිහිටියන්ගේ මානසික සෞඛ්‍ය පිළිබඳ පුහුණු වැඩසටහනෙහි අවස්ථා කිහිපයක්




## 22. සමෘද්ධි ප්‍රජාමූල නායකයින්ගේ ධාරිතා සංවර්ධනය පිළිබඳ පුහුණු වැඩසටහන

රන්න ප්‍රදේශය කේන්ද්‍ර කරගනිමින් ධාරිතා සංවර්ධන පුහුණු වැඩසටහන සමෘද්ධි ප්‍රජාමූල නායකයින් සඳහා පවත්වන ලදි. ප්‍රජාව සමඟ වැඩකිරීමේදී අවශ්‍ය නායකත්ව කුසලතා පුහුණු කිරීම මෙමගින් අරමුණු විය. 2022.06.22 දින සමෘද්ධි ප්‍රජාමූල නායකයින් 30 දෙනෙකු වෙනුවෙන් මෙම වැඩසටහන පවත්වන ලදි.

මෙම වැඩසටහන පිළිබඳ යහපත් ප්‍රතිචාර ලැබුණු අතර ඔවුනට තම කණ්ඩායම් සමඟ වැඩකිරීමේදී තමන් අතින් සිදුවිය හැකි අඩුපාඩු මගහරවා ගනිමින් නායකයා සතු භූමිකාව පිළිබඳ දැනුම මෙම සැසිය තුළින් ලැබුණු බවත් තවදුරටත් මෙවැනි වැඩසටහන් පුදේශයේ අනෙකුත් ප්‍රජාමූල කණ්ඩායම් ඉලක්ක කොට ගෙන අප ආයතනය මඟින් සංවිධානය කිරීම ඔවුන්ගේ යෝජනාත්මක අදහස විය.

**ඡායාරූප -** සමෘද්ධි ප්‍රජාමූල නායකයින් පුහුණුවන අවස්ථාවක්




## 23. ව්‍යාපෘති කළමනාකරණය හා යෝජනා පත්‍ර සැකසීම පිළිබඳ පුහුණු වැඩසටහන

මෙම වැඩසටහන සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ නිළධාරින් උදෙසා පවත්වන ලදි. ව්‍යාපෘති කළමනාකරණය හදුනාගැනීම හා ව්‍යාපෘති යෝජනා පත්‍ර සැකසීම පුහුණු කිරීම මෙහි අරමුණු විය. 2022.06.23 දින පැවැත් වූ මෙම වැඩසටහනට සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ නිළධාරින් 28 දෙනෙකු සහභාගි විය. මෙම වැඩසටහන පිළිබඳ යහපත් ප්‍රතිචාර ලැබුණු අතර ඔවුනට තම කණ්ඩායම් සමඟ වැඩකිරීමේදී තමන් අතින් සිදුවිය හැකි අඩුපාඩු මගහරවා ගනිමින් නායකයා සතු භූමිකාව පිළිබඳ දැනුම මෙම සැසිය තුලින් ලැබුණු බවත් තවදුරටත් මෙවැනි වැඩසටහන් විවිධ මාතෘකා ඔස්සේ අප ආයතනය මඟින් සංවිධානය කිරීම ඔවුන්ගේ යෝජනාත්මක අදහස විය.

**ඡායාරූප -** ව්‍යාපෘති කළමනාකරණය හා යෝජනා පත්‍ර සැකසීම පිළිබඳ පුහුණු වැඩසටහනෙහි අවස්ථා කිහිපයක්




## 24. නායකත්වය හා ආකල්ප සංවර්ධනය පිළිබඳ පුහුණු වැඩසටහන

මෙම පුහුණු වැඩසටහන රන්න ප්‍රදේශයේ වාඩියගොඩ කණිටු විදුහලේ ශිෂ්‍ය නායකයින් ඉලක්කකොට ගෙන පවත්වන ලදි. ශිෂ්‍ය නායකයින් තුළ නායකත්ව කුසලතා හා ආකල්ප සංවර්ධනය මෙහි අරමුණ විය. 2022.09.09 දින පැවැත්වූ මෙම වැඩසටහනට රන්න ප්‍රදේශයේ වාඩියගොඩ කණිටු විදුහලේ ශිෂ්‍ය නායකයින් 25 දෙනෙකු සහභාගි විය.

මෙම වැඩසටහන පිළිබඳ යහපත් ප්‍රතිචාර ලැබුණු අතර ඔවුනට ශිෂ්‍ය නායකයෙකු පාසල තුල සිදුකරන කර්තව්‍ය වඩා හොඳින් සිදුකිරීම සඳහා අවශ්‍ය දැනුම හා කුසලතා උපදේශය මෙම සැසිය තුලින් ලැබුණු බවත් තවදුරටත් මෙවැනි වැඩසටහන් පුදේශයේ පාසල් ප්‍රජාව ඉලක්ක කොට ගෙන අප ආයතනය මඟින් සංවිධානය කිරීම ඔවුන්ගේ යෝජනාත්මක අදහස විය.

**ඡායාරූප -** වාඩියගොඩ කණිටු විදුහලේ ශිෂ්‍ය නායකයින් පුහුණුවන අවස්ථා කිහිපයක්




## 25. නායකත්ව කුසලතා සංවර්ධනය පිළිබඳ පුහුණු වැඩසටහන

මෙම වැඩසටහන අගුණුකොළපැලැස්ස ප්‍රදේශයේ තරුණ තරුණයින් ඉලක්කකොට ගෙන පවත්වන ලදි. තරුණයින් තුළ ස්වඅභිමානය හා ආකල්ප සංවර්ධනය මෙහි අරමුණ විය. 2022.09.16 දින පැවැත් වූ මෙම වැඩසටහනට අගුණුකොළපැලැස්ස ප්‍රදේශයේ තරුණ තරුණියන් 21 දෙනෙකු සහභාගි විය.

මෙම වැඩසටහන පිළිබඳ යහපත් ප්‍රතිචාර ලැබුණු අතර ඔවුනට නායකත්ව ගුණාංග තමා තුළ ඉස්මතු කරගැනීම සඳහා අවශ්‍ය දැනුම හා කුසලතා මෙම සැසිය තුළින් ලැබුණු බවත් තවදුරටත් මෙවැනි වැඩසටහන් පුදේශයේ තරුණ ප්‍රජාව ඉලක්ක කොට ගෙන අප ආයතනය මඟින් සංවිධානය කිරීම ඔවුන්ගේ යෝජනාත්මක අදහස විය.

**ඡායාරූප -** අගුණුකොළපැලැස්ස ප්‍රදේශයේ තරුණ තරුණියන් පුහුණුවන අවස්ථා කිහිපයක්



## 26. සමෘද්ධි ප්‍රජාමූල නායකයින් තිරසර ජීවිකා වෘත්තිය සංවර්ධනය සංවර්ධනය පිළිබඳ පුහුණු වැඩසටහන

මෙම වැඩසටහන ප්‍රදේශයේ අඩු ආදායම්ලාභී පවුල් වල සාමාජිකයන් හා සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ නිළධාරින් ඉලක්කකොට ගෙන පවත්වන ලදි. තිරසාර ජීවිකා වෘත්තීය සංවර්ධනය පිළිබඳ ප්‍රජාමූල නායකයින් සහ සමෘද්ධි සංවර්ධන නිළධාරීන් දැනුවත් කිරීම මෙහි අරමුණ විය. 2022.11.10 දින පැවැත් වූ මෙම වැඩසටහනට ප්‍රජාමූල නායකයින් හා සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ නිළධාරින් 28 දෙනෙකු සහභාගි විය.

මෙම වැඩසටහන පිළිබඳ යහපත් ප්‍රතිචාර ලැබුණු අතර ඔවුනට තම ආදායම නිසි ලෙස කළමනාකරණය කොට ගැනීමේ උපදේශය මෙම සැසිය තුලින් ලැබුණු බවත් තවදුරටත් මෙවැනි වැඩසටහන් පුදේශයේ අඩු ආදායම්ලාභී පවුල් ප්‍රජාව ඉලක්ක කොට ගෙන අප ආයතනය මඟින් සංවිධානය කිරීම ඔවුන්ගේ යෝජනාත්මක අදහස විය.

**ඡායාරූප -** සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ නිළධාරීන් පුහුණු වන අතරතුර




## 27. සියදිවි නසාගැනීම් අවමකිරීම පිළිබඳ තරුණ තරුණියන්ගේ කුසලතා සංවර්ධන වැඩසටහන

වර්තමාන සමාජ ආර්ථික ගැටළුන් හමුවේ මිනිසුන් මුහුණ දෙන ගැටළු සඳහා මුහුණ දීමට ශක්තියක් නොවීම හා දරාගැනීමේ කුසලතාවයන්ගේ පවත්නා දුර්වලතා හේතුවෙන් සියදිවි නසාගැනීම් වර්ධනය වන තත්ත්වයක් සමස්ත රටපුරාම දැකගත හැකි වූ අතර ම, අම්පාර දිස්ත්‍රික්කයේ ද තරුණ ළමුන් හා පාසල් සිසුන් අතර සියදිවි නසාගැනීම් වාර්තාවන ලදි. මේ හේතුවෙන් පුද්ගලයින් ගේ දරාගැනීමේ කුසලතා වර්ධනය කිරීම හා ගැටළුකාරී අවස්ථාවන්හී දී පවත්නා විවිධාකාර සේවාවන් ලබාගන්නා ආකාරය පිළිබඳව දැනුවත් කිරීමත්, සියදිවි නසාගැනීමේ චේතනාවෙන්ගෙන් යුක්ත පුද්ගලයන් සඳහා මැදිහත්වීමේ ක්‍රමශිල්පත් මෙම වැඩසටහන මගින් හඳුන්වා දෙන ලදි. මනෝවෛද්‍ය නිළධාරීන්, සමාජවැඩ නිළධාරියෙකු හා ප්‍රාදේශිය සෞඛ්‍යසේවා අධ්‍යක්ෂතුමා මෙම වැඩසටහන සඳහා සම්පත්දායකත්වය සපයන ලදි. අම්පාර දිස්ත්‍රිකකයේ ද තරුණ ළමුන් හා පාසල් සිසුන් අතර සියදිවිනසැගැනීම් අවම කිරීම මෙහි අරමුණ විය. 2022.11.30 දින පැවැත් වූ මෙම වැඩසටහනට අම්පාර දිස්ත්‍රික්කයේ තරුණ තරුණියන් 34 දෙනෙකු සහභාගි විය.

මෙම වැඩසටහන සඳහා සහභාගි වූ තරුණ තරුණියන් තුළ ජීවිතය පිළිබඳ නව දැක්මක් ඇති කිරීමට මෙම වැඩසටහන හේතු වී ඇත.

**ඡායාරූප -** අම්පාර දිස්ත්‍රිකකයේ ද තරුණ ළමුන් හා පාසල් සිසුන් පුහුණු වන අවස්ථාවක්




# ප්‍රාදේශීය පුහුණු මධ්‍යස්ථාන පිළිබඳ විස්තර

## සමාජවැඩ පුහුණු, පර්යේෂණ හා ක්ෂේත්‍ර ඉගෙනුම් ප්‍රාදේශීය මධ්‍යස්ථානය, රන්න



### හැඳින්වීම

දකුණු පළාතේ හම්බන්තොට දිස්ත්‍රික්කය කේන්ද්‍ර කර ගනිමින් 2014.11.05 වන දින ශ්‍රී ආනන්ද හිමි පෙදෙස, අඩි 100 පාර, රන්න යන ලිපිනයෙහි ජාතික සමාජ සංවර්ධන ආයතනයේ සමාජවැඩ පුහුණු, පර්යේෂණ හා ක්ෂේත්‍ර ඉගෙනුම් ප්‍රාදේශීය මධ්‍යස්ථානය ආරම්භ කරන ලදි. මධ්‍යස්ථානයට ගොඩනැගිලි 02 අයත්වන අතර එහි පංති කාමර දේශනශාලා (සිසුන් 50) 02ක්, නේවාසික පහසුකම් ලබාගැනීම සඳහා කාමර 02ක් (ඇඳන් 04), කාර්යාල කාමරයක් සහ කුඩා පුස්තකාලයකින් සමන්විත වේ.

### 2022 වර්ෂයේ රන්න ප්‍රාදේශීය පුහුණු මධ්‍යස්ථානයේ වියදම් වාර්තාව

| අනු අංකය | විස්තරය | මුදල (රු.) |
|---|---|---|
| 01 | විදුලි බිල්පත් | 9,389.90 |
| 02 | ජල බිල්පත් | 8,224.30 |
| 03 | දුරකථන බිල්පත් | 14,271.64 |
| 04 | පරිපාලන වියදම් | 24,000.00 |
| | **එකතුව** | **55,885.84** |

## රන්න මධ්‍යස්ථානයේ 2022 වර්ෂයේ පවත්වන ලද වැඩසටහන් විස්තර

### කෙටිකාලීන පුහුණු පාඨමාලා

| අනු අංකය | දිනය | වැඩසටහන | සහභාගි වූ සංඛ්‍යාව | වියදම(රු.) |
|---|---|---|---|---|
| 01 | 2022.03.21 | නායකත්වය හා වෘත්තිය මාර්ගෝපදේශනය පිළිබඳ පුහුණු වැඩසටහන(උසස්පෙළ සමත් සිසුන් සඳහා) | 7 | සම්පත් දායකත්වය සැපයිම |
| 02 | 2022.03.30 | මානසික සෞඛ්‍ය යහපැවැත්ම පිළිබඳ පුහුණු වැඩසටහන (කට්ටකඩුව වැඩිහිටි සමිතියේ සාමාජිකයන් සඳහා) | 25 | 7,815.00 |
| 03 | 2022.06.22 | ප්‍රජා නායකයින් සඳහා ධාරිතා සංවර්ධනය පිළිබඳ පුහුණු වැඩසටහන(සමෘද්ධි ප්‍රජාමූල නායකයින්) | 30 | 4,405.00 |
| 04 | 2022.06.23 | ව්‍යාපෘති කළමනාකරණය හා යෝජනාපත්‍ර සැකසීම පිළිබඳ පුහුණු වැඩසටහන (සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ නිළධාරින්) | 28 | 9,680.00 |
| 05 | 2022.09.09 | නායකත්වය හා ආකල්ප සංවර්ධනය පිළිබඳ පුහුණු වැඩසටහන (රන්න ප්‍රදේශයේ වාඩියගොඩ කණිටු විදුහලේ ශිෂ්‍ය නායකයින්) | 25 | 4,405.00 |
| 06 | 2022.09.16 | නායකත්ව කුසලතා සංවර්ධනය පිළිබඳ පුහුණු වැඩසටහන (අගුණුකොළපැලැස්ස ප්‍රදේශයේ තරුණ තරුණියන් ) | 21 | සම්පත් දායකත්වය සැපයිම |
| 07 | 2022.11.10 | තිරසර ජීවිකා වෘත්තිය සංවර්ධනය සංවර්ධනය පිළිබඳ පූහුණු වැඩසටහන(අගුණුකොළපැලැස්ස ප්‍රදේශයේ තරුණ තරුණියන් ) | 28 | 9,800.00 |

### දිගුකාලීන පුහුණු පාඨමාලා

| අනු අංකය. | පාඨමාලාව | පැවැත්වූ දින ගණන | සිසුන් ගණන | ආයතනය වෙත මුදල් ලැබීම (රු) |
|---|---|---|---|---|
| 01 | උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව 2021/2022 - මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ | 38 | 24 | (26,000.00×24) = 624,000.00 |

**2023 වර්ෂයේ සිදුකිරීමට අපේක්ෂිත වැඩසටහන්**

**වෙන් කරන ලද මුළු මුදල රු.50,000.00**

| අනු අංකය | පුහුණු වැඩසටහන | ඉලක්කගත පිරිස | වෙන්කල මුදල (රු) |
|---|---|---|---|
| 01 | ගුරුවරුන්ගේ කුසලතා හා නිපුණතා සංවර්ධනය පිළිබඳ පුහුණු වැඩසටහන | රන්න මධ්‍ය මහා විද්‍යාලයේ ගුරුවරුන් දෙනෙකු සඳහා 25 | 10,000.00 |
| 02 | වැඩිහිටියන්ගේ මානසික සෞඛ්‍ය පිළිබඳ පුහුණු වැඩසටහන | රන්න ප්‍රදේශයේ වැඩිහිටි සමිතියක වැඩිහිටියන් දෙනෙකු සඳහා 25 | 10,000.00 |
| 03 | නායකත්ව කුසලතා පිළිබඳ පුහුණු වැඩසටහන | නෙටොල්පිටිය තරුණසේවා සභාවේ සිසුන් දෙනෙකු සඳහා 25 | 10,000.00 |
| 04 | තිරසර ජීවිකා වෘත්තීය සංවර්ධනය පිළිබඳ පුහුණු වැඩසටහන | අගුණුකොළපැලැස්ස ප්‍රදේශයේ කාන්තා සමිතියක සාමාජිකයන් දෙනෙකු 25 සඳහා | 10,000.00 |
| 05 | උපදේශන කුසලතා සංවර්ධනය පිළිබඳ පුහුණු වැඩසටහන | මාතර හා දික්වැල්ල අධ්‍යාපන කොට්ඨාශයේ ගුරුවරුන් දෙනෙකු 25 සඳහා | 10,000.00 |
| **එකතුව** | | | **50,000.00** |

**පුහුණු අංශය මඟින් ආරම්භ කිරීමට සැලසුම් කර ඇති කෙටි පුහුණු වැඩසටහන්**

- රන්න මධ්‍යමහා විද්‍යාලයේ සිසුන් සඳහා මත්ද්‍රව්‍ය නිවාරණය පිළිබඳ පුහුණු වැඩසටහන

**යටිතල පහසුකම් වලට අදාල ගැටලු**

- මධ්‍යස්ථානය වටා ආරක්ෂිත වැටක් ඉදිකිරීම
- විදුලි පරිපථයේ ඇති දෝෂයක් හේතුවෙන් මධ්‍යස්ථානයේ ඒක් කොටසකට විදුලිය විසන්ධිව ඇති අතර එය අලුත්වැඩියා කිරීම
- දිරාපත්ව ඇති සිවිලිම අලුත්වැඩියා කිරීම හා වැසිකිලි පද්ධතිය අලුත්වැඩියා කිරීම

# සමාජ වැඩ පුහුණු, පර්යේෂණ හා ක්ෂේත්‍ර ඉගෙනුම් ප්‍රාදේශීය මධ්‍යස්ථානය, තලාව



## හැඳින්වීම

ජාතික සමාජ සංවර්ධන ආයතනයේ තලාව ප්‍රාදේශිය පුහුණු කිරීමේ මධ්‍යස්ථානය උතුරු මැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, තලාව ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයේ, මොරගොඩ ග්‍රාමසේවා කොට්ඨාශයේ පිහිටා ඇත. අනුරාධපුර කුරුණෑගල ප්‍රධාන මාර්ගයට මුහුණලා තලාව නගරයේ සිට කි.මී. 2 පමණ අනුරාධපුර නගරයට වන්නට පිහිටා ඇත.

වර්තමානය වනවිට තලාව ප්‍රාදේශිය පුහුණු කිරීමේ මධ්‍යස්ථානය සතුව අක්කර 05 ආසන්න භූමියක් සතු වන අතර දෙමහල් ගොඩනැගිල්ලකින් සමන්විත වේ. ප්‍රධාන ගොඩනැගිල්ලේ පහල මහලේ කාර්යාල කාමර 02 ක් හා කුඩා නේවාසික කාමර 02ක් තට්ටු ඇදන් ඇදන් 35 සහිත වෙන් කරන ලද කාමර 02 කින් හා භෝජනාගාරයකින් සමන්විත වේ. ඉහළ මහලේ කුඩා නේවාසික කාමර 02ක් හා VIP කාමර 01 දේශන ශාලාවකින් යුක්ත වේ.

## ප්‍රාදේශීය මධ්‍යස්ථානයේ දැක්ම

සමාජ වැඩ අධ්‍යාපනය පුහුණුව හා පර්යේෂණ අංශයෙහි දේශීය හා ජාත්‍යන්තර වශයෙන් විශිෂ්ය කේන්ද්‍රස්ථානයේ ශාඛාවක් ලෙස සියලුම දෙනාගේ ජීවන තත්වයන්හි ගුණාත්මක වර්ධනයක් ඇති කිරීම සඳහා සක්‍රිය කොටස්කරුවෙකු වීම.

## නේවාසික මධ්‍යස්ථානයක් ලෙස භාවිතා කිරීම

ජාතික සමාජ සංවර්ධන ආයතනයේ තලාව ප්‍රාදේශීය පුහුණු කිරීමේ මධ්‍යස්ථානය නේවාසික මධ්‍යස්ථානයක් ලෙසද භාවිතා කරනු ලබයි. ප්‍රධාන ගොඩනැගිල්ට අදාලව VIP කාමර 01 (වායු සමනය කළ) සහ කුඩා කාමර (ඇදන් 02) ඇත. මීට අමතරව 37 දෙනෙකුට නේවාසික පහසුකම් සපයා දිමට හැකිය. මීට අමතරව ප්‍රධාන දේශන ශාලාව (අඩි 60x30) ප්‍රමාණයේ ආසන 80ක් පමණ ඇත.

ආයතනය විසින් නියම කරන ලද මිල ගණන් යටතේ රාජ්‍ය මෙන්ම පෞද්ගලික අංශය සඳහා පුහුණු වැඩ සටහන් සඳහා මෙන්ම නේවාසික අවශ්‍යතා සඳහා මධ්‍යස්ථානයේ නේවාසිකාගාර භාවිතා කරණු ලබයි. මේ තුළින් ආයතනයට අමතර ආදායමක් මෙන්ම ජාතික මට්ටමෙන් විශාල සේවයක් සිදු කරණු ලබයි. එමෙන්ම ජාතික සමාජ සංවර්ධන ආයතනයේ ක්ෂේත්‍ර ගත සිසුන්ගේ නේවාසික කටයුතු සඳහා මෙන්ම ක්ෂේත්‍ර අධ්‍යයන චාරිකා සඳහා, පුහුණු වැඩ සටහන් සඳහා නේවාසික කටයුතු ලබාදිය හැකි ආයතනය සතු එකම මධ්‍යස්ථානය වන්නේ තලාව ප්‍රාදේශිය ඉගනුම් මධ්‍යස්ථානයයි. තවද ආයතනය මගින් පවත්වන ඩිප්ලෝමා පාඨමාලා, උසස් ඩිප්ලෝමා පාඨමාලා සඳහා දුර බැහැර සිට පැමිණෙන සිසුන් සඳහා නේවාසික පහසුකම් ලබා දීම තුළින් සිසුන් හට මහත් පිටුවහලක් ලැබෙන අතර සිසුන්ගේ අධ්‍යාපන කටයුතු සඳහාද මහත් සම්පතක් බවට ප්‍රාදේශිය මධ්‍යස්ථානය පත්ව ඇත.

**ආයතනික කාර්යය මණ්ඩලය**

| අංකය | තනතුර | නිළධාරීන් ප්‍රමාණය |
|---|---|---|
| 01 | වැඩසටහන් සහකාර (ස්ථානභාර) | 01 |
| 02 | කළමනාකරණ සහකාර | 02 |
| 03 | කාර්යාල කාර්ය සහායක | 01 |
| 04 | රාත්‍රී මුරකරු (පෞද්ගලික ආරක්ෂක අංශයෙන් යොදවා ඇත) | 01 |

**ඉටුකරන ලද සේවාවන්**

**දිගුකාලීන පුහුණු පාඨමාලා (දැනට පවත්වාගෙන යනු ලබන)**

| අංකය | පාඨමාලාව | ලියාපදිංචි ශිෂ්‍ය සංඛ්‍යාව | පාඨමාලා කාලසීමාව |
|---|---|---|---|
| 01 | උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව සිංහල මාධ්‍යය | 42 | 2020/2021 |
| 02 | උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව කුරුණෑගල - සිංහල මාධ්‍ය | 50 | 2020/2021 |

**කෙටි කාලීන පුහුණු වැඩසටහන් - මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ**

| පැවැත්වූ පුහුණු වැඩසටහන | සහභාගී වූ සංඛ්‍යාව |
|---|---|
| පෙර පාසල් ගුරුවරුන් සවිබලගැන්වීමේ වැඩසටහන (05 දින) | 109 |
| තලාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ උසස් පෙළ අවසන් සිසුන් සඳහා මාර්ගෝපදේශන වැඩසටහන | 40 |
| උපදේශන ගුරුවරුන් සඳහා පැවැත්වූ අධ්‍යාපන උපදේශන වැඩසටහන | 35 |
| තලාව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිලධාරීන් සඳහා ක්ලමථ කළමනාකරණ වැඩසටහන | 135 |
| මහවැලි කාර්යාලයේ නිලධාරීන් සඳහා පැවැත්වූ ධාරිතා සංවර්ධන වැඩසටහන | 50 |
| ගල්ගමුව ගාමිණී මහා විද්‍යාලයේ ගුරුවරුන් සහ පාසලේ සිසුන් සඳහා පැවැත්වූ වැඩසටහන | ගුරුවරුන් 45-<br>සිසුන් 65- |

## 2023 වර්ෂයේ දී පැවැත්වීමට නියමිත වැඩසටහන්

- උපදේශනය ඩිප්ලෝමා පාඨමාලාව

### ආදායම් වියදම් විස්තරය

2022 වර්ෂයේ ආදායම් විස්තරය මාසිකව

| මාසය | මුදලින් | | නොමිලේ | |
|---|---|---|---|---|
| | දේශනශාලා | නේවාසිකවීම් | දේශනශාලා | නේවාසිකවීම් |
| ජනවාරි | - | 350/- | - | - |
| පෙබරවාරි | - | - | - | - |
| මාර්තු | - | 6,650/- | - | - |
| අප්‍රේල් | - | - | - | - |
| මැයි | - | - | - | - |
| ජුනි | - | - | - | - |
| ජුලි | - | - | - | - |
| අගෝස්තු | - | 1,000/- | 10,000/- | 10,000/- |
| සැප්තැම්බර් | - | - | - | - |
| ඔක්තෝබර් | - | 26,950/- | 15,000/- | 29,850/- |
| නොවැම්බර් | - | 22,300/- | 10,000/- | - |
| දෙසැම්බර් | - | 9,200/- | 5,000/- | - |
| **එකතුව** | **-** | **66,450/-** | **40,000/-** | **39,850/-** |

## 2022 තලාව ප්‍රාදේශිය මධ්‍යස්ථානයේ වියදම් විස්තරය

| මාසය | ජලය රු. | විදුලිය රු. | දුරකථන රු. | අත්තිකාරම් රු. | මුළු වියදම රු. |
|---|---|---|---|---|---|
| ජනවාරි | 2,575.00 | 6,620.00 | 1,013.56 | 6,043.00 | |
| පෙබරවාරි | 1,467.00 | 4,083.00 | 380.06 | | |
| මාර්තු | 2,703.00 | 2,032.43 | 1,783.30 | | |
| අප්‍රේල් | 1,810.00 | 1,875.00 | 1,154.34 | - | |
| මැයි | 1,877.00 | 3,094.00 | 1,471.08 | 5,405.00 | |
| ජුනි | 1,217.00 | 1,864.00 | 2,039.72 | 1,725.00 | |
| ජුලි | 1,162.00 | 1,852.00 | 2,272.00 | - | |
| අගෝස්තු | 2,525.00 | 3,060.00 | 1,125.00 | 5,450.00 | |
| සැප්තැම්බර් | 3,388.00 | 3,560.00 | 2,422.00 | 3,000.00 | |
| ඔක්තෝබර් | 7,583.00 | 10,684.00 | 2,016.00 | 6,100.00 | |
| නොවැම්බර් | 3,880.00 | 7,772.00 | 2,016.00 | - | |
| දෙසැම්බර් | 3,744.40 | 4,160.00 | 2,387.00 | 6,725.00 | |
| **එකතුව** | **33,881.40** | **50,656.00** | **20,078.00** | **34,448.00** | **139,063.40** |

## අම්පාර ප්‍රාදේශීය පුහුණු කිරීමේ මධ්‍යස්ථානය






### හැඳින්වීම

